# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2017 ජූලි
23 වෙළුම 04 කලාපය

ආධාරය රු 30/-

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


"ධනපති ක්‍රමය යටතේ නිර්ධන පංතියට ලැබිය හැකි හොඳම රාජ්‍ය ආකෘතිය ලෙසට අපි ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවකට පක්ෂ වන්නෙමු. එහෙත් ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී ධනපති සමූහාණ්ඩුව යටතේ පවා ජනතාවට අත්වන්නේ, වේතන වහල්භාවයය යන්න අමතක කිරීමට අපට අයිතියක් නැත."

**ලෙනින්,**
**තෝරාගත් කෘති,**
**6වැනි වෙළුම,**
**26 පිටුව**

## ගුරු තරුව නුඹම විය



අඳුර ඇවිදින
වියළි බිම් පෙත
තෙතමනය වපුරා
බොල් පොළොව මත
අලුත් බිජුවට
පොහොනි කළ මිනිසා
හීන විඳවන
හීම පුරයක
දෙකන් ඇස් අරවා
අලුත් පැහැයක
ලොවක් ඇති බව
කියාදුන් මිනිසා
සීත ගිනි කඳු
පුපුරවා හළ
සම බිමක් පිණිසා
නුඹය පෙර'ඹර
ගුරු තරුව වී
තෙකල් දුටු මිනිසා

(ජූලි 14වැනි දිනට යෙදෙන ජ.වි.පෙ. නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයාගේ ජන්ම සංවත්සරය නිමිත්තෙනි)

# සටන් රැල්ල හමුවේ ආණ්ඩුව අවදානමක!

මේ වනවිට විවිධ සාධාරණ හේතු මත ආණ්ඩුවට එරෙහිව ජනතාවගේ සටන් රැසක් රට පුරා නිර්මාණය වෙමින් තිබේ. මෙම සමහර සටන් පැවති රාජපක්ෂ පාලනයේ වැරදි ක්‍රියාමාර්ග එලෙසින්ම පෙරට ගෙනයාමට වත්මන් ආණ්ඩුවද උත්සාහ කිරීම නිසා ඇතිවූ ඒවාය. ඇතැම් සටන් වත්මන් ආණ්ඩුවේම වැරදි ක්‍රියාමාර්ග හා අසාර්ථකභාවය විසින් නිර්මාණය කරන ලද ඒවාය.

මෙම සටන් අතර සයිටම් විරෝධී සටන, උමා ඔය හැරවීමට එරෙහි සටන, ඌව වෙල්ලස්සේ ඉඩම් විකිණීමට එරෙහි සටන, වගා වන්දි ඉල්ලා කරන ගොවි සටන, කිරි ගොවි සටන, රාජ්‍ය දේපළ විකිණීමට එරෙහි සටන් ආදිය ප්‍රමුඛ වේ. සටන් ඇවිළී ඇති කිසිදු ගැටලුවකට විසඳුම් ලබාදීමට ආණ්ඩුව අසමත්ව සිටින අතර එහි ප්‍රතිඵලය වී ඇත්තේ, ආණ්ඩුවට එරෙහිව සටන් රැල්ලක් නිර්මාණය වීමත් ඒවාට ඉහළ ජනතා සහභාගිත්වයක් තිබීමත්ය. කසළ බැහැර කිරීමේදී මෙන්ම ඩෙංගු වසංගතයේදී ආණ්ඩුව පෙන්වා ඇති බරපතළ අසමත්කමද ආණ්ඩුවට එරෙහිව ජනතා විරෝධය වැඩිවීමට හේතුවී ඇත.


ආණ්ඩුවට එරෙහිව මතුව ඇති මෙම සටන් රැල්ල හා විරෝධය විසින් ආණ්ඩුවේ පැවැත්ම අනතුරේ හෙළා ඇති බව දේශපාලන විචාරකයින්ගේ අදහසය. වත්මන් හවුල් ආණ්ඩුවේ පාර්ශව දෙක වන එ.ජා.ප.ය සහ ශ්‍රීල.නි.ප.ය අතර ආණ්ඩුව පවත්වාගෙන යාමට අත්සන් කරන ලද ගිවිසුමේ දෙවසරක කාලය මෙම අගෝස්තු මාසයෙන් අවසන් වේ. ගිවිසුම යළි දිගුකර ගැනීමට ජනාධිපතිවරයාගේ පාර්ශවයට

**02 වැනි පිටුවට**




වංචාවට, දූෂණයට, ජාතිවාදයට එරෙහිව රොද බැඳ...


**05 ලංකාවේ ආර්ථිකයට...**



රටට අවශ්‍ය කරන වත්කම් උපායා ගැනීමට අසමත්ය. එවිට ලියුකේමියා රෝගියාට ලේ දෙන්නාක් මෙන්...

**11 තර්කනයේ චින්තනය...**




ඔවුන් දෙන ඕනෑම පොරොන්දුවක්, ඔවුන් කියන ඕනෑම බොරුවක් විශ්වාස කරන ජනතාවක් සිටීම...

**12 තෙල් ටැංකි විකිණීමේ...**



එම ලියවිල්ලේ 1.2 ඡේදයට අනුව එදින සිට මාස 06 ක් ඇතුලත ලංකා රජය හා LIOCය විධිමත් බදු ගිවිසුමකට...

සංවාදය.......................... 03
තරුණ.......................... 04
ආවර්ජනා.......................... 06
ජාත්‍යන්තර.......................... 08
ආර්ථික.......................... 09
කාන්තා.......................... 10
වේදිකාව.......................... 13
විශේෂාංග.......................... 14


**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# සටන් බිම

## තැපැල් සේවකයෝ වර්ජනයේ




එක් පසකින් තැපැල් සේවකයන්ගේ අයිතිවාසිකම් කප්පාදු කරමින් සහ අනෙක් පසින් තැපැල් දෙපාර්තමේන්තුව සතු ඓතිහාසික මෙන්ම ඉහල වටිනාකමින් යුත් දේපළ විකුණා දැමීමට සැලසුම් සකස්කරමින් සිටින ආණ්ඩුවට එරෙහිව තැපැල් සේවකයෝ ජුනි 14 වන දින පැය 48ක වැඩ වර්ජනයක් දියත් කළහ. අනතුරුව ජුනි 27වැනි දින සිට නැවත ලංකා තැපැල් සේවා සංගමය සමග අනෙකුත් සියලු තැපැල් වෘත්තීය සමිති වැඩ වර්ජනයට සහභාගි වී සිටිති.

ඉන්දියානු ගවනර්ස් හොටේල් කෝපරේෂන් නම් පෞද්ගලික සමාගමකට කොළඹ කොටුව ප්‍රධාන තැපැල් කාර්යාල ගොඩනැගිල්ලත් නුවරඑළිය ප්‍රධාන තැපැල් කාර්යාල ගොඩනැගිල්ලත් ගාලු කොටුව තුළ පිහිටි ඓතිහාසික තැපැල් කාර්යාල ගොඩනැගිල්ලත්, මහනුවර තැපැල් අභ්‍යාස විද්‍යාලය හා ප්‍රාදේශීය තැපැල් තෝරන මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ලත් තැපැල් දෙපාර්තමේන්තුවේ පරිපාලනයෙන් ඉවත් කර විකුණා දැමීමට ආණ්ඩුව සැලසුම් කර තිබේ.

මේ සියල්ල ජනතාව සතු දේපළ බැවින්, ඒවා විකුණා දැමීමේ කිසිදු අයිතියක් ඇමතිවරයාට හෝ ආණ්ඩුවට නොමැති බව අවධාරණය කරන ලංකා තැපැල් සේවා සංගමය ඉදිරියේදී ආණ්ඩුවේ ජනතා දේපළ විකිණීමේ ක්‍රියාවලිය තීරණාත්මකව පරාජය කිරීමට කටයුතු කරන බව අවධාරණය කර සිටී.

## සමස්ත ලංකා බැංකු සේවක සංගමය 12වැනි සමුළුවට

සමස්ත ලංකා බැංකු සේවක සංගමයේ 12වැනි වාර්ෂික සම්මේලනය පසුගිය ජුනි 24 වන දින පෙරවරුවේ කොළඹ කොටුව ලංකා බැංකු නගර කාර්යාල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වූ අතර සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයාගේ මූලිකත්වයෙන් සමුළුවේ කටයුතු ආරම්භ විය.

රාජ්‍ය බැංකු සේවකයින්ගේ කප්පාදු කළ විශ්‍රාම වැටුප දිනා ගැනීමත් රාජ්‍ය බැංකු කොටස් වෙළඳපොලේ විකිණීම මගින් දුර්වල කිරීමට එරෙහිවත් රාජ්‍ය බැංකුවලට අවිධිමත් ආකාරයෙන් දේශපාලන මැදිහත්වීම මත සේවකයින් බඳවා ගැනීමට එරෙහිවත් රාජ්‍ය බැංකුවල අරමුදල් දේශපාලන මැදිහත්වීම තුළින් අවභාවිතා කිරීමට එරෙහිවත් රාජ්‍ය සම්පත් විකිණීම හා බිලිදීමට එරෙහිවත් වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදුවට එරෙහිව කරන අරගලවලට සහයෝගය දීමටත් ප්‍රගතිශීලී සමාජ ව්‍යාපාර සමග එක්ව කටයුතු කරමින් වැඩකරන ජනතා බලයක් ගොඩනැගීම සඳහාත් බැංකු සේවකයින් බලමුළු ගැන්වීම සමුළුවේ ප්‍රධාන අරමුණු අතර විය.

## ගුරු - විදුහල්පති පෙරමුණ උද්ඝෝෂණයේ



විදුහල්පතිවරුන්හට පවතින ගැටලුකාරී තත්වය සම්බන්ධයෙන් බලධාරීන්ට මැදිහත් වන ලෙසත් විදුහල්පතිවරුන්ගේ වෘත්තීය ගැටලු සඳහා විසඳුම් ලබාදෙන ලෙසත් බලකරමින් ගුරු - විදුහල්පති පෙරමුණ ජුනි 28 දින පෙරවරුවේ අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිට උද්ඝෝෂණයක් පවත්වන ලදී.

උසස් වීම් ලබා ගැනීමේදී, ස්ථාන මාරුකිරීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් හා වැටුප් ලබා දීමේදී රටේ 25,000ට අධික විදුහල්පතිවරු පීඩාවට හා අසාධාරණයට පත්ව ඇති බව ගුරු - විදුහල්පති පෙරමුණේ කැඳවුම්කරු මහින්ද ජයසිංහ සහෝදරයා එහිදී කියා සිටියේය. එමෙන්ම පුහුණු වීම්, විදෙස් සංචාර ආදිය සඳහා තෝරා ගැනීමේදී විධිමත් ක්‍රමවේදයක් නොමැති බවද බොහෝ තෝරාගැනීම්වලට සුදුසුකම දේශපාලන හිතවත්කම බවද ඉදිරියේදී තත්වය විසඳීමට මැදිහත් නොවන්නේ නම් දැඩි වෘත්තීය ක්‍රියාමාර්ගවලට එළඹීමට සිදුවන බවද මහින්ද ජයසිංහ සහෝදරයා වැඩිදුරටත් පැවසීය.


## විදුලි සේවකයෝ විරෝධතාවයේ




ඉහල පාලනාධිකාරිය විසින් සිය වැටුප් ඉහළ දමා ගැනීමට කටයුතු කිරීමට විරෝධය පාමින් සහ තම වැටුප් වර්ධක ලබා දෙන ලෙසට ඉල්ලීම් කරමින් ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලයට අයත් සියලුම වෘත්තීය සමිති එකාබද්ධව ජුනි 28 ලංකා විදුලිය බල මණ්ඩලය ඉදිරිපිට විරෝධතාවයක් පවත්වන ලදී. අනතුරුව සියලුම සේවක සේවිකාවන් කොළඹ විහාර මහා දේවි එළිමහන් රඟහලේදී පැවැත්වූ රැස්වීමට පා ගමනින් පැමිණියහ.

# එතෙරින්...

## විජිත හේරත් - චීන කොමියුනිස්ට් පක්ෂ නායක හමුවක්



ශ්‍රී ලංකා පාර්ලිමේන්තු කණ්ඩායමක සාමාජිකයෙකු ලෙස චීනයේ සංචාරයක් කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා චීන කොමියුනිස්ට් පක්ෂයේ ජාතික කමිටු නියෝජිත, පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී, ෂාව් ක්විමින් (Shu Qiming) සමඟ හමුවක් පැවැත්විය. එසේම චීන භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලියෝ යොන්ග්ලින් (Liao Yonglin), බීජිං නගර කමිටුවේ සභාපති මහාචාර්ය තාන්ග් වෙයිජියාන් (Tang Weijian), විදේශ කටයුතු බියුරෝවේ ප්‍රධානී බස ඔස්දහ්බ ද, හමුවී සාකච්ඡා පවත්වා ඇත. මෙම හමුවීම දෙරට අතර මෙන්ම ජ.වි.පෙ. සහ චීන කොමියුනිස්ට් පක්ෂය අතර ද්විපාර්ශික සබදතා ගොඩනැගීමටද ඉවහල් වී ඇත.

## අනුර දිසානායක ජර්මනියේ නගර රැසක



ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා ජර්මනියේ නගර රැසක ජනතා රැස්වීම්, සාකච්ඡා සභාවලට සහභාගි වී සිටියි. බර්ලින් නගරයේ, ඩසල් ඩොෆ්, මියුනිච් වැනි ප්‍රධාන නගරවල ශ්‍රී ලාංකික ප්‍රජාවගේ රැස්වීම්වලට විශාල ජනතා ප්‍රතිචාර පැවති අතර, මෙම රැස්වීම් සංවිධානය කර තිබුණේ, එතෙර අපි සංවිධානයේ ජර්මනියේ ශාඛාව මගිනි. මීට අමතරව අනුර දිසානායක සහෝදරයා ජර්මන් පාර්ලිමේන්තුවේ රැස්වීම් සඳහාද සහභාගි වීමට නියමිතය.

## 'එතෙර අපි' රාමසාන් සමරයි




එතෙර අපි සංවිධානයේ සෞදි අරාබි ශාඛාව විසින් ලංකාවේ සියලු දිස්ත්‍රික්කවල මුස්ලිම් ජනතාවගේ රාමසාන් උත්සවය වෙනුවෙන් බෙදා දීමට රටඉඳි පරිත්‍යාග කළ අතර, ඩුබායි එතෙර අපි ශාඛාව විසින් රාමසාන් උත්සවය සැමරීමේ උත්සවයක් එරටදී සිදුකරන ලදී. ඡායාරූපයේ දැක්වෙන්නේ ඩුබායිහි රාමසාන් සැමරුමේ අවස්ථාවකි.

## ස්වීඩනයට, සිසිලියට, ස්විස්ටර්ලන්තයට 'එතෙර අපි' ශාඛා



විදේශගත ශ්‍රී ලංකිකයින්ගේ අයිතිවාසිකම් සුරැකීමේ සංවිධානය වන එතෙර අපි සංවිධානයේ ශාඛාවන් තවත් ව්‍යාප්ත කරමින් ස්වීඩනයේ, ස්විස්ටර්ලන්තයේ සහ ඉතාලියේ සිසිලි දූපත්වල මෙසීනා නගරයේද, නව ශාඛා ආරම්භ කිරීම පසුගියදා සිදුවිය. ස්වීඩනයේ හා මෙසීනා නගරයේ ආරම්භක අවස්ථාව සඳහා ස්කයිප් තාක්ෂණය මගින් එතෙර අපි සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා සම්බන්ධ වූ අතර, ස්විස්ටර්ලන්ත ශාඛාව ගොඩනැගීමේ හමුවට ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේ (ILO) 106වැනි සැසිවාරයට ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජික වසන්ත සමරසිංහ සහෝදරයා සහභාගී විය.

## ඕස්ට්‍රේලියාවේ සහායෙන් ලංකාවේ වෛද්‍ය සායන



පසුගියදා හටගත් ගංවතුර උවදුරෙන් පීඩාවට පත් ජනතාව සඳහා වෛද්‍ය සායන පැවැත්වීමට ඕස්ට්‍රේලියාවේ ඇඩිලෙඩ්හි ශ්‍රී ලංකිකයින් පිරිසක් ඉදිරිපත් වී තිබිණි. පසුගියදා ගාල්ල බද්දේගම - කීඩිඇල භික්ෂු විවේකාරම ශාලාවේදී මෙම වෛද්‍ය සායනය පවත්වනු ලැබිණි.

## සටන් රැල්ල...

මුල් පිටුවෙන්

මෙන්ම එ.ජා.ප.යටද අවශ්‍යය. එහෙත් රටේ මතුව ඇති ආණ්ඩු විරෝධයේ ප්‍රබලකම නිසා ශ්‍රීල.නි.ප. කණ්ඩායම බලවත් අසීරුවකට මුහුණදී ඇති බවක් පෙනෙන්නට තිබේ.

පසුගිය දිනවල සිදුකළ කැබිනට් සංශෝධනයේ ප්‍රධාන අරමුණ වූයේද ජනාධිපතිවරයාට ආණ්ඩුව තුළ බලයක් ඇති බවත් ආණ්ඩුව තුළ වෙනස්කම් කිරීමට ඔවුන්ට හැකි බවත් පෙන්වා ශ්‍රීල.නි.ප.ය ආණ්ඩුව තුළ දිගටම සිටීම සාධාරණය කර ගැනීමය. එහෙත් වර්තමානයේ මතුව ඇති තත්වය විසින් ප්‍රශ්නය යළි උග්‍රකර තිබේ. ආණ්ඩු කරන දෙපිරිසම බලය පිළිබඳ ප්‍රශ්නයේදී බලයට කෑදර බැවින් තවදුරටත් ආණ්ඩුව තුළ සිටීමට උත්සාහ කරනු ඇති බව පවසන දේශපාලන විචාරකයන් පෙන්වා දෙන්නේ කෙසේ වුවද එය පහසු නැති බවත් ඉන් ආණ්ඩුවේ පාර්ශව දෙකම ජනතා විරෝධයට ලක්වීම නිසා ආණ්ඩුව අනතුරුදායක තත්වයක පවතින බවත්ය. ඉදිරි පළාත් සභා හා පළාත් පාලන මැතිවරණවලට පවා මෙම තත්වය බලපානු ඇති බව ඔවුන්ගේ මතය වී තිබේ. මේ තත්වය තුළ දේශපාලනයේ විකල්ප බලවේගයකට රට තුළ විශේෂ ඉඩක් නිර්මාණය වී ඇති බවද දේශපාලන විශ්ලේෂකයෝ පෙන්වා දෙති.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# හවුල් ආණ්ඩුවේ 'වෝටර්ලූ සටන' සයිටම්ද?

ප්‍රංශ මහා අධිරාජ්‍යයෙක් ලෙසත්, යුද දක්ෂ සෙනෙවියෙක් ලෙසත් ප්‍රසිද්ධියට පත් නැපෝලියන් බොනපාට් 1818 ජූනි 18දා බ්‍රිතාන්‍ය හමුදා සමග සටනින් පරාජයට පත් විය. නැපෝලියන්ගේ එම ඓතිහාසික පරාජය සිදුවූ ස්ථානය වූයේ වෝටර්ලූ නම් ප්‍රදේශයයි. (වර්තමාන බෙල්ජියම) එම නිසා වෝටර්ලූ යනු කෙනෙකුගේ පරාජය දක්වන සංකේතයක් ලෙස බොහෝ දෙනා භාවිතා කරති. දැන් ලංකාවේ හවුල් ආණ්ඩුවේ පරාජය සනිටුහන් කරන එහි 'වෝටර්ලූ' සටන බවට සයිටම් විරෝධී සටන පත්වෙමින් තිබෙන බව පෙනේ.

නිදහස් අධ්‍යාපනයට හානිකරන, නිදහස් සෞඛ්‍යය සේවයට හානිකරන, අධ්‍යාපනයේ හා සෞඛ්‍ය සේවයේ ගුණාත්මක බවට හානිකරන මාලඹේ සයිටම් ආයතනය අහෝසි කරන ලෙස ඉල්ලා සිදුකරන උද්ඝෝෂණ දිනෙන් දින වැඩි වෙමින් තිබේ. මේ සටන සඳහා මේ වනවිටත් විශ්වවිද්‍යාල සිසුන්, වෛද්‍ය පීඨ සිසුන් හා ඔවුන්ගේ දෙමාපියන්, වෛද්‍යවරුන්, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු දේශපාලන පක්ෂ රැසක් හා වෘත්තීය සමිති රැසක් සම්බන්ධ වී සිටී. සයිටම් අහෝසි කරීමට මෙතරම් පැහැදිලි සාධක හා කරුණු තිබියදීත්, විශාල ජනතාවක් හා බලවේග රැසක් සයිටම් අහෝසි කරන ලෙස හඬ නගද්දීත් ආණ්ඩුවත් සෞඛ්‍ය හා අධ්‍යාපන ඇමතිවරුත් කටයුතු කරමින් සිටින්නේ මුග්ධ හා හිතුවක්කාරී ස්වරූපයෙනි. ජනතාවගේ සාධාරණ ඉල්ලීමට ඇහුම්කන් නොදෙන ඔවුහු මාලඹේ පෞද්ගලික විද්‍යාලය නම් උපාධි කඩය වෙනුවෙන් පෙනී සිටිති. ජනතා හඬට ඇහුම්කන් නොදී එලෙස මුරණ්ඩු ලෙස සයිටම් රැකීමට කටයුතු කරන ආණ්ඩුව, සයිටම් අහෝසි කරන ලෙස ඉල්ලා සාමකාමී ලෙස උද්ඝෝෂණයේ යෙදෙන සිසුන්ට පොලීසිය ලවා කඳුළු ගෑස් හා බැටන් ප්‍රහාර එල්ල කරමින්, ඔළු පලමින්, සිසුන් අත්අඩංගුවට ගනිමින් සටන මර්දනය කිරීමටද පියවර ගනිමින් සිටී.

විශාල ජනතාවකගේ වුවමනාව නියෝජනය කරන, විශාල ජන සහභාගිත්වයක් සහිත සාධාරණ සටන් මර්දනයෙන් නැවැත්විය නොහැක. ආණ්ඩුව එය තේරුම් ගත යුතුය. මෙවැනි සටන් මර්දනයෙන් යටපත් කිරීමට දරන උත්සාහය විසින් සිදුවන්නේ, තව තවත් බලවේග එකතුවෙමින් සටන පුළුල් වීමය. මෙය අවසානයේ ආණ්ඩුව පළවා හරින සටන දක්වා පුළුල් විය හැක.

පසුගිය මහින්ද රාජපක්ෂ පාලනය විසින් නිර්මාණය කරන ලද විනාශකාරී ක්‍රියාමාර්ග මෙම ආණ්ඩුවද කරගහගෙන යමින් තිබේ. සයිටම් ආයතනය හා උමා ඔය ව්‍යාපෘතිය ඉන් ප්‍රධාන දෙකකි. ඊට අමතරව මෙම ආණ්ඩුවේ ජනතා විරෝධීක්‍රියා නිසා, රටේ වටිනා ඉඩම් ඇතුළු සම්පත් විකිණීමට දරන උත්සාහය නිසා තව තවත් සටන් පෙරමුණු රැසක් නිර්මාණය වී තිබේ. පසුගිය 28 වැනිදා බණ්ඩාරවෙල නගරයේ පැවති, උමාඔය විනාශකාරී ව්‍යාපෘතියට එරෙහි දැවැන්ත මහජන විරෝධය ඉන් එකකි. ඊට අමතරව ඌව වෙල්ස්සේ ඉඩම් විකිණීමට එරෙහිවද ගොවි ජන ප්‍රශ්න විසඳා ගැනීම සඳහාද, වැඩකරන ජනතාවගේ වෘත්තීය ප්‍රශ්න විසඳා ගැනීම වෙනුවෙන්ද උද්ඝෝෂණ සටන් ගණනාවක් බිහිවී තිබේ. එහෙත් කිසිදු දැක්මක් නැති, කිසිදු ප්‍රශ්නයකට විසඳුම් නැති වත්මන් පාලනය ඒවාට විසඳුම් දීමට අසමත්ව සිටී.

ඔවුන් උත්සාහ කරන්නේ, අතරමග සාමදානයන්ට ඒමට හා ව්‍යාජ විසඳුම් ඉදිරිපත් කොට කල් ගැනීමටය. නැතිව ප්‍රශ්නය අවංකව විසඳීමට නෙවේ. එහෙත් සටන් එලෙස රැවටීමට ලක්කොට නතර කිරීමට නොහැක. මන්ද මෙම බොහෝ සටන්වලට ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයත් සමහර සටන්වලට එහි ප්‍රබල දායකත්වයක් ලැබෙන නිසාත් ඒවා ජනතාවගේ ඇත්ත සටන් වන නිසාත්ය.

විවිධ හේතු මත රටපුරා සටන් රැල්ලක් නිර්මාණය වීමෙන් පෙන්නුම් කරන්නේ, ධනපති හවුල් ආණ්ඩුවේ අර්බුදය හා අසමත්කම පමණක් නොවේ. ලංකාවේ ධනපති ක්‍රමයේ අර්බුදය හා අසමත්කමද ඉන් නිරූපනය වේ. දැන් ලංකාවේ ධනවාදයට ජනතාවගේ වුවමනා ඉටුකළ නොහැක. ජනතා අරගල අබියස ආණ්ඩුවට මුරණ්ඩු වීමටත් වාරයක් නැතිව හැසිරීමටත් සිදුව තිබෙන්නේ ඒ නිසාය.

ධනවාදය තුළ ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට ආණ්ඩුව සූදානම් නැතිනම්, ආණ්ඩුවට නොහැකිනම්, ධනවාදය තුළ මෙම ගැටලුවලට විසඳුම් නොවේ නම්, සටන කුමක් වුවත් සටන්කරන සියලු බලවේගයන්ට අවසානයේ තේරා ගැනීමට සිදුවන්නේ එක් දෙයකි. ඒ, ධනවාදයත් වත්මන් පාලනයත් පරාජයට පත්කිරීමේ පොදු සටනට පණ පෙවීමටය. එබැවින් විවිධ සටන් සියල්ල එකට එකතු කොට ධනවාදයට එරෙහි සටන් බවට මෙය පත්කළ යුතු බව දැන් පැහැදිලිය. එය කළ හැක්කේ නිවැරදි දැක්මක් ඇති ශක්තිමත් ජනතාවාදී දේශපාලන ව්‍යාපාරයකට පමණි. ජනතා විමුක්ති පෙරමුණට මෙහිදී විශාල කාර්යභාරයක් පැවරේ. වැඩ කරන බලවේග මෙන්ම ජනතාවද මෙම සත්‍යය වටහා ගැනීම අත්‍යාවශ්‍යය.

ඒ අනුව සයිටම් සටන ආණ්ඩුව පෙරළා දැමීම දක්වා යන සටනක් විය හැක. උමා ඔය සටන තුළද ඒ හැකියාවම තිබේ. අනෙක් ඕනෑම සටනක්ද එම තැන ගැනීමට පුළුවන. ඒ අනුව බලනවිට පෙනී යන්නේ වත්මන් ආණ්ඩුව ඉදිරියේ එක් 'වෝටර්ලූ' සටනක් නොව 'වෝටර්ලූ' සටන් කිහිපයක්ම තිබෙන බවය. ඒවා ජය ගැනීම ජනතාවගේ වගකීමය.

# දැන් උදාවී තිබෙන්නේ සියලු සටන් ඒකාබද්ධ විය යුතු යුගයයි



ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික, ඌව පළාත් සභා මන්ත්‍රී
**සමන්ත විද්‍යාරත්න සහෝදරයා**

***නියමුවා:- මේ වන විට රට තුළ බරපතළ පාරිසරික ව්‍යසනකාරී තත්වයන් බහුලව දැකිය හැකියි. මෙයට දිගු කාලයක් පුරා පරිසරය මත අහිතකර මානව බලපෑම් සිදුවීමද මෑතකාලීනව ඒවා තීව්‍රවීමද බලපා ඇති බව කියවෙනවා. ජ.වි.පෙ. මෙම තත්වය තේරුම් ගන්නේ කොහොමද?***

***සමන්ත විද්‍යාරත්න සහෝදරයා:-*** පවතින ධනේශ්වර ක්‍රමය හිතන්නේ මූල්‍යමය ලාභය පමණයි; පරිසරය වැනි සාධක සලකා බලන්නේ නැහැ. ඒ අනුව එක යුගයක් තිබුණා මේ රට අධිරාජ්‍යවාදීන්ට යටත්වෙලා. ඒ යුගයේ කටයුතු කළේත් ඒ ආකාරයටයි. ඊට පසුව දැන් වසර 70කට ආසන්න වෙන නිදහසින් පස්සේ කියන කාලයේ, මේ රටේ කළ පාලකයෝ කටයුතු කළේ ඒ ආකාරයටයි. ඒ නිසා ඒ සියල්ලේ ප්‍රතිඵලයක් ලෙස සංවර්ධනය නමින් වෙස්ගන්වපු ව්‍යාපෘතිවල බරපතළ ආදීනව දැන් රටකට, ජනතාවකට විඳින්න සිදුවෙලා තියෙන්නේ. ඒ අනුව තමා පසුගිය දිනවල ඇතිවුන ගංවතුර පවා, ඒක ස්වභාවික විපතක් කියනවට වඩා පාලකයින් විසින් ඇතිකරන ලද අමනෝඥ සංවර්ධනයෙන් සිදුවෙච්ච ප්‍රතිවිපාකයක්, විනාශයක් කියන එක වඩාත් නිවැරදියි.

ඒ නිසා අපි හිතනවා නිවැරැදි සංවර්ධනයකට රට ගෙන ආ යුතුව තිබුණා. සංවර්ධනය වුණාම, සංවර්ධනය කියන එක දෙවදෑරුම් වෙනවා. එය පාරිසරික මිතුරු සංවර්ධනය සහ පාරිසරික සතුරු සංවර්ධනය. අපේ රටේ සිදුකරපු සංවර්ධනය පරිසරය බාරගෙන නැහැ. එය පරිසරය විසින් ප්‍රතික්ෂේප කරලා. එය ප්‍රතික්ෂේප කිරීම ස්වභාවධර්මයා පෙන්වන ක්‍රම තමා නාය යෑම් සිදුවීම. ඒකෙන් පෙන්වනවා, 'උඹලගේ සංවර්ධනයට අපි එකඟ නැහැ' කියලා. එපමණක් නොවෙයි ගං වතුර, නියඟය මගින් පෙන්වනවා, 'නුඹලගේ සංවර්ධනයට අපි එකඟ නැහැ' කියලා. ස්වභාවධර්මය පාලකයන්ට, රටට, එසේම තේරෙන මිනිසුන්ට පෙන්නුම් කරලා තියෙනවා මෙතුවක් කල් සංවර්ධනයේ නාමයෙන් සිදුවූ දේ රටට දීර්ගකාලීනව යහපතක් නොවූ බව.

***නියමුවා:- ඔබ නියෝජනය කරන ඌව පළාත මෑත කාලීනව පාරිසරික ගැටලු බොහොමයකට ලක්වී ඇති සහ ලක්වීමේ අවදානමක් ඇති ප්‍රදේශයක් බවට පත්වී තිබෙනවා. එසේ වන්නේ ඇයි?***

***සමන්ත විද්‍යාරත්න සහෝදරයා:-*** ඌව පළාත කිව්වම මෙය මධ්‍යම කඳුකරය. මධ්‍යම කඳුකරයට යම්කිසි හානියක් වුණොත් එය බලපාන්නේ මධ්‍යම කඳුකරයට පමණක්ම නොවෙයි. එය විශාල ලෙස රට පුරා මිනිස්සුන්ට බලපානවා. ලෝකයේ රටවල් අතර මැද කඳුකරයක් පිහිටි රටවල් තියෙන්නේ බොහොම සුළු ප්‍රමාණයයි. එක රටක් තමා ලංකාව. අපි නිකමට හිතුවොත් ලංකාවේ මධ්‍යම කඳුකරය නැතිවුණා කියා. එහෙම වුණොත් අපිට ඊසාන දිග මෙන්ම නිරිතදිග මෝසම අපට ලැබෙන්නේ නැහැ. මෝසම් සුළං වැසි ලබානොදී ඔහේ ගහගෙන යාවි. ඒනිසා මේ මධ්‍යම කඳුකරයේ පිහිටීම අපේ රටට වාසනාවක් කියල හිතන්න ඕනෑ. මධ්‍යම කඳුකරය අපේ රටේ සෞභාග්‍යයේ සංකේතය. ඒක අපේ පාලකයෝ ඒ විදියට තේරුම් ගත්තේ නැහැ.

ඉතිහාසයේ දැනුවත්ව හෝ නොදැනුවත්ව අපේ රටේ ආසියාතික සමාජ ක්‍රමය තියෙන යුගයේ, ඒ කියන්නේ රජවරු හිටපු යුගයේ, ඔය වැව් 30,000ක් පමණ හදපු කාලේ, ඔය මධ්‍යම කඳුකරය සැලකුවේ රටේ ඉහත්තෑව කියලා. 'රටේ හිස' කියලා. ඒනිසා ඉහත්තෑවේ ජනවාස හදන එකවත් මහා ඉදිකිරීම් කරන එක, වැව් අමුණු හදන එක කළේ නැහැ. නමුත් අධිරාජ්‍යවාදීන් හා ඊට පසුව අපේ නිදහසින් පස්සේ ආපු පාලකයෝ මධ්‍යම කඳුකරයට කරන්න පුළුවන් අතවර සියල්ලම කළා. දූෂණයන්, විනාශයන් කළා. ස්ත්‍රී දූෂණවලට, ළමා අපරාධවලට පරීක්ෂණ කරන තැන් තියෙනවා. නමුත් මධ්‍යම කඳුකරයට හා රටේ අනෙකුත් පරිසර පද්ධතියට කරපු විනාශය, අතවර සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්න පනත්, නඩුවක් අහන්න තැනක් හරියට නැහැ.

ඌව පළාතේත් මහා පරිමාණ පරිසර විනාශයන් සිදුවෙනවා. මේ අය නම් කියන්නේ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති කියලා. නමුත් මෙවා මහා පරිමාණ පරිසරය විනාශකරන ව්‍යාපෘති. උමා ඔය ගත්තොත් ආණ්ඩුව කියන්නේ බහුකාර්ය ව්‍යාපෘතියක් කියලා. මේකෙන් පානිය ජලය දෙනවා. වාරි ජලය දෙනවා. විදුලිය දෙනවා. නමුත් අපි නම් මේකට කියන්නේ බහු විනාශකාරී ව්‍යාපෘතියක් කියලා. රටට පෝෂණය සපයන ජල උල්පත් තියෙන්නේ මෙතැනයි. සතර දිග්භාගයට ඇද ගෙන යන මහා ගංගා 103ක උපත මෙතනයි. රටේ විදුලියේ, පානීය ජලයේ, වාරි ජලයේ උපත මෙතනයි. මෙතන විනාශකරනවා කියන්නේ ඒ සියල්ලම විනාශකරනවා කියන එකයි. මධ්‍යම කඳුකරයේ කරන මංමාවත් ඉදිකිරීම, වැව් අමුණු ඉදිකිරීම, දැවැන්ත ගොඩනැගිලි ඉදිකිරීම්, ආදී ව්‍යාපෘති රටටම අනාගතයේ කොඩිවිනයක් වන එක වළක්වන්න බැහැ.

> මේ පවතින පාලනය විසින් හදපු මේ ලෙඩ රෝග හමාරකරන්න නම් මේ පවතින ක්‍රමය වෙනස් කළ යුතුයි. අප ඒකාබද්ධ වීමේ දැවැන්ත අවශ්‍යතාවයක් තියෙන මොහොතක් කියලා බුද්ධිමතුන් උගතුන් තේරුම් ගත යුතුව තිබෙනවා. ඒ තේරුම් ගත්ත එකේ තියෙන හොඳම ප්‍රතිඵලය තියෙන්නේ එයින් ක්‍රියාත්මක වීමෙන් පමණයි. සියලු බුද්ධිමතුන් උගතුන් ක්‍රියාත්මක වීමක් රට ඉල්ලා සිටින මොහොතක්. මධ්‍යම කඳුකරය ඇතුළු රටම ඉල්ලන ඒ ඉල්ලීමට කාරුණිකව කන්දෙන්න කියලා අපි කාරුණිකව ඉල්ලනවා.

***නියමුවා:- ඔබ ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ ඉඩම් බහුජාතික සමාගම්වලට පැවරීමට එරෙහි සටනේ නායකයෙක්. මේ සටනේ වත්මන් ස්වභාවය කොහොමද?***

***සමන්ත විද්‍යාරත්න සහෝදරයා:-*** ලබන අවුරුද්දේ 2018 නොවැම්බර් 26වැනි දිනට ඌව වෙල්ලස්ස අරගලයට නායකත්වය දීපු කැප්පිටිපොලගේ හිස ගසාදාල අවුරුදු 200ක් පිරෙනවා. ඌව වෙල්ලස්ස අධිරාජ්‍ය විරෝධී විමුක්ති අරගලය 1817, 1818 කාලේ ආරම්භ වුණාට පස්සේ මෙරට යටත්කරගෙන හිටපු අධිරාජ්‍යවාදීන්ට මේ අරගලයට මූණදෙන්න බැරිවුණා. ඔවුන් යටත් කරගෙන හිටපු අසල්වාසී රාජ්‍යයන්ගේ හමුදා පවා ගෙන්නලා විමුක්ති අරගලය මර්දනය කළා. මේ මර්දනය කරලා රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළා තිබුණා, 'නැවත වසර 200ක් යනතෙක් ඌව වෙල්ලස්සේ මිනිස්සු අපට එරෙහිව නැගිටින්නේ නැහැ' කියලා. ඒක ඇත්ත බව පේනවා. දැනටත් මේ

14 වැනි පිටුවට



# YES WE CAN


## තාරුණ්‍යය වල්මත් නොවීමට නම්

පසුගිය දිනවලදී තරුණ තරුණියන් බොහෝ දෙනෙකු අතර කතාබහට ලක්වූ සිදුවීමක් වූයේ, පේරාදෙණිය සරසවි ශිෂ්‍යාවක පේරාදෙණිය දුම්රියපොළට නුදුරු ස්ථානයකදී දුම්රියට බිලිවීමේ සිදුවීමයි. මේ සිදුවීම සිදුවෙනවාත් සමගම බොහෝ දෙනෙකු මෙකී සිදුවීම තම ෆේස් බුක් ගිණුම් හරහා පළකර තිබූ අතර මෙකී සිදුවීම් සම්බන්ධව අදහස් දැක්වීමද ඒ හරහා දැක ගත හැකිවිය. මෙම සිදුවීම ගත්කළ එවන් ප්‍රතිචාරයන් සමාන්‍යයක් වුවද මෙම සිදුවීම මගින් අප රටේ තාරුණ්‍යය පිළිබඳ එක්තරා කියවීමක්ද සිදුකර ගත හැකිය.

අපේ රට සියදිවි හානිකරගැනීම් අතින් ඉදිරියෙන්ම සිටින රටවල් අතරින් එකක් මෙන්ම තරුණ දිවි නසා ගැනීම් අතින් වඩාත් ඉදිරියෙන්ම සිටින රටකි. අප රටේ ජීවත් වන තරුණ තරුණියන් යනු තම ජීවිත කාලය අප ජීවත්වන පසුගාමී ධනපති ක්‍රමය තුළ ගෙවාදමා ඇති පිරිසක් වන අතර එනිසාම ඔවුන් තුළ ඇත්තේද මෙකී ධනපති ක්‍රමය විසින් ගොඩනන්වන ලද පෞරෂයන්ය. ඔවුන් තුළ සමාජයීය උගත් බව බොහෝවිට දුබලය. එනිසාම අප ජීවත්වන සමාජයේ හමුවන තරුණ තරුණියන් ධනේශ්වර විෂය දැනුමෙන් විවිධ මට්ටමේ පාඨමාලා, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි සම්පූර්ණ කර සිටීමට පුළුවන. නමුදු ඔවුන් තමන්ට මුහුණ දීමට වන තීරණාත්මක මොහොතකදී අතිශය අපරිණත හා අඥාන තීරණවලට එළැඹීම දැක ගත හැක. ඉහත සිදුවීමද තවත් එවන් සිදුවීමකි.

අනෙකා සමග සහයෝගයෙන්, සුහදතාවයෙන් ජීවත්වනවාට වෙනුවට කෙසේ හෝ සුපර් ස්ටාර් කෙනෙකු වන්නැයි මාධ්‍ය ඇතුළු සියල්ලෝ බලකරති. අනෙකාට කුමක් වුවද තමා ගැන පමණක් සිතා ඉහළට යා යුතු යයි බොහෝ වැඩිහිටියන් විසින් උපදෙස් සපයනු ලැබේ. රටේ නායකයන්ගේ සිට පහළ දක්වාම හොරකම්ය. දූෂණය. අපරාධයන්ය. ජාවාරම්ය. බල්ලන් මරා හෝ සල්ලි සෙවීම එකම අරමුණය. මෙවැනි පරිසරයක පළල් සමාජ අවබෝධයක් සහිත මිනිසකු නිර්මාණය කළ හැකිද? කිසිසේත් නොහැකිය. ඒ නිසා බොහෝ තරුණ තරුණියන් ඔවුන් හැදී වැඩුණු පරිසරය තමන්ට ජය පරාජය විඳදරා ගනිමින් ජීවත් වීමට හුරු නොකරයි. අන් කෙනකුන් මෙවැනි සිදුවීමකදී කෙසේ හැසිරෙන්නේද? අහිමිවීම්, නොලැබීම් තම ජීවිතයේ පරාජයන් නොව අත්දැකීම් ඉතිරිකර යන තවත් සිදුවීම් පමණක් යන්න නොදන්නාකම නිසාම ඔවුහු තමන් මුහුණදී සිටින ගැටලුවට විසඳුම ජීවිතයෙන් පාලායාම ලෙස දකිති.

වාර්තා වී ඇති අන්දමට මෙකී සිදුවීමට මුහුණපෑ තරුණිය නීතිවේදී උපාධිධාරිනියක් වන අතර දිවිනසාගැනීමට හේතුව ප්‍රේම සම්බන්ධයක් බිඳවැටීම බව කියැවේ. හේතුව කුමක් වුවත් තරුණ ජීවිත මෙලෙස අකාලයේ අහිමිකරගැනීම අප කිසිවෙකුට අනුමත කළ නොහැක. එමෙන්ම වර්තමාන යේ අප ජීවත්වන ධනවාදය තාරුණ්‍යයට උරුමකර දී ඇත්තේ අවිස්වාසය, සැකය, අහිමිවීම් හා පරාජයන්ය. ඒ නිසාවෙන්ම මෙකී ක්‍රමය අප සමාජයේ තවදුරටත් පැවතීම යනු, ඉහතාකාරයේ සිදුවීම් තවත් වැඩිපුර සිදුවනවා යන්නයි. මෙවන් ඛේදවාචක අසන්නට නොලැබේවා යයි කෙනෙකු පතන්නේ නම්, අප ඉදිරියේ ඇති මෙකී පසුගාමී ධනේශ්වර ක්‍රමය වෙනුවට නව සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීම හැර අන් මඟක් ඒ සඳහා ඇත්තේ නැත.



# හිත් පුරා මල් පිපෙන වසන්තය ඇවිදින්...

ජූලි මාසය..... ඒ කියන්නේ එක කාලයකදී අපේ රටේ අඳුරු ඉතිහාස මතකයක්. පේදුරු තුඩුවේ ඉඳන් දෙවුන්දර තුඩුව දක්වා හැම අම්මෙකුගේම හදවතේ ගින්දර පත්තු වුණු ඉතිහාසයක්. ඔව්! මීට දශක 03කට ඉහතදී අපි අත්වින්දා, සිංහල මිනිස්සු පිච්ච මල්වලටත් වෛර බැඳපු, දෙමළ මිනිස්සු "අ" යනු "ආ" යනුවලටත් සාප කරපු කාලයක්; ජාතිවාදී ගිනිදැල් මැද අවිශ්වාසය, වෛරය, සැකය කියන ගිනිපුපුරු මිනිස්සුන්ගේ හදවත් දවාහළු කළ කාලයක්.

ඉතිහාසයේ විතරක් නොවෙයි අදටත් අපේ සමාජය තුළ මේ ගිනිපුළිඟු වැළලිලා තියෙනවා. අදත් එදා වගේම ඒ ගිනිදැල්වල තාපයෙන් ආශ්වාදය ලබන කොටසක් මේ මහපොළොවේ ජීවත් වෙනවා. ඒත් ඔවුන්ගේ ඒ නපුරු සෙවණැලිවලට එරෙහිව සිංහල, දෙමළ, මුස්ලිම් කාගෙත් හිත් එළිය කරන්න 2008 අවුරුද්දේ පටන් අලුත් ඉරක් පෑයුවා; අලුත් බලාපොරොත්තු දළුලෑවා. සිංහල, දෙමළ, මුස්ලිම් හිත්වල මල් පිපෙන්න පටන් ගත්තා.

ඔව්! මේ "ජූලිය" කියලා කියන්නේ සහෝදරත්වයේ සුවඳ හමන නෙක පැහැ මල් පිපෙන වසන්තයයි; ඒ සුවඳ රැගෙන සමාජවාදී තරුණ සංගමය සිංහල, දෙමළ, මුස්ලිම් ගම්මාන සිසාරා සතුට රැගෙන යන කාලයයි.

පසුගිය අවුරුදුවල වගේම මෙවරත් අපි යනවා නෑගම්. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හදවත්වල මල් පූදන්න.

එන්න...... එක්ව අපි පියාඹමු...... සහෝදරත්වයේ මල්ගොමු කරා.....

විනාඩියකට කලින් ටීවී එකේ ඇහුනා
දරා ගන්න බැරි ණය බරක රට ගිලිලා ඉන්නේ
අපි ඒකෙන් රට ගලවාගන්නවා කියලා

දැන් මේ ඇහෙනවා
ජපානෙන් ණයක් හම්බ උනා එලකිරි කියලා

කණේ මොකක් හරි අවුලක් තියෙනවා
හෙට දොස්තර කෙනෙක් හම්බවෙනවා



තරුණ

## ටර්න් දෙකක් නැති ජීවිත...

ඔයාලගෙ සතුට
මේක අපේ රස්සාව
දොරේ යන්න එපා මල්ලි
නැගගන්න උඩට


ටාගට් පනින්නට ආසිරි
තෙවරක්ම වැද සුබාසිරි
අතට ගත්තේ සුක්කානමයි..
උගුරට දෙකට ගහපු කහට එක
බිස්කට් මුසුනේ මැලිබන් හන්දියේදිය
සුවදින් පොඟවගෙන රස මවාගෙන
ගමන අරඹමු හිස් බඩට දුක පුරෝගෙන..
ගෙදර බරනම් දැන් වැඩියි
වැඩිපුර පෑගුණොත් ඒකයි..
කටුකටු තාප්පය පහුවෙද්දි
කනත්තෙ හන්දියට ළංවුණා
හැඩ මවපු නිසල විමනෙ සුදුකොඩි
අනිත් සුවඳක් සිහි කලා
රථය නම් දැන් ටිකෙන් ටික ස්ලෝ වුණා
පලවෙනි ටර්න් එක ඉවරයි
බෙලෙක් කඩේ මාළු ලාබයි
හාල්පොල් තුනපහ ගත්තාම
දවසටත් කලින් පඩිය ඉවරයි
හතරට කලින් නුගේගොඩට දාගන්න
නැත්තම් හොදටම ට්‍රැෆික්
තාත්තට බෙහෙත්
ඉස්කෝලෙට පොත්
ළමයින්ට කිරිපිටි
බඩු බිලේ මේ ටික ඉතිරියි
අදත් කඩේකට ණයවෙන පාටයි
අපි දැන් මහපාරටම සින්නයි
එක එක රෑට්වල
හැල්මේ දුවන බස්රථ බෝමයි
රටාවට පාට මාරුවෙන
කලර් ලයිට් අතර
ටර්න් දෙකක් නැති අපේ ජීවිතවලට
හැමදාම උරුම
රතු ලයිට් ට්‍රැෆික් විතරමයි



තවත් මිනිසෙකුගේ නිදහස පැහැර ගන්නා මිනිසා ද්වේෂයේ සිරකරුවෙකි. ඔහු අගතියේත්, පටු මානසිකත්වයේත් යදම්වලින් බැඳ සිටී. මගේ නිදහස උදුරාගත්විට මා නිදහස් නොවන්නාක් මෙන්ම මා වෙන කෙකුගේ නිදහස උදුරාගත්විට මම නිදහස් නොවෙමි. පීඩකයා හා පීඩිතයා යන දෙදෙනාම තම මානුෂිකත්වය සොරකම් කරනු ලැබුවෝ වෙත්.

නෙල්සන් මැන්ඩෙලා

# ලංකාවේ ආර්ථිකයට ලියුකේමියා?




ලංකාව ධනපති ක්‍රමය තුළ වර්තමානයේ මුහුණදී සිටින ආර්ථික අර්බුදය ඉතාම බරපතළ වූවක් බව දිනපතා සිදුවන සිදුවීම්වලින් ප්‍රකාශයට පත්වෙමින් තිබේ. රුපියල බාල්දුවීම, බඩුමිල නිතිපතා ඉහළයාම, අධ්‍යාපන කප්පාදුව, සෞඛ්‍ය සේවා කප්පාදුව, රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප කප්පාදු කිරීම, සහන ආපසු උදුරා ගැනීම, බදුබර වැඩිවීම, ආදායම් මාර්ග දුර්වලවීම ආදී කරුණු රැසක් මතින් මෙම අර්බුදය සමාජය තුළ ප්‍රකාශයට පත්වෙමින් තිබේ.

ලාංකේය ධනවාදය මේ මොහොතේ මුහුණදී ඇති ආර්ථික අර්බුදයේ ප්‍රමාණය කෙතරම්ද? එහි සැබෑ හේතු මොනවාද? එය ජනතාවට බලපාන්නේ කෙසේද යන කරුණු පිළිබඳව රටක් ලෙස හොඳින් වටහා ගැනීම අවශ්‍යය.

ලංකාවේ ධනවාදයේ ආර්ථික අර්බුදය කුමන ක්ෂේත්‍රවල කුමන ආකාරයෙන් පිළිබිඹු වුවද හරයෙන් ගත්විට එහි පවතින්නේ වත්කම් නොඉපදවීමේ ගැටලුවය. ලංකාව රටක් ලෙස තමන් විසින් කළ යුතු අනිවාර්ය වියදමට අවශ්‍ය වන ආදායම ලබා ගැනීමට අසමත්ව සිටී. සත්‍යය එයයි. ලංකාවේ ධනපති ආර්ථිකය දැන් රටට අවශ්‍ය ආදායම ඉපැයීමට අසමත්ව සිටී. රටේ නිෂ්පාදන මාර්ග කාලයක් තිස්සේ  දුර්වලවීමේ ප්‍රතිඵලය ලෙස මේ වනවිට නිෂ්පාදන මාර්ග ඵලදායී නැති තත්වයට පත්ව තිබේ. පැරණි නිෂ්පාදන මාර්ග ඵලදායී නොවන අතර නව නිෂ්පාදන මාර්ග නිර්මාණය කර ගැනීමටද ධනපති ආණ්ඩු අසමත්ව තිබේ. ආර්ථිකය හරයෙන් නව වත්කම් නොඋපදවන විට, ඒවා ඵලදායී නොවන විට එය විවිධ මාර්ග මගින් ප්‍රකාශයට පත්වේ.

ලංකාවේ ආර්ථිකයේ පවතින මෙම අර්බුදය උදාහරණ කීපයෙන් තේරුම් ගත හැක. පසුගිය කාලය පුරා ලංකාවේ රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය විය. දැන් ඩොලර් 01ක් රු. 153ක් පමණ වේ. රුපියල දිගින් දිගට අවප්‍රමාණය වන්නේ ඇයි? අප භාවිත කරන මුදලේ වටිනාකම තීරණය වන්නේ, අප රටක් ලෙස නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණයේ වටිනාකම මතය. අප නිපදවන භාණ්ඩ හා සේවාවල වටිනාකම අඩුවන විට මුදලේ අගයද අඩුවේ. විශේෂයෙන්ම විදේශ මුදල්වලට සාපේක්ෂව රුපියලේ අගය රඳා පවතින්නේ රට සතු විදේශ වත්කම්වල ප්‍රමාණය මතය. විදේශ වත්කම් අඩු වන විට ඊට අනුරූපව රුපියලේ අගයද අඩුවේ. විදේශ ණයවලින් මෙම කඩාවැටීම තාවකාලිකව වසා ගත්තද ඉන්පසු ණය ගෙවීමට සිදුවීමත් සමග අර්බුදය දෙගුණ තෙගුණ වී පැමිණේ. දැන් සිදුවන්නේ එයයි.

ලංකාව වසරකට පිටරටින් භාණ්ඩ ගෙන්වීමට දළ වශයෙන් ඩොලර් මිලියන 20,000ක් වැය කරනු ලැබේ. ඉන් සමහර භාණ්ඩ ලංකාවේ නිපදවා ගත හැකි ඒවා බවද තේරුම් ගත යුතුය. කෙසේ වෙතත් ලංකාවේ ආනයන වියදම වසරකට ඩොලර් මිලියන 20,000ක් වෙද්දී රටේ අපනයන ආදායම පවතින්නේ ඇ.ඩො. මිලියන 10,000ක සීමාවේය. ඒ අනුව ලංකාව විදේශ වෙළඳාමෙන් 100%ක පාඩුවක් ලබයි. ඊට හේතුවද ලංකාවේ නිෂ්පාදන මාර්ග දුර්වලව තිබීමය. මේ නිසා විදේශ මුදල් උපයා ගැනීමේ උභතෝකෝටික ගැටලුවකට ආණ්ඩුව මුහුණදී සිටී. මේ සඳහා ආණ්ඩුවට තිබූ ප්‍රධාන විසඳුම වූයේ, රටේ වටිනා සම්පත් වන ඉඩම්, වරාය, ගුවන් තොටුපළ, තෙල් ටැංකි, දූපත් වැනි දේ විදේශ සමාගම්වලට ලබාදී ඩොලර් කීපයක් උපයා ගැනීමය. එහෙත් රජයේ සම්පත් රටේ සම්පත් විකිණීමට එරෙහිව මතුවන ප්‍රබල ජනතා විරෝධය හමුවේ එයද කර ගැනීමට නොහැකි විය. ආණ්ඩුව මුහුණපා සිටින විදේශ වත්කම් අර්බුදය කෙතරම්ද යත් ලංකාවට ඩොලර් ලක්ෂ 03ක් රැගෙන එන ඕනෑම විදේශිකයෙකුට ලංකාවේ වසර 05කට ස්ථිර පදිංචියට වීසා නිකුත් කිරීමේ තීරණයත් පවා පසුගිය දිනවල ආණ්ඩුව විසින් ගනු ලැබිණ. එහෙත් එලෙස කිසිවකු ආ බවක්ද පෙනෙන්නට නැත.

රටක් තමන්ට අවශ්‍ය කරන අත්‍යාවශ්‍ය වියදම් සඳහා වන වත්කමවත් උපයා ගැනීමට අසමත් නම් ඒ සඳහා දිගින් දිගටම ණය ගැනීමට සිදුව තිබේ නම් එම රටේ ආර්ථිකය පසුවන්නේ මාරාන්තික තත්වයකය. එය ලියුකේමියා රෝගය වැළඳීමට සමානය. ලියුකේමියා රෝගයේදී සිදුවන්නේ, පුද්ගලයෙකුගේ ශරීරය තුළ නිපදවෙන රතු රුධිරාණු විනාශවීම හා ඒවා නිපදවීම සිදු නොවීමය. එවිට එම පුද්ගලයා ටික දිනක් හෝ ජීවත්කරවා ගැනීමට පිටතින් 'ලේ' ලබාදිය යුතුය. දැන් ලංකාවේ ආර්ථිකය දුවන්නේද එලෙසය. ලංකාවේ ආර්ථිකය රටට අවශ්‍ය කරන වත්කම් උපායා ගැනීමට අසමත්ය. එවිට ලියුකේමියා රෝගියාට ලේ දෙන්නාක් මෙන් ලංකාවට පිටතින් ණය ගැනීමට සිදුවේ. රටක ආර්ථිකය රඳා පවතින්නේ, ණය මතනම් එම ණය ප්‍රමාණය රටේ ජාතික ආදායමෙන් 80%කට ආසන්න නම් එය ඉතාම අනතුරුදායකය. ලංකාව දැන් සිටින්නේ, එම අනතුරුදායක සීමාවේය. ධනවාදය දිනෙන් දින මරණයට ළඟාවෙමින් සිටීයයි පැවසුවහොත් එය අසත්‍යයක් නොවේ.

මෙම මහා අර්බුදය හමුවේ ධනපති ආණ්ඩුවේ හැසිරීම කෙසේද? රටක් ලබන ආදායම වියදමට ප්‍රමාණවත් නැතිනම් ඒ සඳහා රටකට විසඳුම් 2ක් තිබේ. එකක් නම් වියදමට ගැලපෙන සේ ආදායම් වැඩිකර ගැනීමය. ඒ සඳහා නිෂ්පාදනයට මූලිකත්වය දෙන, ආර්ථිකයක් නිර්මාණය කරගත යුතුය. එහෙත් ලංකාවේ එවැන්නක් සිදුවන්නේ නැත. සිදුවෙමින් තිබෙන්නේ, පැවති සම්ප්‍රදායික වතු වගාව පවා විනාශකර දැමීමය. අනෙක් අතට මේ සඳහා වන දෙවැනි විසඳුම වන්නේ, අනවශ්‍ය වියදම් අඩුකිරීමය. ලංකාවේ නිපදවීමට හැකි, කිරි ආහාර, එළවළු, පලතුරු, ධාන්‍ය වැනි දේ සඳහා විදේශවලට මුදල් යාම නවතා ඒවා ලංකාවේ නිපදවා ගැනීමය. ලංකාවට ගෙන්වන තෙල්වලින් වැඩි ප්‍රමාණයක් බලශක්තිය නිපදවීමට (ඩීසල් බලාගාර සඳහා) යොදවන බැවින් බලශක්තීන් සඳහා විකල්ප ක්‍රම (හිරු එළිය, සුළං වැනි) උපයෝගීකරගෙන ලංකාවට තෙල් ගෙන්වීම අඩුකළ හැක. එහෙත් ආණ්ඩුව එවැනි පියවර ගන්නේද නැත. ඒ ධනවාදයට දැන් එවැනි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි තරමටම එය අර්බුදයට ගොස් ඇති නිසාය. ලෙනින් වරක් කියූ පරිදි ධනපති ක්‍රමය අර්බුදයට ධනවාදය තුළ විසඳුම් නැත. ධනවාදයේ අර්බුදයෙන් මිදීමට ධනපති පංතිය දරන උත්සාහය ලෙනින් සමාන කළේ අයෙක් තමන්ගේ සපත්තුවල පටිවලින් ඇද තමන්වම ඔසවා ගැනීමට දරන උත්සාහයක් ලෙසය.

ධනවාදයේ අර්බුදයෙන් මිදීමට වියදමට සරිලන සේ ආදායම වැඩිකිරීමට නොහැකි වීම තුළ ආණ්ඩුව සිදුකරන්නේ කුමක්ද? ඒ ආදායමට අනුව වියදම සීමාකිරීමය. වියදම් කප්පාදු කිරීමය. එහිදී ආණ්ඩුව කප්පාදු කරන්නේ, තමන්ගේ වියදම් නොව ජනතාවගේ වියදම්ය. ඇමතිවරුන්ට පඩිගෙවීමට, වාහන ගැනීමට, අමාත්‍යාංශ සඳහා ගොඩනැගිලි ගැනීමට, උත්සවවලට කරනු ලබන අනවශ්‍ය වියදම් හෝ හොරාකෑම, වංචාව නතර කරන්නේ නැත. ඒ වෙනුවට ආණ්ඩුව අත තියන්නේ, ජනතාවට ලබාදෙන සේවාවලටය. නිදහස් අධ්‍යාපනය කප්පාදු වන්නේ, නිදහස් සෞඛ්‍ය සේවාව කප්පාදු වන්නේ, ඒ අනුවය. අධ්‍යාපනයට, සෞඛ්‍යයට ආණ්ඩුව දරන දායකත්වය, දරන වියදම් අඩුකර ගැනීම ආණ්ඩුවේ අවශ්‍යතාවය වේ. අධ්‍යාපන පෞද්ගලීකරණය පෙරට එන්නේ ඒ අනුවය. රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප කප්පාදු වන්නේත් ගොවි ජනතාවට ලබාදිය යුතු වගා වන්දි මුදල් ලබා නොදෙන්නේත් මේ හේතු නිසාය. තනි වචනයෙන් ගතහොත් ධනවාදයේ අර්බුදය විසින් කප්පාදුවට ලක්ව ඇත්තේ පොදු ජනයාගේ අයිතිවාසිකම්ය.

අර්බුදයට ගිය ආර්ථිකයක් සහිත, අර්බුදයට ගිය ධනපති ආණ්ඩුවකින් සහන බලාපොරොත්තුවීම හෝ අයිතීන් ලබා ගැනීමට බලාපොරොත්තුවීම "ඉබ්බන්ගෙන් පිහාටු" බලාපොරොත්තුවීම වැනි දෙයක් වේ. රටක් සංවර්ධනය කිරීමට හෝ ජනතා වුවමනාවන් ඉටුකිරීමට දැන් ලාංකේය ධනවාදය අසමත්ය. දැන් එය මරණාසන්න ලියුකේමියා රෝගියෙකි. එයට හැකි වන්නේ, ජනතාවගේ රුධිරය උරා බොමින් ටික කලක් ජීවත්වීමය. ධනවාදය වෙනස් කිරීමට බලවේග පෙළ ගැස්විය යුත්තේ ඒ නිසාය. ධනපති ආණ්ඩුවෙන් අයිතින් දිනාගැනීමට, අධ්‍යාපනය රැක ගැනීමට, දේපළ විකිණීම නතර කිරීමට, සමාජ සාධාරණත්වය, සමාජ සදාචාරය ඇතිකර ගැනීමට කරන සටන එම සීමාවන් තුළ නතර නොකර ධනවාදය පැරදවීම දක්වා දිගුකිරීම හැර මෙම අර්බුදය හමුවේ ජනතාවට වෙනත් විකල්පයක් නැත. අප ක්‍රියාත්මක විය යුත්තේ ඒ වෙනුවෙනි.

> ලියුකේමියා රෝගයේදී සිදුවන්නේ, පුද්ගලයෙකුගේ ශරීරය තුළ නිපදවෙන රතු රුධිරාණු විනාශවීම හා ඒවා නිපදවීම සිදු නොවීමය. එවිට එම පුද්ගලයා ටික දිනක් හෝ ජීවත්කරවා ගැනීමට පිටතින් 'ලේ' ලබාදිය යුතුය. දැන් ලංකාවේ ආර්ථිකය දුවන්නේද එලෙසය. ලංකාවේ ආර්ථිකය රටට අවශ්‍ය කරන වත්කම් උපායා ගැනීමට අසමත්ය. එවිට ලියුකේමියා රෝගියාට ලේ දෙන්නාක් මෙන් ලංකාවට පිටතින් ණය ගැනීමට සිදුවේ. රටක ආර්ථිකය රඳා පවතින්නේ, ණය මතනම් එම ණය ප්‍රමාණය රටේ ජාතික ආදායමෙන් 80%කට ආසන්න නම් එය ඉතාම අනතුරු දායකය. ලංකාව දැන් සිටින්නේ, එම අනතුරුදායක සීමාවේය. ධනවාදය දිනෙන් දින මරණයට ළඟාවෙමින් සිටීයයි පැවසුවහොත් එය අසත්‍යයක් නොවේ.



"එය ධනපති ආණ්ඩුවක් නිසා පාන් දීම එයට කළ නොහැකිය. එයට දිය හැකි හොඳම දෙය, 'දක්ෂ ලෙස සංවිධානය කළ දුර්භික්ෂය' වන්නේය. නමුත් ජනතාව දුර්භික්ෂය පිළි නොගනු ඇත. පාන් තිබෙන බවත්, එය ලබා ගත හැකි බවත්, එහෙත්, එය ලබා ගත හැක්කේ ප්‍රාග්ධනයේ හා ඉඩම් හිමිකමෙහි ශුද්ධත්වයට ගරු නොකරන ක්‍රමවලින් පමණක් බවත්, ඔවුන් ඉගෙන ගනු ඇත. සමහර විට ඉතා ඉක්මනින් ඔවුන් එය ඉගෙන ගනු ඇත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**5 වැනි වෙළුම,**
**19 පිටුව**

# නොනැවතී දිලෙන රතු තරුව

පසුගිය මැයි මස අග භාගයේ සිට ජුනි මස මුල් සතිය දක්වා දිවයිනේ ප්‍රදේශ ගණනාවක් ආපදා තත්වයට පත් විය. ගංවතුර ගැලීම්, නාය යෑම් මේ අතුරින් මූලික වූ අතර මේ හේතුවෙන් ලක්ෂ ගණනක් අවතැන් වූහ.

මෙවරද වෙනත් අවස්ථාවලදී මෙන් රාජ්‍ය යාන්ත්‍රණයේ දියාරු ස්වරූපය පැහැදිලිව පෙනෙන්ට වූ අතර ආණ්ඩුවේ වගකිවයුතු මැති ඇමතිවරුන්ද මේ හදිසි ආපදා තත්වය කළමණාකරණය කිරීම තබා රටේවත් සිටියාද යන්න සැක සහිතය. මේ අතර ඇතැම් විද්‍යුත් මාධ්‍යය මේ ආපදා තත්වය රටට වාර්තා කරනවා වෙනුවට තම නාලිකාවන්ගේ ප්‍රවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරන ආකාරයද දක්නට ලැබුණි.

ජ.වි.පෙ. සහන සේවා බලකාය හෙවත් " රතු තරුව " අවතැන් වූවන්ගේ සහන කටයුතු සඳහා මැදිහත් වී සිටියේ මෙවන් වට පිටාවක් තුළය. ජ.වි.පෙ.



අනෙකුත් දේශපාලන ව්‍යාපාරයන්ගෙන් වෙන්ව පෙනෙන කරුණක් වනුයේ ස්වෙච්ඡාවෙන් ජනතාවට සේවය කිරීමය. මෙවන් ආපදා තත්වයන් තුළ සහන සේවා කටයුතුවල නිරත වෙන ජ.වි.පෙ. සාමාජික සමාජිකාවන් තුළින් මතුවනු ලබන්නේද ජ.වි.පෙ. තුළ ඇති එකී ගුණයයි. මාතර ප්‍රදේශයේ ජ.වි.පෙ. සාමාජිකයෙකු තම පවුලේ සාමාජිකයින් ඇතුළු ඥාතීන් 10 දෙනෙකු ආපදා තත්වය හේතුවෙන් ජීවිතක්ෂයට පත්ව සිටියදී "රතු තරුව" සහන සේවා කටයුතුවලද නිරතව සිටිනු මෙවර දක්නට ලැබුණි.

ජ.වි.පෙ. මෙසේ හදිසි ආපදා තත්වයන්ට මැදිහත් වීම අද ඊයෙක සිදුවූවක් නොවේ. වර්ෂ 1979 දී මඩකළපුව ප්‍රදේශයේ ඇති වූ ආපදා තත්වයේදීද, 2003 සිදුවූ ගංවතුර තත්වයේදීද ජනතාවට සහන සැලසීමට මැදිහත් වූ බවට ඉතිහාසය සාක්ෂි දරනු ලබයි. වර්ෂ 2004 දී සිදුවූ සුනාමි ආපදාවන්ට මැදිහත් වීම හේතුවෙන් "රතු තරුව" යන නාමය වඩා හොඳින් ජනතාවගේ හදවත් තුළට ඇතුල් වී තිබේ.

පසුගිය මාසයේ ඇතිවූ ගංවතුර සහ නායයෑම් පසුබිම තුළද තම පක්ෂයේ සාමාජිකයින් මෙන්ම එයට අනුබද්ධ ශිෂ්‍ය. තරුණ, කම්කරු ආදී ක්ෂේත්‍රයන් සහ හිතවතුන් විධිමත් ලෙස සංවිධානය කරමින් රත්නපුර, ගාල්ල, මාතර, කළුතර ආදී ආපදාවට ලක් වූ දිස්ත්‍රික්කයන්හි සහන සේවා කටයුතු සඳහා එක් කිරීමට ජ.වි.පෙ. කටයුතු කරන ලදී.

පියවර කිහිපයක් ඔස්සේ මේ සහන කටයුතු සිදුවූ අතර මූලිකවම විපතට පත්වූවන් සිටින ස්ථානවලට ගොස් ඔවුනට අවශ්‍ය ආහාර පාන, බෙහෙත් ද්‍රව්‍ය ලබාදීම, පසුව ඔවුන් සහන කඳවුරු වෙත යොමු කිරීම, තවද එම කඳවුරු පදනම් කර ගනිමින් සෞඛ්‍ය සායන පැවැත්වීම ඒ අතර විය. එසේම විපතට පත් ජනතාවට අවශ්‍ය ආහාර පාන, ඇඳුම් පැලඳුම්, බෙහෙත් ද්‍රව්‍ය ආදිය එක් රැස් කිරීම සඳහා මෙන්ම "රතු තරුව" සහන සේවා බලකාය හා එක්ව ස්වෙච්ඡාවෙන් කටයුතු කිරීමට කැමති පුද්ගලයන් හට සම්බන්ධ වීම සඳහා මධ්‍යස්ථානද ඒ ඒ පෙදෙස්වල පිහිටුවා තිබුණි.

ගංවතුර ඇති වූ මොහොතේ පැමිණි ඇතැමුන් කුමන හෝ ආධාර ප්‍රමාණයක් බෙදා එතැනින් ඉවත් වුවද ජ.වි.පෙ. එසේ නොවීය. ගංවතුර බැස ගිය පසුවද එම ප්‍රදේශවල රැඳී සිටිමින් පාසැල්, රෝහල්, පන්සල්, කෝවිල් ආදී පොදු ස්ථානද විපතට පත් ජනයාගේ නිවාස, ළිං ආදියද පිළිසකර කරදී ජන ජීවිතය යථා තත්වයට ගෙන ඒමටද ජ.වි.පෙ. මැදිහත් විය.

# ජීවයේ අයිතිය වෙනුවෙන්

ගංවතුර ගැලීම්, කඳු නායයෑම්, නියඟ ආදිය මෙරට තුළ සුලභව දක්නට ලැබෙන කාරණා බවට පත්ව ඇත. එනිසාම පැවති හෝ පවතින ආණ්ඩු සිදුකළේ මෙවැනි සිදු වීමක් වූ විට අදාළ අවස්ථාවේ කිසියම් මැදිහත් වීමක් කර එම ප්‍රශ්නය කර ඇර සිටීමයි. නොඑසේ නම් එවැනි ගංවතුර ගැලීමක්, නායයෑමක් නියං තත්වයක් ඇති වීමට බලපෑ කාරණා සොයා බලා එවැනි අවස්ථා ඇති වීම වළක්වා ගැනීමට හෝ ඒවා ඇති වූ විට හානිය අවම කර ගැනීමට කටයුතු කිරීම නොවේ. පැවති එ.ජා.ප., ශ්‍රීල.නි.ප. පාලනයන් තුළ මෙන්ම වත්මන් හවුල් පාලනය තුළද පරිසරයට තබා ඇත්තේ ඉතාම අඩු බර තැබීමකි.


1948 ලැබුණු ඊනියා නිදහසින් පසු මෙරට පාලනය කළ දේශපාලන පක්ෂ දෙකම තම දේශපාලන බල ව්‍යාපෘතිය පදනම් කර ගනිමින් ක්‍රියාත්මක කළේ, පරිසරයට සතුරු සංවර්ධනයකි. මේ තත්වය 1977 දී මෙරටට හඳුන්වා දුන් විවෘත ආර්ථිකයත් සමග වඩා වේගවත්ව සිදුවන්නට විය. ලාභ, කොමිස් හා වෙනත් වරප්‍රසාද ඉලක්ක කර ගනිමින් සිදු කළ මෙවැනි ව්‍යාපෘති මගින් අද රටට ගෙනවිත් ඇත්තේ ආපදා තත්වයන් පමණි.

වර්ෂ 1970 දී පමණ ජ.වි.පෙ. නායක රෝහණ විජේවීර සහෝදරයා තුන් කල් දක්නා තම නුවණින් අද දවසේ මේ සිදුවන විපත් වළක්වා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව එදා රට හමුවේ පවසන ලදී. රට තුළ අද මෙන් මහා පරිමාණ පාරිසරික විපත් නොමැති වට පිටාවත් තුළ මෙන්ම එකල ආණ්ඩුද පරිසරය සම්බන්ධ අමාත්‍යාංශයක් පවා ස්ථාපිත කර නොතිබූ අවස්ථාවක ජ.වි.පෙ. පරිසරය රැක ගැනීම වෙනුවෙන් තම ඉදිරි දැක්ම ප්‍රකාශයට පත් කර තිබිණි. එසේම පසුගිය ජුනි 03 වෙනිදා "ජීවයේ අයිතිය" සංවිධානය විසින් සංවිධානය කරන ලද "මධ්‍ය කඳුකරයේ විනාශය රටේ අනාගත මරණය" යන සම්මන්ත්‍රණයට සහභාගී වෙමින් ඌව පළාත් සභා මන්ත්‍රී ජ.වි.පෙ.




මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා පරිසරය රැක ගැනීම වෙනුවෙන් රටක් ජනතාවක් ලෙස සාමූහිකව මැදිහත් වීමේ වුවමනාව අවධාරණය කරන ලදී.

මෙම සම්මන්ත්‍රණයේ මුලසුන ප්‍රවීන රංග ශිල්පි අයිරාංගනී සේරසිංහ මහත්මිය විසින් දරන ලද අතර පරිසරවේදී පූජ්‍ය වැකඳවල රාහුල හිමි, මහාචාර්ය ජිනදාස කටුපොත, වෛද්‍ය ප්‍රසන්න කුරේ යන විද්වතුන් විසින් දේශන පවත්වන ලදී. කොළඹ මහවැලි කේන්ද්‍රයේදී පැවති මේ සම්මන්ත්‍රණය සඳහා ඒ දිනවල පැවති අයහපත් කාලගුණ තත්වයද නොසලකා විශාල පිරිසක් සහභාගී වී සිටියහ.



# 'ඔවුහු ඔබට අසීමිතව ප්‍රේම කළහ'

ශිෂ්‍යයින් යනු රැඩිකල් කොටසක් බව ඉතිහාසය පුරාවටම ඔප්පුවී හමාරය. පෙර පැවති සියලු ආණ්ඩු මගින් ගෙන ආ අධ්‍යාපන කප්පාදුව මෙන්ම රටට බලපාන පොදු අර්බුදවලදීත් ශිෂ්‍ය ව්‍යාපාරය විසින් සිදු කළ මැදිහත් වීමට ඒ රැඩිකල්කම මූලිකව බලපාන්නට ඇත. ශිෂ්‍යයින්ගේ රැඩිකල්භාවයට නිවැරදි දේශපාලන දෘෂ්ටියක මඟපෙන්වීම ලැබුණු විට එය සමාජ බලයක් බවට පත්වන බවත් ජයග්‍රහණ කැටුව එන බවත් ඉතිහාසය විසින් පෙන්වා දී තිබේ.

ශිෂ්‍ය ව්‍යාපාරයට නිසි මඟ පෙන්වීමක් කරනු ලැබුවේ ජ.වි.පෙ. විසින් බවට ඉතිහාසය විසින් සාක්ෂි දරනු ලබයි. පැරණි වම විසින් හුදු ශිෂ්‍ය අයිතිවාසිකම් දිනා ගැනීමේ සීමාව තුළ පමණක් කොටු කර තිබූ ශිෂ්‍ය ව්‍යාපාරය පොදු අරගල සඳහා කැඳවනු ලැබුවේ ජ.වි.පෙ. විසිනි. 1976 නොවැම්බර් 12වැනිදා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වීරසූරිය සිසුවා ඝාතනය කිරීමෙන් මෙරට පාලකයන් විසින් ඇරඹි ශිෂ්‍ය ජීවිත බිලි ගැනීම සහ ලේ රස බැලීම අද දක්වාද එක ලෙස ක්‍රියාත්මක වෙමින් තිබේ.

ජාතික ශිෂ්‍ය වීර දිනය බිහි වනු ලබන්නේද පොදුජන අයිතිවාසිකම් වෙනුවෙන් තම ජීවිතය පුද කළ ඒ සිසු වීරවරුන් සහ වීරවරයින් සිහිපත් කිරීම සහ ඔවුන්ගේ ආදර්ශයන් මතු පරපුර වෙනුවෙන් රැගෙන යාමේ වුවමනාව වෙනුවෙනි.

මෙවරද සමාජවාදී ශිෂ්‍ය සංගමය විසින් ජාතික ශිෂ්‍ය වීර දින සමරුව වඩා උත්කර්ෂවත් අන්දමින් පැවැත් වූ අතර නොනිමි මෙහෙවරෙක මතක මං පෙත නමින් ඡායාරූප ප්‍රදර්ශනයක් ජුනි 19වැනිදාද 'ඔවුහු ඔබට අසීමිතව ප්‍රේම කළහ' යන තේමාව යටතේ ජාතික ශිෂ්‍ය වීර දිනය සමරුව ජුනි 20 වෙනිදාද කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදීද පවත්වන ලදී.

සමරු උළෙලේ ප්‍රධාන දේශනය ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් පැවැත් වූ අතර සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා සහ රුහුණු විශ්ව විද්‍යාලයේ ආචාර්ය ජිනසේන හේවගේ මහතා විසින්ද දේශන පවත්වන ලදී.

# අවලාද මැදින් ජ.වි.පෙ. ඉදිරියට

මෛත්‍රී රනිල් හවුල තම නොහැකියාව රට තුළ මතුවන සෑම අර්බුදයකදීම මනාව පෙන්නුම් කරමින් සිටී. හොරු නොඇල්ලීම, කුණු කඳු ගොඩ ගැසීම, ආපදා තත්වයන්ට මුහුණ දීමට වැඩපිළිවෙළක් නොමැතිකම, සයිටම් අර්බුදය, ඩෙංගු උවදුර, ජාතිවාදී ප්‍රවණතා කළ එළි බැසීම, පළාත් පාලන ඡන්දය, ගොවි ගැටලු ආදීය මූලික වශයෙන් දැක්විය හැක.

ආණ්ඩුව තුළ තිබෙන බල අරගලය හේතුවෙන් රටේ ජනතාවගේ ප්‍රශ්න ගැටලුවලට පිළිතුරු සොයනවාට වඩා තමන්ගේ බලය රැක ගැනීම වෙනුවෙන් ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අනවරත අරගලයක යෙදී සිටී. දිනෙන් දින රට අරාජික තත්වයට යනවා විනා ලැබෙන විසඳුමක් පෙනෙන මානයක නොමැත.


ඒකාබද්ධ විපක්ෂයයැයි කියා ගන්නා කල්ලියට ආණ්ඩුවේ මේ නොහැකියාවට එරෙහිව කටයුතු කිරීමට නොහැකි වී ඇත්තේ මේ මොහොතේ මතුව ඇති ඇතැම් ගැටලුවල මූලිකයා තමන් වීම නිසාවෙනි. එබැවින් මේ තත්වය තුළ පෙරට වඩා ජ.වි.පෙ. දෙසට ජනතාවගේ අවධානය යොමු වීමට පටන්ගෙන ඇත. මේ තත්වය තුළ මේ ඔවුන් සියල්ලන්ගේම පොදු සතුරා වී ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණය. එනිසාම ජ.වි.පෙ.ට එරෙහිව විවිධ මඩ ප්‍රචාරයන්, අවලාද ආදිය එල්ල කරමින් ජනතාව තුළ ජ.වි.පෙ. කෙරෙහි විශ්වාසය බිඳදැමීමට ඔවුහු වියරුවෙන් කටයුතු කරමින් සිටිති.

මේ සියලු තත්වයන් සැලකිල්ලට ගනිමින් ආර්ථික කොල්ලයට, වංචාව හා දූෂණය සහ ජාතිවාදයට එරෙහිව සහ වත්මන් ජ.වි.පෙ. අභියෝගයන් පැහැදිලි කරනු පිණිස ජ.වි.පෙ. විසින් සංවිධානය කරන ලද උද්ඝෝෂණ රැලියක් පසුගිය ජුනි 22 වෙනිදා කොළඹ විහාර මහා දේවි එළිමහන් රංගපීඨයේදී පැවැත්වුණි.

ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, දේශපාලන මණ්ඩල සභික ලාල් කාන්ත, බිමල් රත්නායක යන සහෝදරවරුන් රැලිය ඇමතූ අතර විශාල පිරිසක් වැසි නොතකා මේ රැලිය සඳහා සහභාගි වි සිටියහ.



# සමාජවාදය තුළ ආගම



සමාජවාදය තුළදී ආගමික නිදහස කෙසේ වේද යන්න සැලකිය යුතු ලෙස විවාදයට තුඩු දී ඇති ප්‍රශ්නයකි. විවිධ පුද්ගලයෝ මේ පිළිබඳ විවිධ අදහස් පළ කරති. මෙම මතයන් සත්‍යය, අර්ධ සත්‍යය හා අසත්‍ය යන පුළුල් පරාසයක විහිදී ඇත. ධනපති දෘෂ්ටිවේදීන් මේ පිළිබඳ විකෘති කරන ලද ඉතාම විවිධාකාර වූ මත දේශපාලනික අරමුණක් සහිතව නිර්මාණය කරති.

මාක්ස් ආගම 'අබිං' යැයි පවසා ඇති නිසා සමාජවාදය තුළදී ආගම් ඇදහීමට ඉඩක් නැතැයිද ආගමික ආයතන, සිද්ධස්ථාන, ධර්ම ග්‍රන්ථ ආදිය විනාශ කර දමන්නේ යයිද ඇතැම්හු පවසති. රුවන්වැලි මහා සෑයේ ගඩොල්වලින් මිනිසුන්ට ගෙවල් සාදා දෙන්නේ යයි මාක්ස්වාදීන් පැවසූ බවට ප්‍රසිද්ධ ප්‍රචාරයක් එක් කලෙක අප රට තුළද ගෙන ගොස් තිබුණි.

**ආගම මර්දනය කෙරෙයිද?**

ධනපති දෘෂ්ටිවේදීන් පොදුවේ සමාජය තුළ තහවුරු කර ඇති මතය වන්නේ සමාජවාදය තුළදී ආගම ප්‍රතික්ෂේප කරන බවකි; මර්දනය කරන බවකි. එහෙත් එය සත්‍යයද?

සමාජවාදය තුළදී ආගමික නිදහස නැති නොකෙරේ. හෘදය සාක්ෂිය අනුව ආගමක් ඇදහීමට හෝ නොඇදහීමට නිදහස ලැබෙන්නේ සමාජවාදය තුළදීය.

ධනවාදය තුළදී ආගම මිත්‍යා විශ්වාස, රැවටීම, බලහත්කාරය,මුදල් ගසා කෑම, හිංසනය අපරාධ, ත්‍රස්තවාදය, යුද්ධය, අවි ආයුධ වෙළඳාම, ඔත්තු සේවා, රටවල් කැබලි කිරීම ආදී තවත් බොහෝ දේ හා සම්බන්ධ ප්‍රපංචයක් බවට පත්කර තිබේ. මේ හැම එකකටම සජීවී උදාහරණ ඕනෑතරම් ධනවාදය තුළ තිබේ. ආගමේ නාමයෙන් ජනතාව තුළ මිත්‍යා විශ්වාස හා අවිද්‍යාව තහවුරු කරන ආකාරය අපි දැක ඇත්තෙමු. බලහත්කාරයෙන් ආගම්වල බඳවා ගැනීම් එසේත් නැත්නම් ආගමික ඇදහීම් වෙනස්කිරීම් අපි දැන ඇත්තෙමු. ආගමේ නාමයෙන් මුදල් ගසාකන අයුරු අපි දැක ඇත්තෙමු. ධනවාදය තුළදී ආගම්, ආගමික නිකායන් හිංසනයේ හා ත්‍රස්තවාදයේ උල්පත් බවට පත්කොට තිබේ.

**ආගමික නිදහස ධනවාදය තුළද?**

මේ තත්වය වෙනස් නොකොට පවත්වාගෙන යා යුතු තරම් දෙයක්ද? මේ අනුව ඉහළම ආගමික නිදහස ලැබී ඇත්තේ ධනවාදය තුළදීද?

එහෙත් සමාජවාදය තුළදී ආගම දෙස බලන්නේ පුළුල් ආකාරයකිනි. එය හුදෙක් ඇදහිල්ලක් පමණක් නොවේ; ජනතාවගේ සදාචාරයන් සිරිත් විරිත්, සම්ප්‍රදායන් හා ආධ්‍යාත්මය හා සබැඳුන ප්‍රපංචයකි. සෑම ජන කොටසකටම ඔවුන්ගේ වූ සදාචාර, සිරිත් විරිත්, සංස්කෘතික ආනන්‍යතාවයන් ඇති අතර එය ඔවුන්ගේ ආගමික විශ්වාසයන් සමඟ ළඟින් බැඳී පවතී.

කිසියම් රටක වෙසෙන සෑම ජන කොට්ඨාශයකටම වෙනසකින් තොරව සමාජවාදී රජය සිය සේවාවන් සපයයි. මේ නිසා සමාජවාදී රජයට ආගමක් නැත. ඉන් අදහස් වන්නේ සමාජවාදී රජය ආගම් විරෝධී යන්න නොවේ. සමාජවාදී රජය කිසියම් නිශ්චිත ආගමකට බැඳී නොසිටින බවයි. ඕනෑම ආගමක් අදහන සෑම ජන කොට්ඨාශයකටම වෙනස්කම්වලින් තොරව එක සේ සේවාවන් සැපයිය හැක්කේ එසේ වූ විටයි. එසේ වූ විට පමණි.

සමාජවාදය තුළදී යම් පුද්ගලයෙකුට තමන් කැමති ආගමක්, හෝ ආගම් කිහිපයක් හෝ ඇදහීමට එසේත් නැත්නම් කිසිදු ආගමක් නොඅදහා සිටීමට නිදහස තිබේ. එය එක් එක් පුද්ගලයාගේ පුද්ගලික තීරණයකි. රජය ඒ සඳහා මැදිහත් නොවේ. බලපෑම් නොකරයි. ව්‍යංගයෙන් හෝ බලපෑම් නොකරයි. රැකියාවකට බඳවා ගැනීමේදී, පාසැලට ඇතුළත් කිරීමේදී ආගම කුමක්ද යන්න සලකා බලන්නේ නැත.

**හෘදය සාක්ෂියට ඉඩ**

සමාජවාදය තුළදී බලත්කාරී ලෙස ආගම්වලට බඳවා ගැනීමට හෝ ආගම් ඇදහීමෙන් ඉවත් කිරීමට හෝ ඉඩක් නැත. එය වළක්වනු ලබන්නේ නීති මගින් පමණක් නොවේ. ඇත්තෙන්ම එහිදී නීතිය මගින් කෙරෙන්නේ ද්විතීයික කාර්යභාරයකි. ධනවාදය තුළදී බොහෝ විට ආගම්වලට බලහත්කාරී ලෙස බඳවා ගනු ලබන්නේ ආර්ථික බලපෑම් මගිනි. විශේෂයෙන්ම දුගී දුප්පත් පවුල්වල සාමාජිකයන් ආර්ථික වාසි තකා විවිධ ආගම්වලට හැරෙති. සිය හෘදය සාක්ෂියට එරෙහිව කටයුතු කරති. එහෙත් සමාජවාදය තුළදී ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් රජය මැදිහත් වී සම්පූර්ණ කරන නිසා තවෙකකුට ආර්ථික බලපෑම් කිරීමට ඇති අවස්ථාව අහිමි වන්නේය. මේ නිසා පුද්ගලයෙකුගේ කැමැත්ත අනුව, හෘදය සාක්ෂියට එකඟව කිසියම් ආගමක් ඇදහීමට හෝ නොඅදහා සිටීමට නිදහස ලැබෙන්නේ සමාජවාදය තුළදීය.

ධනවාදය තුළදී මෙන් සමාජවාදයේදී එක් හෝ තවත් ආගමක් අනෙකකට වඩා උසස් ලෙස හෝ පහත් ලෙස සැලකීමට ඉඩක් නැත. අනෙකාගේ සිරිත් විරිත් සදාචාරයන්, සම්ප්‍රදායන්, හෙළා දැකීමට ගැරහීමට ලක්කීමට ඉඩක් නැත. ඒ වෙනුවට අනෙකාට ගරු කිරීමට ඔවුන්ගේ සංස්කෘතික, සදාචාරමය අනන්‍යතාවයන්ට ගරු කිරීමට ඒවා ඉවසීමට හුරු කරනු ලැබේ. ධනවාදයේදී අනෙකාට ගරු කිරීම අනෙකා ඉවසීම, අනෙකාගේ සංස්කෘතිකමය, සදාචාරමය අනන්‍යතාවයන්ට ගරු කිරීම තත්වයෙන් පහතට වැටීමක් ලෙස, බාල්දු වීමක් ලෙස අර්ථ ගන්වා තිබුණද සමාජවාදයේදී එය දියුණු මානව ලක්ෂණයක් ලෙස සැලකේ. මේ නිසා සමාජවාදය තුළදී අන්තර් සාමයික සංහිඳියාව හෙවත් ආගම් අතර සුහදතාවය වර්ධනය වේ. මේ නිසා ආගමේ නාමයෙන් හිංසනය පැතිරවීමට, ආගමික ගැටුම් ඇති කිරීමට ජනතාව පොළඹවාලිය නොහැකිය. අනෙක් අතට තවෙකෙකුගේ ගැරහීමකට ලක් නොවී, බියකින් සැකයකින් තොරව තම ආගම ඇදහීමට ජනතාවට නිදහස ලැබේ.

**අවිද්‍යාවට තිත**

ධනවාදය විසින් ආගම මිත්‍යා විශ්වාසයන් හා අවිද්‍යාව පතුරුවා හැරීමේ මෙවලමක් බවට පත් කොට ඇත්තේය. අවසානයේ ආගම් මගින් පතුරුවා හරින්නේ ආරම්භක ශාස්තෘවරුන්ගේ අදහස් හෝ මඟපෙන්වීම් නොවේ. පුරාවිද්‍යාත්මක සොයා ගැනීම්වලට, විද්‍යාත්මක සොයා ගැනීම්වලට පටහැණි, සෑම ආගමක් තුළම ඇති මානවාදයට එරෙහි මතවාදයන්ය. ධනවාදය තුළදී ආගම් ඕනෑම අයෙකුට අවශ්‍ය පරිදි විකෘති කිරීමට ඉඩ ලබාදී තිබේ. ඒ හරහා ජනතාව ගසා කෑමට, රැවටීමට, රටවල් තුළ අභ්‍යන්තර ගැටුම් අවුළුවාලීමට, රටවල් කැබලි කිරීමට, ඉඩකඩ විවරකර දී තිබේ. එහෙත් සමාජවාදය තුළදී ආගමේ නාමයෙන් මිත්‍යා විශ්වාසයන් හෝ අවිද්‍යාව පතුරුවා හැරීමට ඉඩ ලබා නොදෙයි. එය සිදු කරනු ලබන්නේ බලහත්කාරයෙන් නොවේ. ජනතා අධ්‍යාපනය තුළිනි. ජනතාව විද්‍යාත්මක දැනුවත් කිරීම තුළිනි. බලපෑම් වලින් තොරව තර්කානුකූලව සිතීමට ජනාතව හුරු කිරීම තුළිනි. සමාජවාදය තුළදී සෑම ජන කොට්ඨාශයකටම තමන්ගේ සංස්කෘතික අනන්‍යතාවයන් හා හර පද්ධතීන් පෝෂණ කර ගැනීමට අවශ්‍ය අවස්ථා ලබා දෙයි, ආගමික සිද්ධස්ථාන සංවර්ධනය, ආගමික පොතපත මුද්‍රණය ආදිය ඒ ඒ ආගමික සංස්ථාවන්ට අවශ්‍ය පරිදි සිදුකර ගැනීමට මේ අනුව ඉඩකඩ සැලසේ.

ඓතිහාසික හා සංස්කෘතික වටිනාකමකින් යුක්ත ගොඩනැගිලි, සිද්ධස්ථාන, පොත පත, කලා කෘති ආදිය සංරක්ෂණය කිරීම සමාජවාදය තුළදී රජයේ වගකීමක් කර ගනී. මක් නිසාද යත් ඒවා හුදෙක් එක් එක් ආගමක අයිතියක් පමණක් නොවන බැවිනි. ඒවා එක් එක් රටේ ඉතිහාසය හා අඛණ්ඩව බැඳී පවතින බැවිනි. ඒවා පොදු මහත් ජනතාවගේම උරුමයක් වන බැවිනි. අදටත් මොස්කව් නුවර සංකේතය ලෙස සැලකෙන ඕර්තඩොක්ස් පල්ලිය රුසියානු විප්ලවයෙන් පසුව ලෙනින් විසින් කඩාබිඳ දැම්මේ නැත. ඒ වෙනුවට එය සංරක්ෂණය කර මොස්කව් නුවර සංකේතය බවට පත්කරනු ලැබිණි.

> සමාජවාදය තුළදී ආගම දෙස බලන්නේ පුළුල් ආකාරයකිනි. එය හුදෙක් ඇදහිල්ලක් පමණක් නොවේ; ජනතාවගේ සදාචාරයන් සිරිත් විරිත්, සම්ප්‍රදායන් හා ආධ්‍යාත්මය හා සබැඳුන ප්‍රපංචයකි. සෑම ජන කොටසකටම ඔවුන්ගේ වූ සදාචාර, සිරිත් විරිත්, සංස්කෘතික ආනන්‍යතාවයන් ඇති අතර එය ඔවුන්ගේ ආගමික විශ්වාසයන් සමඟ ළඟින් බැඳී පවතී.



"ස්ථානයීය පරිමාණයෙන් ඉතා හදිසි කාර්ය ඉටු කළ විට යමෙකුගේ විප්ලවීය උද්යෝගය මොට වේ නම් සහ නිර්ධන පංති ජාත්‍යන්තරවාදය යමෙකුට අමතක වේ නම්, යමෙකු නායකත්වය සපයන විප්ලවය චාලක බලයක්ව පැවැත්ම නතරව සුවපහසු නිදිමතකට කිඳා බසී. භූමිය දිනා ගැනීම සඳහා අපේ සමාදානයෙන් තොර සතුරා වන අධිරාජ්‍යවාදය විසින් එම තත්වය උපයෝගී කර ගනු ඇත. නිර්ධන පංති ජාත්‍යන්තරවාදය යුතුකමක් පමණක් නොව විප්ලවීය අනිවාර්යතාවයක්ද වේ. අපේ ජනතාවට අප උගන්වන්නේ එසේය."

**චේ ගෙවාරා**
**සමාජවාදය සහ මිනිසා සහ වෙනත් රචනා, 29 පිටුව**

# මැදපෙරදිග
# උණුසුම් කරන කටාරය




එක්වරම සහ අනපේක්ෂිත ලෙස අරාබි ගල්ෆ් කලාපීය රටවල රාජ්‍යතාන්ත්‍රික අර්බුදයක් පැන නැගුණේ සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බහරේන්, ඊජිප්තුව හා මාලදිවයින පසුගිය ජුනි 05 වැනිදා කටාර් රාජ්‍යයට එරෙහිව ක්‍රියාමාර්ග ගණනාවක් ගැනීමත් සමගය. මෙම රටවල ප්‍රධාන චෝදනාව වූයේ, කටාර් රාජ්‍යය 'ජාත්‍යන්තර ත්‍රස්තවාදයට සහාය දක්වන්නේය' යන කරුණයි. ඒ අනුව මෙම රටවල් කටාර් රාජ්‍යය සමග රාජ්‍යතාන්ත්‍රික සබඳතා අත්හැරියහ. බහරේනය, සෞදි අරාබිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය තම රටවල කටාර් තානාපතිවරුන්ට පැය 48ක් ඇතුළත තම රටවල්වලින් ඉවත්වන ලෙසට දැන්වීය. එකී රටවල සිටින කටාර් ජාතිකයන්ට සති දෙකක් ඇතුළත තම රටවල්වලින් ඉවත්වන ලෙස දැනුම් දෙනු ලැබීය. සෞදි අරාබිය කටාරය සමග ඇති ගොඩබිම්, ගුවන් හා මුහුදු මාර්ග වසා දැමීමට කටයුතු කළේය.

මෙම ක්‍රියාමාර්ග නවතා දැමීමට නම් වහාම ඉරානය සමග පවත්වාගෙන යන රාජ්‍යතාන්ත්‍රික සබඳතා නවතා දමන ලෙසත්, හමාස් සංවිධානයේ සියලු සාමාජිකයින් කටාරයෙන් පිටුවහල් කරන ලෙසත් හමාස් සංවිධානයේ බැංකු ගිණුම් තහනම් කරන ලෙසත් මුස්ලිම් සහෝදරත්වයේ සාමාජිකයින් වහාම කටාරයෙන් පිටුවහල් කරන ලෙසත් අල් ජසීරා පුවත් විකාශනය නවතා දමන ලෙසත් කටාරයට දැනුම් දෙන ලැබිණ.

සෞදි අරාබිය ප්‍රමුඛ ඉහත කී රටවල් කටාරයට එලෙස චෝදනා කළද, සෞදි අරාබියටත් කටාරයටත් යන රටවල් දෙකටම 'ජාත්‍යන්තර ත්‍රස්තවාදයට සහය දීම' යන චෝදනාවෙන් ගැලවීමට නොහැකිය. මේ රටවල් දෙකම විවිධාකාරයේ ඉස්ලාමීය ත්‍රස්ත සංවිධාන පෝෂණය කර නඩත්තු කරයි. සෞදි අරාබිය වහබ්වාදයේ කේන්ද්‍රස්ථානයයි.

**අර්බුදයට හේතු**

කෙසේ වෙතත් පසුගිය මාස කිහිපය තුළ එක්සත් ජනපදයත් ඊශ්‍රායලයත් සෞදි අරාබියත් මෙතෙක් පවත්වාගෙන ආ සිය උපක්‍රම යම් පමණකට වෙනස් කර ඇති බව පෙනේ. ඒ අනුව මේ මොහොතේ ඔවුන් උත්සාහ කරමින් සිටින්නේ 'ජාත්‍යන්තර ත්‍රස්තවාදයට සහය දක්වන්නේය' යන චෝදනාව කටාරයටත් ඉරානයටත් එරෙහිව යොදා ගැනීමටය. ඊට හේතු ගණනාවක්ම තිබෙන්නට පුළුවන.

යුරෝපය තුළ සහ එක්සත් ජනපදය තුළ දිගින් දිගටම සිදුවන ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් එක්සත් ජනපද වැසියන් තුළ සහ යුරෝපීයයන් තුළ ඉස්ලාමීය ත්‍රස්තවාදයට එරහිව විශාල විරෝධයක් මතු වී තිබේ. ආරක්ෂක අංශද මෙම ප්‍රහාරයන් දිගින් දිගටම සිදුවීම නැවැත්වීමට අපොහොසත්ව සිටී. මෙම ප්‍රහාර එල්ල වන්නේ කලක් ඔවුන් විසින් ගොඩනගා ඇති දැඩි කළ ත්‍රස්තවාදී සංවිධාන විසින්ම බව මෙම රටවල නායකයෝ දනිති. ඉක්මනින් හෝ පසුවී ජනතාවද ඒ බව අවබෝධ කරගනු ඇත. එසේ වුවහොත් දැනටමත් ආර්ථික අර්බුදය හමුවේ පීඩා විඳිමින් සිටින යුරෝපීය හා එක්සත් ජනපද ජනතාව වත්මන් පාලකයන්ට ප්‍රබල විරෝධයක් එල්ල කරනු ඇත. මේ නිසා ඉස්ලාමීය ත්‍රස්තවාදය පිළිබඳ චෝදනාව කල්තබාම කටාරය මතත්, ඉරානය මතත් පටවා තිබීම වැදගත් වීමට ඉඩ තිබේ.

ලෝක දේශපාලන බලතුලනයද මෙම සිදුවීම්වලට අදාළව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන බව පෙනේ. මෙම කලාපය තුළ සෞදි, ඊශ්‍රායල් හා එක්සත් ජනපද බලයට එරෙහි කණ්ඩායම් ශක්තිමත්වීම වැළක්වීම මෙම රාජ්‍යයන් ත්‍රිත්වයේම පොදු අරමුණකි.

කටාරයට එරෙහිව ගත් මෙම ක්‍රියාමාර්ග හේතුවෙන් ඉරානය සමග ළඟ සබඳතාවක් ගොඩනගා ගනිමින් සිටින කටාර් රාජ්‍යය ඉන් ඉවත් කර ගැනීමට හැකිවන්නේ නම් එය සෞදි අරාබිය පැත්තෙන්ද ඊශ්‍රායලය හා එක්සත් ජනපදය පැත්තෙන්ද වැදගත්ය. අනෙක් අතට සෞදි අරාබිය මේ මොහොතේ මුහුණ පා සිටින ආර්ථික පසුබෑම හමුවේ කටාරයේ මූල්‍ය සම්පත් එරටට ගිල ගැනීමට හැකිවන්නේ නම් එයද වාසිදායක වනු ඇත.

සෞදි අරාබියත් ඊශ්‍රායලයත් එක්සත් ජනපදයත් ගල්ෆ් කලාපය තුළ ඉරානය කලාපීය බලවතෙක් ලෙස වර්ධනයවීම නොඉවසයි. ඉරානය කලාපය තුළ සිටින එකම යුදමය බලවතායි. කටාර්ය වැනි රාජ්‍යයන් ඉරානය සමග සමීප සබඳතාවයක් පවත්වා ගෙන යාම වහා නවතා දැමිය යුතුයැයි තීරණය කෙරෙන්නේ ඒ අනුවය.

මීට අමතරව කටාරය තුළ පිහිටුවා ඇති තුර්කි හමුදා කඳවුරද දැන් මොවුන්ට ප්‍රශ්නයක්වී ඇති බව පෙනේ. සිරියානු යුද්ධයේ අවසන් භාගයේදී තුර්කිය එක්සත් ජනපදයට අවනත නොවන ස්ථාවරයකට පිවිසීම මෙම නව තත්වයට හේතු වන්නට ඇත.

**අර්බුදය විසඳීමට යෝජනා**

මේ අතර ජූලි 23දා සෞදි අරාබිය එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඊජිප්තුව හා බහරේනය මතුවී ඇති අර්බුදය විසදීමට නම් කටාරය ඉල්ලීම් 13ට එකඟවිය යුතුයැයි දැනුම් දෙන ලදී. ඒ අනුව කටාරයට තීරණයක් ගැනීම සඳහා දින 10ක කාලයක් ඔවුන් විසින් ලබා දී තිබේ. කටාරය විසින් එකඟ විය යුතු යැයි පැවසෙන ඉල්ලීම් අතරට,

- ★ ඉරානය සමග සබඳතා අඩුකිරීම
- ★ අල් ජසීරා පුවත් නාලිකාව වසාදැමීම
- ★ කටාර් රාජ්‍යය තුළ ඇති තුර්කි හමුදා කඳවුර ඉවත් කිරීම ආදී යෝජනාද ඇතුලත් කර තිබේ.

එහෙත් ඊට පසු දිනම එනම් ජුනි 24වන දින කටාරය මෙම ඉල්ලීම්වලට එකඟවීම ප්‍රතික්ෂේප කළේය.

බලශක්තිය අතින් කටාරය කලාපය තුළදී දෙවැනි වන්නේ සෞදි අරාබියට පමණි. කටාරය සිය අපනයන ආදායමින් 90%ක් ම උපයාගනු ලබන්නේ ඉරානය සමග හවුලේ බෙදාගන්නා ලොව විශාලතම ස්වභාවික ගෑස් නිධිවලින් නිපදවන ද්‍රව වායුව අපනයනයෙනි. මීට අමතරව මෑතකදී කටාරය රුසියාවේ Rosneft බලශක්ති සමාගමෙහි විශාල ප්‍රාග්ධන ආයෝජනයක් සිදුකරන ලදී. මෙම අර්බුදය පැන නැගුණු මොහොතේදීම කටාර් විදේශ ඇමතිවරයා, රුසියානු විදේශ ඇමති හමුවී මතුවී ඇති තත්වය පිළිබඳව විශේෂ සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී දෙරට අතර සබඳතා තවදුරටත් ශක්තිමත් කරගැනීමට තීරණය කළේය.

මේ අනුව පෙනීයන්නේ එක්සත් ජනපදයත් සෞදි අරාබියත් ඊශ්‍රායලයත් එක්වී සැලසුම් කළ ක්‍රියාමාර්ගය අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදී ඔවුන්ටම පාරාවළල්ලක් වීමට වැඩි ඉඩකඩක් ඇති බවය. එනම් කටාරය ඔවුන්ගේ බලපෑමට අවනත නොවී රුසියාව චීනය සහ ඉරානය සමග සබඳතා ශක්තිමත් කරගනු ඇති බවය.

## ප්‍රංශය:
## නව ජනාධිපතිට ශක්තිය දී



ප්‍රංශයේ මහ මැතිවරණය 2017 ජුනි 11 සහ 18 යන දෙදින පැවත් විණි. එය පැවැත්වූයේ පාර්ලිමේන්තුවේ ආසන 577 සඳහා නියෝජිතයින් තෝරා පත්කර ගැනීමටය.

මෙම මැතිවරණයෙන් ප්‍රංශ ජනාධිපති එම්මානුවෙල් මැක්‍රෝන්ගේ ඈබ ඒරජයැ පක්ෂය සහ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය එක්වී පිහිටුවා ගත් සන්ධානය ජයග්‍රහණය කර තිබේ. මෙම සන්ධානය ලබාගත් මුළු ආසන සංඛ්‍යාව 350කි. ප්‍රංශයේ නව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව තුළ ශක්තිමත් බලයක් ලැබීම හේතුවෙන් ඔහුගේ නව ලිබරල්වාදී ප්‍රතිපත්තිය ගැටලුවකින් තොරව ක්‍රියාත්මක කිරීමට ඔහුට හැකියාව ලැබේ.

මැතිවරණයේ දෙවැනි තැනට පත්වූයේ රිපබ්ලිකන් පක්ෂයයි. ඊට ආසන 112ක් හිමිවූ අතර තෙවැනි තැනට පත් සමාජවාදී පක්ෂයට ආසන 30ක් හිමිවිය. දක්ෂිණාංශික ජාතිකවාදී පක්ෂයක් වූ ජාතික පෙරමුණට ලබාගත හැකිවූයේ ආසන 08ක් පමණි. මෙම පක්ෂයේ නායිකාව වූ ලී පෙන් ජනාධිපතිවරණයේ දෙවැනි වටයටද තේරීපත් විය.

## කියුබාව:
## ට්‍රම්ප්ගේ පළිගැනීමට ලක්ව



පසුගිය ජුනි 16වන දා එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් කියුබාවට යළි සම්බාධක පැනවීමට තීරණය කළේය. එක්සත් ජනපදයේ හිටපු ජනාධිපති බැරක් ඔබාමා සිය ජනාධිපති බලතල පාවිච්චි කරමින් ඉවත්කරනු ලැබූ ඇතැම් සම්බාධක මෙලෙස යළිත් ක්‍රියාත්මක කිරීමට ඩොනල්ඩ් ට්‍රම්ප් කටයුතු කළේය.

2014 දෙසැම්බර් 14වන දින එක්සත් ජනපද ජනාධිපති බැරක් ඔබාමා කියුබානු ජනාධිපති රාවුල් ක්‍රස්ත්‍රෝ විසින් අත්සන් කළ දෙරට අතර රාජතාන්ත්‍රික සබඳතා යළි ඇති කිරීම හා දෙරට අතර සබඳතා සාමාන්‍ය තත්වයට පත්කිරීමට අදාළ එකඟතා මේ අනුව අවලංගු කෙරේ.

## NATO:
## ආරක්ෂක වියදම් නංවා





මෙම වසර තුළදී තම ආරක්ෂක වියදම් ඉහළ දැමීමට යුරෝපීය හ්ඔධ සාමාජික රටවල් හා කැනඩාව තීරණය කර තිබේ. ඒ අනුව මේ වසර තුළදී ආරක්ෂක වියදම් ඩොලර් බිලියන 12කින් ඉහළ දැමේ.

නේටෝ සංවිධානයේ ලේකම්වරයාද පවසා ඇත්තේ, තමන් වාර්ෂික ආරක්ෂක වියදම 4.3%න් ඉහළ දමන බවයි. මේ අනුව පසුගිය වසර තුන තුළදීම නේටෝ සංවිධානය සිය ආරක්ෂක වියදම් ඉහළ දමා තිබේ. එලෙස පසුගිය වසර තුන තුළදී පමණක් ආරක්ෂක වියදම ඩොලර් බිලියන 46කින් ඉහළ දැමීමට නේටෝ සංවිධානයට අයත් රටවල් කටයුතු කර තිබේ.

# විගණකාධිපති මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව ප්‍රතික්ෂේප කළේ ඇයි?

ඕනෑම රටක මෙන්ම ලංකාවේ ද අමාත්‍යාංශ අතර ඉතා වැදගත්ම අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශයයි. රටේ සංස්ථා මූල්‍ය පාලනය අධීක්ෂණය කරනු ලබන්නේ මෙහිදීය. භාණ්ඩාගාර කටයුතු මෙන්ම, මහා බැංකුවේ කටයුතුද, අනිකුත් සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරන්නේද මුදල් අමාත්‍යාංශයටය. ඒ නිසාම මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය කෙරෙහි ඇති වගකීම, බැඳීම සුළුපටු නොවේ. සමස්ත රටේ ආර්ථිකය මෙහෙයවන ආයතනය ලෙස මුදල් අමාත්‍යාංශයට පැවරෙන වගකීම අමුතුවෙන් කිවයුතු නොවේ. නමුත්, අප දන්නා ඉතිහාසයේ පළමු වතාවට රටේ විගණකාධිපතිවරයා විසින් මුදල් අමාත්‍යාංශයේ 2016 වසරේ වාර්ෂික වාර්තාව පිළිබඳව විගණක මතයක් දැක්වීම දැක්වීම ප්‍රතික්ෂේප කර ඇත. ප්‍රතික්ෂේප කිරීමෙන් නොනැවතී දැන් ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට දන්වා ඇත. යහපාලනයේ තරම කොහොමදැයි දැන්වත් තේරුම් නොගත් ජනතාවක් සිටී නම් ඔවුන් මෙම තත්වය ගැන වඩාත් සැලකිලිමත් විය යුතුය.



මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව | වාර්ෂික වාර්තාව 2016

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department
AGDSL

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය ව්‍යාවනය**

මෙම වාර්තාවේ 2.2.ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### ජනරජයේ ශේෂපත්‍රය

විගණකාධිපතිවරයා මෙලෙස මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව ප්‍රතික්ෂේප කර විගණක මතයක් ලබාදී ඇත්තේ ඇයිදැයි දැන ගැනීම සියලු ජනතාවටම ප්‍රයෝජවත් වනු ඇත.

විගණකාධිපතිවරයාගේ ප්‍රතික්ෂේපයට පළමු හේතුව වී ඇත්තේ, "මුදල් අමාත්‍යාංශය ඒකාබද්ධ අරමුදලට අදාළ කටයුතුවල ගිණුම් වාර්තාවක් - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 වර්ෂයේ දෙසැ. 31 දිනට වූ මූල්‍ය කාර්යසාධනය" ලෙස දැක්වීමය.

මුදල් අමාත්‍යාංශයේ ඒකාබද්ධ අරමුදල "ජනරජයේ ගිණුම" නැතහොත් මුළු රටේම ගිණුමක් ලෙස දැක්වීමේ හැකියාව ඇත්තේ කවර පුද්ගලයෙකුටද? ජනරජයේ ගිණුමක් (ශේෂපත්‍රයක්) යන්නට මුදල් අමාත්‍යාංශය පමණක් අයිති නොවේ. එසේ ශේෂපත්‍රයක් මුළු රටටම ඉදිරිපත් කරන්නේ නම් එය රටේ සියලු ආර්ථික - මූල්‍ය ක්ෂේත්‍රයන්ගේ ආවරණයක් ලෙස සිදුවිය යුතුය. හුදෙක් මුදල් අමාත්‍යාංශයේ ඒකාබද්ධ අරමුදල රටේ ජනරජයේ ශේෂපත්‍රය - (මූල්‍ය වාර්තාව) ලෙස දැක්වීම අසම්පූර්ණය. උදාහරණ ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය කාර්යසාධන වාර්තාව ලෙස දක්වා ඇති මෙම ගිණුම් ප්‍රකාශනය සඳහා රටේ පළාත් සභාවල මූල්‍ය වාර්තා අදාළ කරගෙන නොමැත. පළාත් සභා අත්හැර "ජනරජයේ" මූල්‍ය ප්‍රකාශයක් හදන්නේ කෙලෙසදැයි ඕනෑම කෙනෙකුට ප්‍රශ්න කළ හැකිය. බෙදුම්වාදී ප්‍රතිපත්තියේ සිට කටයුතු කරන දේශපාලන පක්ෂ හා විචාරකයින් හට මේ අනුව "ශ්‍රී ලංකා ජනරජය" යන්නට පළාත් සභා අදාළ කර නොගැනීම බෙදී වෙන්වීමට දර්ශකයක් ලෙස ගෙනහැර දැක්වීමටද පුළුවන.

### ණය, වත්කම් කිරීම

මුදල් අමාත්‍යාංශයේ ගිණුම ජනරජයේ (ලංකාවේම) ගිණුම ලෙස දැක්වීමට යාමෙන් ආණ්ඩුව සිදුකළ දේශපාලන වරද ඊට පසු ඔවුන් ගිණුම්කරණ ලෙසද සිදු කර ඇත්තේ ඉලක්කම්වලින් ආර්ථිකය පිම්බීමට උත්සාහ දැරීමෙනි. ආණ්ඩුවේ සමස්ත රාජ්‍ය ණය ගැනීම එකතුව (රු. 8,793,959,329,494) එනම් රු. බිලියන 8793ක් ආණ්ඩුව ගිණුම්ගත කර ඇත්තේ, "ණය ගැනීම මත ආයෝජන" ලෙස වත්කමක් ලෙස සලකා කටයුතු කර ඇත. නමුත් එය ප්‍රයෝගිකව කිසිසේත්ම සිදු නොවන දෙයකි. වත්කම් - (යන්ත්‍ර, සූත්‍ර, උපකරණ, වැනි) මිලදී ගැනීමක් මෙම ණය මගින් සිදුකළ විටකදී එම ණය මගින් වත්කමක්ද ජනිතවේ. නමුත් සෑම ණය මුදලක්ම වත්කම ජනිත කිරීමට සිදුකල ණය ගැනීම නොවේ.

මුදල් අමාත්‍යාංශය මෙම ණය වත්කමක් (ආයෝජන) ලෙස දක්වා ඇති රු. බිලියන 8793 තුළ ඇති අන්තර්ගතය සොයා බැලීමේදී මේ බව හොඳින් පැහැදිලි වේ. ඉන් බිලියන 792ක් භාණ්ඩාගාර බිල්පත්වලින් ලැබීමය. බිලියන 3560ක් බැඳුම්කරවලින් ලබා ගත් ණය වේ. ඊට අමතරව රුපියල් ණය, තෙල් සංස්ථාවට තෙල් මිලදී ගැනීමට නිකුත් කළ බැඳුම්කර හා විදේශීය ණය ගැනීම රු.මිලියන 3676ක් ඇතුලත්ය.

මෙසේ පසුගිය වසරේ ණය ගැනීම තුළ බැඳුම්කර මගින් ලබාගත් රු. බිලියන 10ක් (කුප්‍රකට බැඳුම්කර වංචාවේ අගය) ලබා ගන්නේ කලින් ලබාගෙන තිබූ ණය වාරිකවලට අදාළව පොලී ගෙවීමට බව කවුරුත් දන්නා සත්‍යයකි. ප්‍රශ්නය එය ණයක් බව සැබෑ වුවත් පොලී ගෙවීම වත්කමක් වන්නේ කෙලෙසද යන්නයි.

විගණකාධිපතිවරයා පවසන පරිදි ආපසු ගෙවන ලද ණය වාරික අඩු කිරීමෙන් පසු ශේෂය වත්කම ලෙස තීරණය කිරීම සාවද්‍ය හෙළිදරව් කිරීමකි. මේ වත්කම ලෙස විවිධ ණයවලින් කරන ව්‍යාපෘතිවල පරිපාලනමය ගෙවීම්ද අඩංගුය. උදාහරණ ලෙස චීන සමාග මකින් ඉදිකිරීමකට ණයක් ගන්නේ නම් ඉදිකිරීම (පාලමක්, පාරක්) අපගේ වත්කමක් වුවද, එම ණයවලින් කොටසක් ඉදිකිරීමේ වැටුප්, කළමනාකරණ ගාස්තු ආදිය ලෙස දැරිය හැකිය. ඒ සියල්ල වත්කම් ලෙස දැක්වීම යථාර්ථවාදී නැත. සාමාන්‍ය පිළිගැනීම අනුව ණයවලින් 33%ක් පමණ ප්‍රමාණයක් වත්කම් වන අතර, ඉතිරිය බොහෝවිට කලින් ගත් ණයවල පොලී ගෙවීම සහ විවිධ පරිපාලන වියදම් වේ. ඒ අනුව මෙම බිලියන 8793න් 33% 40% ක් පමණක් වත්කම්වලට අදාළ වන අතර අනිත් සියලු ණය වත්කම් ලෙස පෙන්වා නැති ආර්ථික මැවීමක් කරනු ලැබ ඇත.

### නැති වත්කම ඇති කිරීම

මුළු ණය අගයම ජනරජයේ ශේෂපත්‍රය නමින් රටටම අදාළ ශේෂපත්‍රයක් ලෙස ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශයට පමණක් අදාළ වන ගිණුමක මෙලෙස වත්කමක් ලෙස පෙන්වීමේ ආණ්ඩුවේ දේශපාලන වුවමනාව කුමක්ද? ආණ්ඩුවට එසේ නොකර ණය, ණය ලෙසමත්, වත්කම ලෙස තිබෙන ප්‍රමාණය සැබෑ ලෙසමත් දැක්වීමට නොහැකි වූයේ මන්ද?

ආණ්ඩුව තම ශේෂපත්‍රය ණයවලින් බිලියන 8793කින් පුම්බා පෙන්වන විටදීත්, රටේ මුළු වත්කම් ලෙස දැක්විය හැකි වූයේ බිලියන 9881 ක් පමණි. ඒ අනුව වැඩි වී ඇත්තේ (ණයට වඩා වත්කම්) රු. බිලියන 1088 කි. එම 1088 වත්කම් ලෙස දක්වන විටදී සැබෑ ගිණුම වන මුදල් අමාත්‍යාංශයේ ඒකාබද්ධ අරමුදල දැක්වෙන්නේ සෘණ බිලියන 187ක් ලෙසිනි. ඒකාබද්ධ අරමුදල යනු රජයේ සේවකයින්ට වැටුප්, සහනාධාර, විශ්‍රාම වැටුප්, ආදිය ගෙවනු ලබන රජයේ අරමුදල් මගින්/ බදු මගින් ආදායම ජනිත කරගන්නා අරමුදලයි. එම අරමුදල සෘණ වන්නේ නම්, එයින් පැහැදිලි වන්නේ රජයේ වැටුප් ගෙවීමටවත් මුදල් නොමැති බවයි. එසේ ඇති ජනරජයක ශේෂ පත්‍රයක් පුම්බා පෙන්වීමට ණය වත්කම ලෙස යොදවා ආණ්ඩුව විසින් නැති වත්කම් මවා පෑමක් කර ඇත. රජයේ විගණකාධිපතිවරයා මෙම ගිණුම සත්‍ය ගිණුම ලෙස පිළිගැනීමට ලක් කළ නොහැකි යැයි බැහැර කර ඇත්තේ ඇයි දැයි ඔබට දැන් පැහැදිලි වනු ඇත.


### ආණ්ඩුවේ කයිවාරු සහ යථාර්ථය

යහපාලන කඩතුරාවට මුවාවෙමින් ආණ්ඩුව ජනතාවට මර්දනය - පීඩනය ගෙන ඒම අඛණ්ඩව සිදු කරන අතර, ආර්ථිකය පිළිබඳව ඇත්තේ කයිවාරු මිසක සැබෑවට ක්‍රියාවට නගන වැඩපිළිවෙලක් නොවන බව ගතවූ අවුරුදු 2 1/2ක කාලය තුළ හොඳින් පෙන්නුම් කර අවසන්ය.

ආණ්ඩුව ආර්ථිකය ගැන ප්‍රකාශ නිකුත් කරන්නේ, නව ලිබරල් ආර්ථික සංකල්පවල හොඳම වචන නිර්වචන භාවිතා කරමින්ය. සමාජ වෙළඳපොළ ක්‍රමය, නවීන තාක්ෂණය, අගය එකතු කිරීම, අපනයන ප්‍රවර්ධනය, රැකියා දශ ලක්ෂය, නිවාස පන්ලක්ෂය ආදී සුන්දර වාක්‍ය කාණ්ඩ ඒ අතර වේ. මූලික අඩුපාඩු හේතුවෙන් විගණකාධිපතිවරයා ප්‍රතික්ෂේප කරන ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශයේ 2016 වාර්තාව මගිනුත් දත්ත ලෙසද පෙන්නුම් කර ඇත්තේ, ආර්ථිකයේ මුළුමනින්ම සිදුවෙමින් තිබෙන බිඳ වැටීමය. 2016 මුදල් අමාත්‍යාංශ වාර්තාවේ උපුටා ගැනීම් සටහන ඒ බවට සාක්ෂි සපයයි. (සටහන (1)) කුමන සුරංගනා වාක්‍යවලින් ප්‍රකාශ කළද යථාර්ථය අමිහිරි ආර්ථික ඛේදවාචකයකට රට ගමන් කරන බවය. ඒ තවදුරටත් නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තීන් වලංගු නොවන බව පමණක් නොව සැබෑ ජනතාවාදී විකල්ප ආර්ථික - දේශපාලන සමාජ පරිවර්තනයක අවශ්‍යතාවයද අවධාරණය කරවීමකි.

ඇ. ඩො. මිලියන

| අපනයන කඩා වැටීම (ආදායම) | 2014 | 2016 |
|---|---|---|
| තේ | 1628 | 1269 |
| රබර් | 45 | 33 |
| පොල් | 356 | 366 |
| අනෙකුත් කෘෂි අපනයන | 511 | 489 |
| මුහුදු ආහාර | 253 | 170 |
| | **2794** | **2326** |
| කාර්මික අපනයන කඩාවැටීම | 2014 | 2016 |
| රෙදිපිළි ඇඟලුම් | 4930 | 4884 |
| රබර් නිෂ්පාදන | 890 | 768 |
| ඛනිජ හා රසායනික නිෂ්පාදන | 472 | 413 |
| මැණික්, දියමන්ති, ස්වර්ණාභරණ | 394 | 274 |
| අනෙකුත් කාර්මික අපනයන | 944 | 960 |
| | **8262** | **7940** |
| | | |
| මුළු අපනයන | 11,130 | 10,310 |
| මුළු ආනයන | 19,417 | 19,400 |
| වෙළඳ හිඟය (වෙළඳ ශේෂ පරතරය) | **-8287** | **-9090** |



"ජීවිතයට ප්‍රශ්න එන්නේ ඔබ විනාශ කිරීමට නොවේ. ඔබ තුළ සැඟවුණු ශක්තීන් සොයා ගැනීම සඳහා ඔබට උදව් කිරීමටය."

**අබ්දුල් කලාම්**

# හීන බොඳ කරන හිත ලෙඩ කරන



# ඇත්ත දකින තුරු...

සෑම යුවතියක්ම තමාගේ අනාගතය පිළිබඳ සොඳුරු හීන දකී. ළමා වියෙන් පසුව, නැතහොත් තම අධ්‍යාපනයෙන් පසුව යුවතියන්ගේ ප්‍රධාන බලාපොරොත්තුවක් වන්නේ, තමාගේ අධ්‍යාපනයට සරිලන රැකියාවක් සොයා ගැනීමය. ඇතැම් විටෙක තමාගේ අනාගතය තීරණය වන ඒ සොඳුරු බලාපොරොත්තුව ඉටු කර ගැනීමට හැකි වන්නේ යුවතියන්ගෙන් කීයෙන් කී දෙනාටද?

අප රට තුළ බහුතරයක් ස්ත්‍රීන්ට රැකියාවක් සොයා ගැනීම ඉතා දුෂ්කර කාර්යයක් බවට පත්ව ඇති බව ආණ්ඩුවේ සංඛ්‍යාලේඛනවලින්ම පෙන්නුම් කරයි. 2016 වසර සඳහා නිකුත් කළ මහ බැංකු වාර්තාවට අනුව අපේ රටේ ජනගහනය ආසන්න වශයෙන් මිලියන 21කි. එයින් වයස අවුරුදු 15 සහ ඊට වැඩි, වැඩ කළ හැකි වයසේ ජනගහනය මුළු ජනගහනයෙන් 74.8%කි. (මෙයින් 16.5%ක් වයස අවුරුදු 60 සහ ඊට වැඩි, වැඩිහිටි ජනගහනය වේ.) එම වාර්තාවට අනුව 2016 වසරේ, වයස අවුරුදු 15 සහ ඊට වැඩි, ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය නැතහොත් රටේ ශ්‍රම බලකාය ආසන්න වශයෙන් මිලියන 8ක් වන අතර ඉන් රටේ සමස්ත ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 54%කි. එයින් ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 35.9%ක් වන අතර පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 75.1%කි.

රටේ ආර්ථික සංවර්ධනයට සෘජුව බලපානු ලබන ශ්‍රම වෙළෙඳපොළේ ගුණාත්මක බව මනිනු ලබන එක් දර්ශකයක් වන්නේ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයයි. මෙරට තුළ නිසි සැලසුම් සහගත ආර්ථික ප්‍රතිපත්තියක් නොමැති වීම මෙම අනුපාතිකය ඉතා පහළ අගයක පැවතීමට ප්‍රධාන සාධකයක් වී ඇත. ස්ත්‍රීන් ආර්ථිකයට දායක කර ගැනීම සඳහා පුළුල් දැක්මක් සහිත ආර්ථික වැඩපිළිවෙළක් පැවතුණු හා පවතින කිසිදු ආණ්ඩුවකට තිබී නොමැත. පසුගාමී ධනේශ්වර ආණ්ඩුවලට හා දේශපාලන පක්ෂවලට ස්ත්‍රීන්ව මතක් වන්නේ මැතිවරණයක් ළං වූ විට හා කාන්තා දින සැමරුම් වැනි අවස්ථාවන්වලදී පමණය. එවිට විවිධ සුරංගනා කතා, අලංකාර වචන යෙදූ පොරොන්දු දෝරේ ගලා යන්නේ ස්ත්‍රීන්ගේ මනස් වල්මත් කරමිනි.

මෙරට ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය වසර ගණනාවක සිට පහළ මට්ටමක පවතී. අපේ ආසියාතික සංස්කෘතියට අනුව නිවස තුළ වගකීම් රැසක් දැරීමට ස්ත්‍රීන්ට සිදු වී ඇත. ආහාර සැකසීම, ගේ දොර පිළිවෙළකට තබා ගැනීම, දරුවන් රැකබලා ගැනීම වැනි කාර්යයන් ස්ත්‍රීන් විසින් අනිවාර්යයෙන් කළ යුතු ඒවා බවට අනීතිකව පවරා ඇත. මේ සියලු කාර්යයන් අතරතුර දවසේ පැය 4ක් හෝ 5ක් වෙන් කරගනිමින් කිසියම් රැකියාවක නිරත වීමට මෙරට බොහෝ ස්ත්‍රීන්ට හැකි වුවත් ඔවුනට එවැනි රැකියා අවස්ථා අප රට තුළ නොමැත. පාලකයන් ස්ත්‍රීන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට කොතෙක් කෑමොර දුන්නද නිවෙස් තුළ හෝ පිටත සිට එලෙස අර්ධ කාලීනව කළ හැකි රැකියා අවස්ථා ඇති කරලීමට කිසිදු ආණ්ඩුවක් ක්‍රියා කර නැත. එමෙන්ම නිවසේ සිට රැකියා සඳහා යාමට ඊමට හොඳ මට්ටමේ ප්‍රවාහන සේවයක් නොමැති වීමත් වගේම සුරක්ෂිත බවක් නොමැති වීමත් යන සියලු කාරණා විසින් බහුතරයක් ස්ත්‍රීන්ගේ රැකියා කිරීමේ අයිතිය උදුරාගෙන ඇත.

එසේ රැකියාවක් කිරීමේ අයිතිය උදුරා ගැනීම විසින් බොහෝ දෙනෙකුගේ ජීවිතවල සතුටද උදුරාගෙන ඇත. අපේ ජීවිත හා බැඳී පවතින සමීප සබඳතා අපව සතුටින් තැබීමට මූලික වනවා සේම ආර්ථික ස්වාධීනත්වයද අපේ ජීවිතවල සතුට හා පෞරුෂත්වය පවත්වා ගැනීමට හේතු වනු ඇත. එලෙස අප තුළ හොඳ මානසික සෞඛ්‍ය තත්වයක් නොපවතින විට අප තුළ හොඳ කායික සෞඛ්‍යයක් පවතින්නේද නැත. එවිට ආතතිය, විශාදය, දියවැඩියාව, කොලෙස්ටරෝල්, අධි රුධිර පීඩනය, තරබාරුව, කෘෂ වීම වැනි බෝ නොවන විවිධ ලෙඩ රෝගයන්ට ගොදුරුවීමේ අවදානමද වැඩි වනු ඇත.

ස්ත්‍රීන් ලෙස මෙම දීර්ඝ ඉතිහාසය තුළින් අප තේරුම් ගත යුත්තේ, පසුගාමී ධනපති සමාජය තුළ තවදුරටත් අපේ කිසිදු අයිතියක් පූර්ණ ලෙස තහවුරු නොවන බවය. සමාජ සුරක්ෂිත බවක් ඇති නොවන බවය. හොඳ මානසික හා කායික සෞඛ්‍යයක් හිමි නොවන බවය. ඉදින් අප කළ යුත්තේ, ක්‍රමානුකූලව ජීවිතයේ සතුට අහෝසි වෙමින් අපෙක්ෂාභංගත්වය තුළ ජීවිත සිරව යාමට නොදී මේ ධනපති ක්‍රමය වෙනස් කර සාධාරණ යහපත් සමාජයක් ගොඩ නැගීමට පෙරමුණ ගැනීමය.

## සිව්දෙසින

### ඉන්දීය ආණ්ඩුව ගැබිණි මව්වරුන්ට දුන් උපදෙස්



සියලු මාංශවලින්, බිත්තර හා රාගික සිතුවිලිවලින් ගැබිණි මව්වරුන් වැළකිය යුතු යැයි ඉන්දීය ආණ්ඩුව පොත් පිංචකින් උපදෙස් දී ඇත.

ඉන්දියාවේ මාතෘ සෞඛ්‍යය සලකා බලන විට මෙය විකාර උපදෙසක් බව පවසන වෛද්‍යවරු මන්දපෝෂණය හා රක්තහීනතාවය බහුල වීමේ හේතුවෙන් ඉන්දියාවේ මාතෘ මරණ ප්‍රතිශතය ලෝකය තුළ ඉහළ අගයක් බවට පත්ව තිබියදී මෙවැනි උපදෙසක් ලබා දීම ඉතා භයානක බවද පවසති. ඉතාම පහසුවෙන් ලබාගත හැකි ප්‍රෝටීන් ජනක ආහාරය බිත්තර බවත් ගැබිණි සමය තුළ ලිංගිකව එක්වීමෙන් හානියක් සිදු නොවන බවත් වෛද්‍යවරුන් පවසති.

ඉන්දියාවේ හින්දු ජාතිකවාදී, භාරතීය ජනතා පක්ෂයේ ආණ්ඩුව සතු නිර්මාංශ ප්‍රතිපත්තිය ව්‍යාප්ත කිරීම සඳහා මෙම උපදෙස් ලබා දී ඇති බව විචාරකයෝ පෙන්වා දෙති.

### රජ කුමරියන්ට අත්හිටවූ සිර දඬුවම්...



තම මෙහෙකරුවන්ට පහත් ආකාරයට සැලකීම හා මිනිස් ජාවාරම සිදු කිරීමේ චෝදනාවන්ට වරදකාරියන් වූ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රජ කුමරියන් 8 දෙනෙකුට දඬුවම් නියම වී ඇත.


බ්‍රසල්ස් නගරයේ අධිකරණයක වසර 10කට ආසන්න කාලයක් පැවැති නඩු විභාගයකින් අනතුරුව මෙම කුමරියන්ට 15 මසක අත්හිටවූ සිර දඬුවමක් හා එක් කුමරියකට ඩොලර් 185 000ක දඩ මුදලක් නියම කෙරුණි.

2008 වසරේදී සිදු කළ සංචාරයකදී මෙම කුමරියන් මෙහෙකරුවන් 20 දෙනෙකු රැගෙන ගොස් ඇති අතර ඔවුන්ට ලැබී ඇත්තේ වහලුන්ට සමාන සැලකිලිය.

මෙම නඩු විභාගය සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රජ කුමරිය හා ඇයගේ දූ කුමරියන් 7 දෙනා පෙනී සිට නැත.

> **“බාහිර ආධාර බලාපොරොත්තු නොවූ මම වාසනාව ගැනද විශ්වාස නොකළෙමි. ඒ අතර මගේ චරිතයෙහි අධිෂ්ඨාන සහගත මුරණ්ඩු බවක් කෙමෙන් වර්ධනය විය. මගේ ජීවිතය මට අසීරු වන තරමට මගේ චරිතය ශක්තිමත් වූ අතර මගේ බුද්ධියද වර්ධනය වූ සැටිත් මට දැනිණි. පරිසරයට මිනිහෙක් කොතරම් ඔරොත්තු දෙන්නේද එතරම් දුරට ඔහු වර්ධනය වන බව තරුණ වියේ සිටම මම පසක් කර ගතිමි.”**
>
> **මක්සිම් ගෝර්කි**

## කවියෙන් අවියක්ම වෙමි



**සංහිඳ ළඟ කෙම්මුරට කොළ එල්ලාපු
දෙපෝදාට පිරුවට හැඳ පින් පුරපු
වෙලේ, වැවේ බැස අල, කොළ අවුලාපු
මව්වරු දුටිද, හිත සතුටින් මිය යාපු**

**ළමැදේ කිරි සිහින බොඳ වී මිය ඇදුණී
පිය හිමි රහසින්ම අන් සරණක බැඳුණී
පැල දොරින් බැස සෙනෙහස වල් වැදුණී
කැළණිය පුරෙන් කොහි වැදුනිද සැළලිහිණී**

**සෙනසුරු පිරිනැමූ බටකොළ රසට කකා
ඇල්මෙන් උගනීද නොදැනම පුංචි එකා
අඳුරෙම මවුන්, දිදුලන තරු පොකුරු කකා
මහ මඟ හිඳ ලියයි යළි, ජීවිතය මකා**

**දරු දුක නිසා සා ගින්දර මග හැරුනී
අග හිඟ කුර ගගා රහසෙම ගෙට ඇදුනී
මල් හී සර වැදුනු පපුතුර ගිනි ගැනුනී
නොහොඳම මිසක හොඳ නැතිවද හිමි සඳුනී?**

**විඳවනු මිසක කවදාවත් විඳිනු බැරී
දෙව්ලොව පැතූ මුත් ලද නිරයකට සරී
සිටියත් ඉපිද ඉපිදී යළි යළිත් මැරී
ළඳුනට කොහිද නිසි ලෙස යුතුකමක් කෙරී**

**බිරිඳට, මවට, සොහොයුරියට සතුට හිමී
යුගයක් පිණිස, දුක් දොම්නස් ඉවත ලමී
ඒ ලොව දිනන පා වෙත හද බැතින් නැමී
අවියක් ලෙසින් කවියෙන් ශක්තියක් වෙමී**


දැනුම, සමාජය හා චින්තනය 18

# තර්කනයේ චින්තනය හා අතාර්කික චින්තනය...



"සතුරා අපට වියරු ලෙස පහර දෙන්නේ නම් ද, එකම එක යහගුණයක් හෝ නැතිව, හොඳටම කළු කොට අප සිත්තම් කරන්නේ නම්ද, එය වඩාත් හොඳය. අප සතුරාත් අපත් අතර පැහැදිලි වෙන්කිරීමේ ඉරක් ඇඳ තිබෙන බව පමණක් නොව, අප අපේ වැඩවලදී බොහෝ දේ මුදුන්පත් කර තිබෙන බවද එයින් පෙනී යයි."

**මාඕ සේතුං**
**තෝරාගත් ලිපි**
**143 පිට**




21වැනි සියවසේදී පවා අප ජීවත්වන සමාජය තුළ බොහෝ දෙනා කටයුතු කරන්නේ, සත්‍යය තෝරා බේරා ගැනීමට නොහැකි තත්වයකය. එහි බරපතළම කරුණ වන්නේ, බොහෝ මිනිසුන් සත්‍යය ප්‍රතික්ෂේප කරමින් අසත්‍යයම වැළඳ ගැනීමය. අපගේ චින්තනය තුළ සත්‍යය පරාවර්තනය වීමට නම් අප තාර්කික විය යුතුය. මිනිසා වානරයාගෙන් වෙනස්ව වර්ධනය වීමේදී මිනිසාත් වානරයාත් වෙන් කොට හඳුනා ගැනීමට උපකාරි වූ ප්‍රධාන බෙදුම් රේඛාව වූයේ මිනිසාට ශ්‍රම ශක්තිය තිබීම, භාෂාවක් කථා කිරීමේ හැකියාව හා තාර්කික චින්තනයක් සතුවීමය. එහෙත් බොහෝ මිනිස්සු මෙම තාර්කික චින්තනය අතාර්කිකත්වය තුළම තබා මිත්‍යාවන් තුළ, අසත්‍ය ප්‍රවෘත්ති තුළ, වැරදි උපකල්පන හා නිගමන තුළ ගිලී සිටී.

කිසියම් නව සත්‍යයක් මිනිසුන් තුළ තහවුරු කිරීමට විශාල වෙහෙසක් දැරීමට සිදු වුවද ඕනෑම බොරුවක් එක් නිමේෂයකදී මිනිසුන් තුළ තහවුරු කිරීමට හැකිය. ඒ මිනිසුන් තවමත් අතාර්කිකත්වය තුළ ජීවත්වන නිසාය. බොහෝ මිනිසුන් තම මොළයේ තර්කනයට අදාල ප්‍රශ්නය පාවිච්චියට ගන්නේම නැත. මේ නිසා බොරුවලට තටු මැවී පියඹා යන ලොවක සත්‍යයට සිදුව ඇත්තේ ඉබි ගමනින් යාමටය.

### ප්ලාස්ටික් සහල්

පසුගිය දිනවල ලංකාවේ මුහුණු පොත හරහා බරපතළ ප්‍රවෘත්තියක් සුනාමියක් සේ පැතිරී ගියේය. ඒ වෙළඳපොළට ප්ලාස්ටික් සහල් පැමිණ ඇති බවයි! මෙම ප්‍රවෘත්තිය පළවීමත් සමග කිසිදු තර්කනයකින් තොරව විචාර බුද්ධියෙන් තොරව බොහෝ දෙනා බියට පත්ව අදහස් පළකරනු දකින්නට ලැබුණි. ප්ලාස්ටික් තැම්බීමට හෝ ආහාරයට ගැනීමට නොහැකි බව නොසිතා, තර්ක නොකරම ඉහත අසත්‍ය ප්‍රවෘත්තියට බොහෝ දෙනා රැවටුන බව පැහැදිලිය. මෙය සිහිපත් කරන්නේ කුඩා කල අප අසා තිබූ බෙලි ගෙඩියක් වැටුණු විට මෙම ශබ්දයට බියවී අහස කඩාවැටෙන්නේ, යයි කෑගසමින් දිවගිය හාවාගේත් ඒ පසුපස දිවගිය අනෙක් මෝඩ සතුන්ගේත් කථාවය. එම කථාව කුඩා කාලේ උගන්වන්නේද විමසා නොබලා කවුරුත් කී නිසා කිසිවක් විශ්වාස නොකළ යුතු බව උගැන්වීමටය. එහෙත් අභාග්‍යය නම් එවැනි කථා උගන්වන අතර පවා ප්ලාස්ටික් සහල් වැනි මිත්‍යාවන්ට මිනිසුන් ගොදුරු වීමය.

පසුගිය කාලයේ වරක් කතරගම දෙවියන් කතරගම දේවාල භූමියේදී පෙනීසිටින්නේය යන පැතිරුණු ප්‍රවෘත්තිය නිසා දස දහස් ගණන් මිනිසුන් කතරගම ගොස් විශාල වාහන තදබදයකට හා අපහසුතාවයන්ට මුහුණදී කිසිවක් නොදැක ආපසු එනු අපි දැක්කෙමු. ලංකාවේ ජනතාව කෙතරම් අතාර්කිකද කෙතරම් විචාර බුද්ධියෙන් තොරද යන්න පිළිබඳ ඊට වඩා වෙනත් නිදසුන් අවශ්‍ය වන්නේ නැත. මෙලෙස පහසුවෙන් රවටනු හැකි ජනතාවකට, චින්තනය තුළ තර්කනය නැති ජනතාවකට රටක් ප්‍රගතිය කරා ගෙනයා හැකිද? ගැටලුව එයයි.

### දෙවියන් හා කඟවේනා

පසුගිය දිනවල කිසියම් ප්‍රකාශනයක දෙබසක් පළවී තිබුණි. එහිදී එක් පුද්ගලයෙක් අනෙකාගෙන් මෙසේ විමසයි. "ඔබ දෙවියන් විශ්වාස කරනවාද?" "ඔව්" යයි අනෙකා පිළිතුරු දේ. ඊළඟට දෙවෙනි ප්‍රශ්නය මෙසේ අසයි. "ඔබ කඟවේනා විශ්වාස කරනවාද?" "නැහැ මම එහෙම එකෙක් දැකල නැහැ" ඔහු පිළිතුරු දෙයි. මෙයින් කියවෙන සත්‍යය කුමක්ද? කඟවේනා නමින් සතෙක් ඇත්තට ජීවත් නොවේ. එම සතා කල්පිතයකි. පිළිතුරු දෙන මිනිසා නිවැරදිව ඔහු එවැනි සතෙක් නොදුටු නිසා එවැන්නෙක් විශ්වාස නොකරන බව කියයි. එහෙත් ඒ මිනිසාම දෙවියන් විශ්වාස කරයි. තමා දෙවියන් විශ්වාස කරන්නේ දෙවියන් නොදැක තිබියදීය යන්න ඔහු කල්පනා නොකරයි. මිනිසුන්ගේ චින්තනය අතාර්කික වීමේ ප්‍රතිඵලය එයයි. මන්ද කඟවේනා, මකරා මෙන්ම දෙවියන්ද මිනිසුන් විසින් සිතින් මවා ගත් කල්පිතයන් වන බැවිනි.

ජනතාවගේ චින්තනය අතාර්කිකව පැවතීමේ වාසිය ලැබෙන්නේ කාටද? එය සමාජ සංවර්ධනයට වාසි නොවේ; බාධාවක් වේ. මිනිසාගේ අතාර්කික චින්තනයෙන් ඵල ලබන ප්‍රධාන කණ්ඩායම නම් ධනපති දේශපාලන නායකයින්ය. ඒ,

> ඔවුන් දෙන ඕනෑම පොරොන්දුවක්, ඔවුන් කියන ඕනෑම බොරුවක් විශ්වාස කරන ජනතාවක් සිටීම හා එවැනි ජනතාවක් පවත්වාගෙන යාම ධනපති ක්‍රමයේ වුවමනාව වේ. එබැවින් ධනවාදී දේශපාලනය ජනතාව අතාර්කික වන තරමට කැමතිය. එම අතාර්කිකකම තුළ ජනයා ගිල්වා තිබීමට හැම විටම ධනවාදී දේශපාලකයින් කටයුතු කරන අතර ඔවුහුද මිත්‍යාවලම ගිලී සිටිති.

තර්කයෙන් තොර මිනිසා රවටා බලය ගැනීම ඔවුන්ට පහසු බැවිනි. ඔවුන් දෙන ඕනෑම පොරොන්දුවක්, ඔවුන් කියන ඕනෑම බොරුවක් විශ්වාස කරන ජනතාවක් සිටීම හා එවැනි ජනතාවක් පවත්වාගෙන යාම ධනපති ක්‍රමයේ වුවමනාව වේ. එබැවින් ධනවාදී දේශපාලනය ජනතාව අතාර්කික වන තරමට කැමතිය. එම අතාර්කිකකම තුළ ජනයා ගිල්වා තිබීමට හැම විටම ධනවාදී දේශපාලකයින් කටයුතු කරන අතර ඔවුහුද මිත්‍යාවලම ගිලී සිටිති.

එසේම ධනවාදය තුළ බොරුවෙන් ජීවත්වන දෛවඥයින්, ගුප්ත විද්‍යාවන්හි නිරත වන්නන්, යන්ත්‍ර මන්ත්‍ර හදි හූනියම් කරන්නන්, දේවාරූඪයෙන් ශාස්ත්‍ර කියන්නන් වැනි සියලු දෙනා තම ජීවිකාව ගැටගසා ගන්නේද ජනතාව තුළ පවතින මෙම අතාර්කික චින්තනය උපයෝගිකර ගෙනය. එය ඔවුන්ගේ ජීවිකාවට පහසුවක් නිසා ඔවුහු දිගටම සමාජය තුළ අතාර්කිකත්වය පවත්වා ගැනීමට උත්සාහ කරති. එසේම දෙවියන්ගේ ආවතේවකරුවන් ලෙස පෙනී සිටින 'දේව ඒජන්තවරුද' මෙයටම අයත් කණ්ඩායමකි. දෙවියන් ලවා විවිධ වැඩ කරවා දීමේ කොන්ත්‍රාත්තුව මගින් ඔවුහු මුදල් උපයති. එය තම ජීවිකාව කර ගනිති. ඒ නිසා ඔවුන්ද චින්තනයේ අතාර්කික බවට කැමතිය.

මෙයට අමතරව අතීත සම්ප්‍රදායන්ට යටවීම, ගතානුගතික බව හා විද්‍යාව පවා දාර්ශනිකව ඉගෙන නොගත් අයද, මෙලෙස මිත්‍යාවන්ට යටවෙති. සමහර ධනේශ්වර විද්‍යාඥයෝ සහ වෛද්‍යවරු වැනි අයද මෙලෙස අතාර්කිකව කල්පනා කරන අවස්ථා තිබේ. කෙසේ වෙතත් මිනිස් චින්තනයේ අතාර්කිකත්වය හා විද්‍යාවට එකට පැවතිය නොහැකි අතර එය එසේ වූ විට සිදුවන්නේ විකෘතියකි.

### තර්කනයේ චින්තනය හා විද්‍යාව

විද්‍යාව හැම විටම තර්කනය මත රඳා පවතින අතර තර්කනය මගින් සත්‍ය අසත්‍ය වෙන්කර ගැනීමට අපට උගන්වයි. විද්‍යාව පදනම්ව පවතින්නේ විශ්වාසයන් මත නොවේ. සංස්ලේෂණ - විශ්ලේෂණ, පරීක්ෂණ, නිරීක්ෂණ, නිගමන අද සත්‍ය සොයාගැනීමේ තර්කානුකූල විධික්‍රම මගින් එය පවතී. මිනිසාගේ චින්තනය තුළ සත්‍යය පරාවර්තනය වීමට නම් විද්‍යාත්මකව සිතා තාර්කික චින්තනයක් ඇතිකර ගත යුතුය. "සියල්ල සැක කරනු" යයි මාක්ස් වරක් කෙටියෙන් පැවසුවේ මෙම සත්‍යයය. යමක් එක්වර පිළිනොගෙන සැක කරන පුද්ගලයා එම සැකය හැර ගැනීම සඳහා අදාළ සිද්ධිය හෝ ප්‍රවෘත්තිය අධ්‍යයන කොට තාර්කිකව එය සත්‍යද අසත්‍යද යයි නිගමනය කර ගනී. චින්තනය තාර්කික හා විද්‍යාත්මක වන්නේ එවිටය. එවැනි ජනතාවක් රැවටීමට හෝ මුලා කිරීමට නොහැක.

මිනිසා ස්වභාවයෙන්ම කථාන්දර ඇසීමට මෙන්ම කථාන්දර කීමටද කැමැතිය. ඒ අනුව ඔහු නිර්මාණශීලී ලෙස විවිධ කථාන්දර ගෙතුවේය. ඒ කථා බොහොමයක් අද්භූත ඒවා විය. ඒවා පරපුරෙන් පරපුරට පැවත ආවේය. දැනුදු තිබේ. ඒවා විනෝදය හා වින්දනය වෙනුවෙන් ගොතන කථා ලෙස සලකා පරිහරණය කරනවා වෙනුවට මිනිසා තමන් ගෙතූ කථා සත්‍ය ලෙස විශ්වාස කිරීමටද පෙලඹුණේය. විද්‍යාව නොතිබූ අවදියක මෙය ප්‍රබල විය. මෙම ඓතිහාසික ස්වභාවය නිසා අද පවා මිනිසුන් මිත්‍යා ප්‍රබන්ධවලට, අද්භූත කථාවලට කැමැත්තක් දක්වන අතර ඒවා දෙවරක් නොසිතා පිළිගැනීමටත් ඊට තව තවත් දේ එකතුකරමින් පැතිරවීමටත් රුචිකත්වයක් දක්වයි.

එහෙත් ඉන් සිදුවන්නේ, මිනිසා නොදැනුවත්වම තම චින්තනය අතාර්කික එකක් බවට පත්කරගැනීමය. එවිට රැවටීමේ සීමාවක් නැතිවේ. මුලාවීමේ සීමාවක් නැතිවේ. මෙය තනි පුද්ගලයෙක් සතු දුබලකමක් නම් එහි බලපෑම අඩුය. නමුත් සමාජයක් ලෙස සමාජයේ චින්තනය අතාර්කික නම් ඕනෑම බොරුවකට වහා රැවටෙන සුළු නම් එය බරපතළ කරුණක් වේ. එබැවින් තම තමන්ගේ චින්තනය තුළ තර්කනය රඳවා ගැනීමටත් තර්කනය තුළින්ම යමක් වටහා ගැනීමටත් මිනිසාගේ චින්තනය තුළ සත්‍ය පරාවර්තනය වනසේ කටයුතු කිරීමටත් තනි තනි පුද්ගලයන් සේම සමාජයක්ද සමත් විය යුතුය. මානව වර්ගයාගේ ජයග්‍රහණයට මාවත වැටී ඇත්තේ ඒ මඟ ඔස්සේය.

# තෙල් ටැංකි විකිණීමේ සැබෑ කථාව


ලංකාවේ පිහිටීම සමග ඉතා ඈත අතීතයේ සිටම ලෝකයේ දෙවැනි ගැඹුරුම ස්වාභාවික වරාය වන ත්‍රිකුණාමලය වරායට හිමිවන්නේ ඉතා වැදගත් ස්ථානයකි. පළමු ලෝක යුද්ධයෙන් පසුව බ්‍රිතාන්‍ය පෙරදිග කලාපයේ මූලික සැපයුම් මධ්‍යස්ථානය ලෙස භාවිතා කෙරුණු ත්‍රිකුණාමල වරායේ චීන වරාය ප්‍රදේශයේ අක්කර 670 පමණ භූමියක විහිදී ටැංකි 101කින් යුත් තෙල් ටැංකි සංකීර්ණය ඉදි කරන ලදී. එහි ටැංකියක් ඝන මීටර් 12,500 වන අතර සමස්තයක් ලෙස තෙල් මෙ:ටො: ලක්ෂ 10ක් පමණ ගබඩා කළ හැකිය. එවකට එය මුළු පෙරදිග ප්‍රදේශයටම තෙල් ගබඩාව ලෙස භාවිතා කෙරිණි. දෙවන ලෝක යුද්ධයේදී හා පසුව ඇතිවූ ගුවන් ප්‍රහාරවලින් ටැංකි 02ක් විනාශ වූ අතර දැන් ටැංකි 99ක් පවතී.

මෙහි වැදගත්කම කොපමණද යත් 1948 නිදහස සමග ඉංග්‍රීසින් විසින් මෙම ටැංකි පද්ධතිය ලංකාවට නොපැවරූ අතර 1964දී තෙල් සංස්ථාව විසින් බ්‍රිතාන්‍ය නාවික හමුදාවට රන් පවුම් 250,000ක් ගෙවා ශ්‍රී ලංකාවට පවරා ගෙන ඇත. නමුත් මෙහි භූමියේ අයිතිය තවමත් තෙල් සංස්ථාවට පවරා නොමැති අතර එය ශ්‍රී ලංකා රජය සතුව පවතී.

හැටේ දශකයේ කලාපීය තෙල් ඉල්ලුම පිළිබඳ තිබූ ගැටලු හා භූමියේ අයිතිය නිසි ලෙස තෙල් සංස්ථාවට නොපැවරීම ආදී හේතු මත නිසි භාවිතයට ගැනීමක් සිදු නොවූ නමුදු 70 දශකයේ අග වන තෙක් මෙම ටැංකි සංකීර්ණය මගින් දුම්රියෙන් පවා රටේ විවිධ ප්‍රදේශවලට තෙල් ප්‍රවාහනය කරන ලදී. 1977 බලයට පත් එ.ජා.ප. රජය පුද්ගලීකරණය හා රාජ්‍ය දේපොළ විකුණා මුදල් සෙවීමේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම නිසා මේ ටැංකි භාවිතය පිළිබඳ කිසිදු අවධානයක් යොමු නොකරන ලදී. 80 දශකයේ අග මෙම ටැංකි සංකීර්ණය ඇමරිකාවට බදු දීමට ජේ. ආර්. ජයවර්ධන උත්සහ කරන ලදී. මේ උත්සහයට දැඩිව කලබල වූ ඉන්දියාව මෙයට දැඩි විරෝධය පළ කළේ ඔවුන්ගේ ආරක්ෂාවට ඇති වන බලපෑම ඍජුවම ප්‍රකාශ කරමිනි.

1982 ලංකාව අවට මුහුදේ ඛනිජතෙල් සම්පත පවතින බව නිශ්චිතව සොයා ගැනීම සමග ඒවා පාලනය කිරීමත් අනෙකුත් දේශපාලන අරමුණු ඇතිවත් ත්‍රස්තවාදී සංවිධාන නිරායුධ කරන බවට බොරු පොරොන්දු දෙමිනුත් ත්‍රිකුණාමල තෙල් ටැංකි ඉන්දියාව සමග හවුලේ භාවිත කළ යුතු බවට කොන්දේසි දමමිනුත් 1987 ඉන්දු-ලංකා සාම ගිවිසුම අත්සන් කිරීමට ඉන්දියාව විසින් බල කරන ලදී.

80 අගභාගයේ සිටම ත්‍රස්තවාදී ගැටලුව නිසා මෙම ටැංකි සංකීර්ණයෙන් රටට නිසි



ප්‍රයෝජනයන් ගැනීමට නොහැකි විය. 2002 වසරේ මෙය සිංගප්පූරු සමාගමක් තෙල් ගබඩා කිරීමට සැලසුම් කොට තිබිය දී, නැවත බලයට පත් එ.ජ.ප. රජය 2003 පෙබරවාරි 07 දින වසර 35 ක් සඳහා මෙම ටැංකි ලංකා-ඉන්දියන් ඔයිල් සමාගමට (LIOC- මෙය ලංකාවේ ලියාපදිංචි සමාගමක් වන අතර මව් සමාගම ලංකා ඉන්දියන් ඔයිල් කොපරේෂන්ය.) බදු දීමට තාවකාලික ලියවිල්ලක් අත්සන් කළේය. එම ලියවිල්ලේ 1.2 ඡේදයට අනුව එදින සිට මාස 06 ක් ඇතුලත ලංකා රජය හා LIOCය විධිමත් බදු ගිවිසුමකට එළඹිය යුතුය. නමුත් මෙතෙක් එම නීතිමය බදු ගිවිසුමට එළඹී නොමැත. එනම් LIOC සමාගම 2003 අගෝස්තු 07 දින සිට චීන වරාය තෙල් ටැංකි සංකීර්ණය පරිහරණය කරන්නේ නීති විරෝධිවය.

උක්ත නීතිමය ගිවිසුම අත්සන් නොකළද එම තාවකාලික ලියවිල්ලේ සැඟවූ කුලී ගෙවීම් මේ වනතෙක් සිදු කරයි. එම එකඟතාවය වූයේ එක් ටැංකියක් සඳහා වසරකට ඇ.ඩො. 1000ක් වැනි සොච්චම් මුදලකි. ඒ අනුව ටැංකි 99, ලක්ෂ 99 සහ අනෙකුත් නල, පොම්ප භාවිතය වෙනුවෙන් තවත් 1000ක් ලෙස මුළු මුදල ඇ:ඩො: ලක්ෂයකි.

මෙම ටැංකි සංකීර්ණය ඉහළ කොටසේ ටැංකි 84 ක් හා පහළ කොටසේ ටැංකි 14 ක් ලෙස ත්‍රිකුණාමලේ - මඩකලපු මාර්ගයේ දෙපස පිහිටා ඇත. මින් පහළ කොටසේ ටැංකි 14 න් 8ක් පමණක් මේවන විට LOICය විසින් භාවිතා කරනු ලබයි.

### ගිවිසුමෙන් ජනතාවට සිදුවන පාඩුව

- LOIC සමාගම මෙහි නල පද්ධතිය කපා යකඩවලට විකුණු අතර, විශාල පිත්තල කරාම ගලවා ඉන්දියාවට පටවන ලදී.
- 2007 - 2010 කාලය තුළ මෙම පහසුකම් හරහා උතුරට තෙල් යැවීම වෙනුවෙන් LOICය තෙල් සංස්ථාවෙන් (CPC) ඉල්ලා ඇති මුදල රු. මි. 945කි. මෙම කාලය තුල රජයට ගෙවා ඇති බදු කුලිය ගණනය කළ විට රු. මි. 40 ක් පමණි.
- එනම් මෙය ඔබගේ නිවස රු. 1000කට බද්දට දී රු. 2000 කට එම නිවසේ කාමරයක කුලියට සිටියා හා සමානය.
- 2015 වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, උතුර, නැගෙනහිර හා උතුරු මැද ප්‍රදේශවලට පමණක් චීන වරාය මගින් තෙල් බෙදීම සිදුකරයි නම් CPCයට ප්‍රවාහන ගාස්තු හා මෙහෙයුම් ගාස්තුවලින් ඉතිරි වන මුදල රු. මිලියන 1000ක් පමණ වේ. මීට අමතරව එය පදනම් කරගනිමින් තෙල් බෙදීමේදී ඉතිරිවන නැව් ගාස්තු ප්‍රමාද ගාස්තු ආදිය ගත් කළ රු. මි. 1500ක් පමණ පහසුවෙන් ඉතිරි කළ හැක.
- එනම් LOIC නීති විරෝධීව චීන වරායේ පවත්වාගෙන යාම වෙනුවෙන් අප රටේ ජනතාව තෙල් සංස්ථාව මගින් වැය කරන මුදල වාර්ෂිකව රු. මි 1500 කි.

### තෙල් ටැංකි ලංකාවට අවශ්‍ය ඇයි?

1. කොලොන්නාව හා මුතුරාජවෙල ප්‍රධාන ගබඩා සංකීර්ණ දෙකෙහිම ධාරිතාව මෙ.ටො. ලක්ෂ 04ක් පමණ වන අතර, එය ප්‍රමාණවත් වන්නේ රටේ අවශ්‍යතාවයෙන් සති 02ක පමණ සංචිත පවත්වාගෙන යාමට පමණි. එනම් වැඩිවන තෙල් ඉල්ලුමට සරිලන සංචිත පවත්වාගෙන යාමට තව ටැංකි ඉදිකළ යුතුය. ටැංකියක් ඉදිකිරීමට සාමාන්‍යයෙන් ඇ.ඩො.මි: 03ක් පමණ වැයවේ. අපගේම ටැංකි 99 නිකම්ම තිබිය දී රටේ ජනතා මුදල් මේ සඳහා වැය කළ යුතුද?

2. ලංකාවේ පිහිටීමද සැලකූ විට මෙම ටැංකි විදේශ ජාත්‍යන්තර ගබඩාවක් ලෙස භවිතා කරමින් විදේශ සමාගම්වල තෙල් සමාගම් සඳහා ගබඩා පහසුකම් ලබාදීමෙන් විශාල විදේශ විනිමය රටට උපයාගත හැක. එමෙන්ම එම තෙල් ගෙන ඒමටත් ගෙනයෑමටත් පැමිණෙන නැව් සඳහා ඉන්ධන සැපයීමෙන් හා අනෙකුත් සැපයුම් ලබාදීමෙන් ගණනය කළ නොහැකි අනවරත විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගත හැක.

3. එමෙන්ම මේ මගින් තෙල් බෙදීමෙන් පමණක් වසරක රු. මි. 1500ක ඉතිරියක් තෙල් සංස්ථාවට ලබෙන අතර එම ලාභයෙන් පෙරළා තෙල් මිල

> "එම ලියවිල්ලේ 1.2 ඡේදයට අනුව එදින සිට මාස 06 ක් ඇතුලත ලංකා රජය හා LIOCය විධිමත් බදු ගිවිසුමකට එළඹිය යුතුය. නමුත් මෙතෙක් එම නීතිමය බදු ගිවිසුමට එළඹී නොමැත. එනම් LIOC සමාගම 2003 අගෝස්තු 07 දින සිට චීන වරාය තෙල් ටැංකි සංකීර්ණය පරිහරණය කරන්නේ නීති විරෝධීවය."

අඩු කිරීම තුළින් ජනතාවට හිමිවේ.

★ මෙම ටැංකි සංකීර්ණය දිරා ගිය කැලෑ වැදුණු ප්‍රයෝජනයට ගත නොහැකි ඒවා ලෙස හුවා දක්වා මේවා විකිණීමට රජය උත්සහ කරයි. ඔවුන් ප්‍රකාශ කරන්නේ, මේවා භාවිතයට ගත හැකි ලෙස නවීකරණයට මුදල් නොමැතිකමින් ඉන්දියාව සමග හවුල් ව්‍යාපාරයකට යායුතු බවයි. නමුත් එසේ මුදල් මදි බව ප්‍රකාශ කළ යුත්තේ, ඒ සඳහා යන වියදම ගණනය කිරීමෙන් අනතුරුවය. මෙතෙක් රජය පාර්ශවයෙන් එසේ ගණනය කිරීමක් කර නොමැත. නමුත් 2016 වසරේ ඛනිජතෙල් සංස්ථාව එවැනි තක්සේරුවට අවශ්‍ය ජාත්‍යන්තර සුදුසුකම් සහිත ආයතනයක් මගින් කරන ලද පරීක්ෂණයකට අනුව සකසන ලද වාර්තාවේ සඳහන් වන්නේ මීට ඉහළ ටැංකි අංගනයේ ටැංකි 16ත්, වරායේ සිට නළ එළීම, දුම්රියෙන් තෙල් පුරවන අංගනය හා දුම්රිය මාර්ගය අළුත්වැඩියා කිරීම ආදිය සියල්ලටම වියදම ඇ.ඩො.මි: 10ක් පමණක් බවයි. මෙම මුදල CPC ය සතුව පවතින අතර ඒ සඳහා මුදල් වෙන්කොට මෙය නවීකරණයට කැබිනට් අනුමැතිය පවා ලබා ගන්නා ලදි. මෙම මුදල ඒ හරහා තෙල් බෙදීමෙන් පමණක් වසරකදී වන ඉතිරියෙන් පියවා ගත හැක.

★ මීට අමතරව මේ හරහා නැව් තෙල් වෙළඳාම ඇරඹියි නම් හා මෙය ජාත්‍යන්තර ගබඩාවක් ලෙස විදේශ තෙල් ගබඩා කරයි නම් ඉන් ඇතිවන අධික ලාභයෙන් ඉතිරි ටැංකි ඉතා කෙටිකලයක් තුළ නවිකරණය කොට භාවිතයට ගත හැක.

★ තවද මේ වන විටත් විදේශ තෙල් සමාගම් ඉල්ලා ඇති පරිදි ඔවුන්ගේ තෙල් ගබඩා කරන ගබඩා මධ්‍යස්ථානයක් ලෙස මෙය භාවිතාකොට ඒ සඳහා ලබාගන්නා කුලියෙන් කිසිදු මූල්‍ය ආයෝජනයකින් තොරව ඩොලර් ඉපයිය හැකි අතර එම මුදල්ද සැලකූ විට මෙම ටැංකි 84 (ඉහල ටැංකි සංකීර්ණයේ) නවීකරණය කර ගැනීම ඉතා සරල දෙයකි.

### ටැංකි CPCයට පැවරිය යුත්තේ ඇයි

මෙම ටැංකි සංකීර්ණයෙන් අපේ රටේ ආර්ථිකයට වන බලපෑම ඉන් ජනතාවට ඇතිවන ආර්ථික ලාභය ඉහත දි සාකච්ඡා කරන ලදී. රටේ ආර්ථිකය ගොඩගත හැකි ඉහළතම මර්මස්ථානයන් විදේශ සමාගමකට නතු වුවහොත් මින් ඉදිරියේ දි ලැබෙන ලාභය බදුත් රටෙන් ඈගෙන යනු ඇත.

මෙම ටැංකි දීමට තීන්දු කොට ඇත්තේ ඉන්දියාවටය. ඉන්දියාව වැනි ලෝක බලවතෙකු එමෙන්ම ලංකාවේ දේශපාලනයට වක්‍රව හා ඍජුව මැදිහත්වන්නෙකු මේ සඳහා හවුල්කර ගතහොත් දේශපාලන පෙරළියකදී පවා අපට ඉවත් කිරීමට අවශ්‍ය වූ මොහොතක ඉවත්කිරීම ඉතා අපහසු, ආර්ථිකයෙන් පමණක් නොව ජීවිතවලින් පවා වන්දි පවා ගෙවීමට සිදුවන කරුණක් වනු ඇත.

මෙය ඉන්දියාවට ලබා දුනහොත් මෙම උපායමාර්ගික මර්මස්ථානයේ ආධිපත්‍ය ඉන්දියාවට නතුකර ගැනීම සමග චීනය ඇතුළු අනෙක් ලෝක බලවතුන් තම ආරක්ෂාව හා ආධිපත්‍ය පිළිබඳ කලබල වීමක් සිදුවේ. මේ වන විට හම්බන්තොට වරාය චීනයට දිගුකාලීන පදනම මත බදු දීමට තීරණය කර ඇත්තේ එහි ප්‍රතිඵලයක් ලෙසය. මෙයට හොඳම නිදර්ශනය කොළඹ වරායේ මෑතදී පුළුල් කොට ඉදිකල බටහිර ජැටිය පසුගිය රජය චීනයට දීම නිසා නැගෙනහිර ජැටිය ඉන්දියාවට අනිවාර්යෙන්ම ලබා දෙන ලෙසට කෙරෙන බලකිරීමය.

### හම්බන්තොට තෙල් පහසුකම් චීනයට ගියහොත්

★ පෙර අපරදිග යාකරන ප්‍රධාන නැව් මාර්ගයේ කේන්ද්‍රයේ පිහිටීම ශ්‍රී ලංකාවට නැව් තෙල් වෙළඳාමේ උපරිම විභවය හිමිකොට දී ඇත. ආර්ථික ස්වාභාවික සම්පත් අල්ප ශ්‍රී ලංකාව අනාගයේ ගොඩ ගත හැක්කේ පිහිටීම පදනම්කරගත් වෙළදාම තුළිනි.

★ දැනට නැව්තෙල් වෙළදාමේ පුරෝගාමීන් වන්නේ මැදපෙරදිග සහ අපරදිග සිංගප්පූරුවයි. මැදපෙරදිග සිට සිංගප්පූරුව දක්වා යන නැවක් ඉන්ධන සඳහා අමතරව තෙල් මෙ: ටො: 8000 ක් පමණ දරාගෙන ගමන් කරයි. ලංකාව මගින් නැව් තෙල් සපයයි නම් මින් අඩක් අඩුකොට ඒ සඳහා බහාලුම් ප්‍රවාහනය කළහොත් ඔවුන්ට විශාල ලාභයක් ලබාගත හැක. එනම් මේ කලාපයේ නැව්වලට ඉන්ධන සැපයීම සඳහා වැඩිම විභවයක්

15වැනි පිටුවට

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2017 ජුනි 06

# රට ආපස්සට ගියේ නොමඟ ගිය ආණ්ඩුව නිසයි

පාර්ලිමේන්තු මන්ත්‍රී
## වෛද්‍ය විජිත හේරත් සහෝදරයා

(ජිනීවා යෝජනා පිළිබඳ කල්තැබීමේ විවාදයට එක්වෙමින්)



2015 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා ආණ්ඩුවත්, ඇමෙරිකා එක්සත් ජනපදයත්, තවත් විවිධ රාජ්‍යයන් එකතුවත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලයට ලංකාව පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ යෝජනාවේදී ලංකාවේ ආණ්ඩුව ඉතා පැහැදිලිව යටත්වීම තමන් විසින්ම භාර ගත්තා. ඒ පැත්තෙන් බලපෑම් එන්න කලින් වර්තමාන ආණ්ඩුව, රාජපක්ෂ පාලනය කරපු දේ අංක එකට ඉහළින්ම කරලා තමන්ගේ පැත්තෙන්ම යෝජනා ඉදිරිපත් කරලා අවනත වුණා; කීකරු වුණා. ඒකේ ප්‍රතිඵල තමයි, මේ යෝජනාවේ තිබෙන කරුණු සාකච්ඡා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන්න, ඒකට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් කවුන්සලය කියනතුරු ඉන්න ඕනෑ නැහැ; ඒකට ඔවුන්ගේ බලපෑම් එනතුරු ඉන්න ඕනෑ නැහැ. ඒක රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයක්; අපේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නයක්. දෙමළ වේවා, සිංහල වේවා, මුස්ලිම් වේවා, මේ රටේ පුරවැසියන් විධියට තමන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින් ජීවත්වීමේ නිදහසක් තිබෙන්න ඕනෑ. ඒක තමයි එදා - 1978 - දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගෙනත් නැති කළේ. ඒ පනතෙන් තමයි මේ රටේ සිංහල තරුණයෝ, දෙමළ තරුණයෝ, මුස්ලිම් තරුණයෝ, - ඒ විවිධ ජාතිකත්වයන්ට අයිති තරුණ තරුණියන්ව- අත්අඩංගුවට ගත්තේ. නඩු දමන්නේ නැතිව අවුරුදු එකමාරක්, - මාස දහඅටක් - තිස්සේ අත්අඩංගුවේ තියා ගන්න පුළුවන් බලය ලැබුණේ. පොලීසියකට ගිහිල්ලා ASP කෙනෙක් ඉස්සරහ කටඋත්තරයක් දුන්නාම ඒ තමන්ට විරුද්ධ පාපෝච්චාරණයක් විධියට සලකන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත - ඒ ප්‍රජාතන්ත්‍ර විරෝධී පනත - එදා සම්මත කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව, ජේ.ආර්. ජයවර්ධන මහත්තයලාගේ ආණ්ඩුවයි. කවුද කියන්නේ ඒක තවදුරටත් තියාගන්න ඕනෑ කියලා? ඒක අහෝසි කරන්න, මානව හිමිකම් කවුන්සලයේ නවනීදන් පිල්ලේලා, හුසේන් කුමාරයා කියනතුරු ඉන්න ඕනෑ නැහැ. ඒක මේ රටේ පුරවැසියන්ගේ නිදහස පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා අපි ඒක කළ යුතුයි. ඒක කරන්න මේ බලපෑම් එනතුරු ඉන්න ඕනෑ නැහැ.

> "හැම රටක්ම අපට සහය දුන්නා. රුසියාවත් සහය දුන්නා කියන එක ආඩම්බරකමක්ද? මේ, රුසියාව සහය දෙන්නේ මොකටද? ඒ, අපේ රටේ මානව හිමිකම් ආරක්ෂා කිරීම තවම හරියට සිද්ධ වෙලා නැහැ කියන එකටයි. චීනය සහයෝගය දීලා තිබෙන්නේ මොකටද? අපේ රටේ ජාතික සංහිඳියාව ඇති කරන්න තවමත් අපි සමත් වුණේ නැහැ කියන එකටයි. ඒක ආඩම්බරකමක්ද? ඒක ලැජ්ජාවක්."

අපේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනවා නම්, යුද්ධයෙන් පීඩාවට පත් වුණු අපේ රටේ සියලු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනවා නම් අපට මෙවැනි බලහත්කාරී මැදිහත්වීම්වලට යටත්වෙන්න සිද්ධ වෙන්නේ නැහැ; ඔවුන් ඉදිරියේ අපේ රටේ ස්වෛරීත්වය පාවාදෙන්න සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා අප කළ යුතු වෙන්නේ, මෙවැනි යෝජනා සම්මත කරන්න ඉඩ දෙන එක නොවෙයි. අපි අපේ යුතුකම හා වගකීම් රටේ ජනතාව වෙනුවෙන් ඉටු කිරීමයි කළ යුතු වෙන්නේ. ඒක තමයි ආණ්ඩුවේ ප්‍රධාන වගකීම. ඒ වගකීම හරියට ඉෂ්ට කරනවා නම් මෙවැනි ප්‍රශ්න ඇති වේන්නේ නැහැ.

එදා යුද්ධය ඉවර වෙලා සතියක් යනකොට ජනතා විමුක්ති පෙරමුණ කිව්වේ, "සත්‍ය සෙවීමේ හා සංහිඳියා කොමිසමක් වහාම ස්ථාපිත කරන්න" කියන එකයි. ඒ වාගේම ත්‍රස්තවාදී එල්ටීටීඊ සංවිධානය විසින් සිංහල හා මුස්ලිම් ජනතාවට එරෙහිව කළ ප්‍රහාරයන්, ඒ ම්ලේච්ඡ ඝාතනයන්, ඒ සියලු දේ සලකා බලා දෙපාර්ශ්වයේම ජනතාව සුවපත් කිරීම සඳහා, ඒ සිත් සුවපත් කිරීම සඳහා වූ යන්ත්‍රණය තමයි ලෝකයම පිළිගත් සංහිඳියාවේ ප්‍රධාන මූලධර්මය. 2009 මැයි මාසයේ 26වැනි දා තමයි ඒක ක්‍රියාත්මක කරන්න කියලා අපි කිව්වේ. එතකොට යුද්ධය ඉවර වෙලා හරියටම සතියයි. ඒක තවමත් ක්‍රියාත්මක වුණේ නැහැ. අද වෙනකොට අවුරුදු 08ක් ගතවෙලා තිබෙනවා. ඊට පස්සේ තමයි නවනීදන් පිල්ලේලාට කියන්න සිද්ධ වුණේ. ඊට පස්සේ තමයි බෑන් කී මූන්ලා Truth and Reconciliation Commission එකක් පිහිටුවන්න කියලා බලපෑම් කළේ.

15වැනි පිටුවට

2017 ජුනි 09

# ආපදා කළමනාකරණය කියන්නේ ආපදාවෙන් පස්සෙ බත් පැකට් බෙදන එක නෙමෙයි

පාර්ලිමේන්තු මන්ත්‍රී
## සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා

(බරපතළ ආපදා තත්වය පිළිබඳ කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරමින්)



අපි කල්පනා කරන්න ඕනෑ ප්‍රධාන කාරණාවක් තිබෙනවා. ඒ තමයි ආපදාවක්, හදිසි විපතක් වළක්වා ගන්න අපේ තිබෙන යාන්ත්‍රණය, ක්‍රමවේදය ශක්තිමත්ද කියන එක. රටක් හැටියට ස්වාභාවික විපතකට මුහුණ දෙද්දී මොන තරම් ශක්තිමත්භාවයක්ද, දුර්වලභාවයක්ද අපට තිබෙන්නේ කියන එක පසුගිය හදිසි නායයෑමේදී අපි දැක්කා. විශේෂයෙන්ම හෙට දවසේදීත් මෙවැනි විපතක්, අනතුරක් සිද්ධ වෙන්න බැරිකමක් නැහැ. ස්වාභාවික විපත් කියන්නේ අපට කලින් දැනුම්දීලා එන දේවල් නොවෙයි. ඒ නිසා ස්වාභාවික විපතක් හදිසියේ සිද්ධ වෙන්න පුළුවන්.

ස්වාභාවික විපතකදී අපි ඒකට මුහුණ දෙන ආකාරය අනුව තමයි. ඒ විපතෙන් ජීවිත කොච්චර ප්‍රමාණයක් ආරක්ෂා කර ගන්න පුළුවන්ද බැරිද කියන එක තීරණය වෙන්නේ. අපේ රට වාගේම ස්වාභාවික විපත්වලට ලක් වන රටවල් ලෝකයේ ඕනෑ තරම් තිබෙන බව අපි දන්නවා. ජපානය ස්වාභාවික විපත්වලට ලක් වනවා. චීනය ගත්තාම ස්වාභාවික විපත් නිසා ඒ ජනගහනයට සාපේක්ෂව විශාල ප්‍රමාණයක් මිය යනවා. තවත් බොහෝ රටවල ස්වාභාවික විපත් සිද්ධ වනවා. නමුත් ස්වාභාවික විපත් පිළිබඳව කලින් දැනුවත් කරන්න එම රටවල් හදලා තිබෙන යාන්ත්‍රණයේ, ඒවාට මුහුණ දෙන්න හදලා තිබෙන ක්‍රමවේදයේ ප්‍රබලතාව විසින් ප්‍රධාන වශයෙන්ම ජීවිත ආරක්ෂා වෙනවා.

ස්වාභාවික විපත්වලදී අපට දේපළ නැති වෙන්න පුළුවන්. දේපළවලට හානි වෙන්න පුළුවන්. හැබැයි, අපට පළමු ආරක්ෂා කර ගන්න තිබෙන්නේ ජීවිත. මේ ජුනි මාසයේ 06වැනි දා වන කොට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන්ම ඉදිරිපත් කළ වාර්තා අනුව, මේ හදිසි විපතින් මිය ගිය සංඛ්‍යාව 213යි. අතුරුදහන් වුණු සංඛ්‍යාව 79යි. හැබැයි අපි හොඳාකාරවම දන්නා විධියට, මේ විපත නිසා අතුරු අතුරුදහන් වුණු අය, මේ විපතින් මිය ගිය ගොඩට තමයි එකතු වෙන්නේ. ඒ අනුව බැලුවොත් පෙනී යනවා, මිය ගිය සංඛ්‍යාව 292ක් බව. ඒ අනුව මැරුණ හා අතුරුදහන් වුණු සංඛ්‍යාව 292ක්.

ඒ වගේමයි දේපළ හානිත්. සම්පූර්ණයෙන් හානි වූ නිවාස 2,772ක්ද, අර්ධ හානි නිවාස 18,704ක්ද වශයෙන් හානි වූ මුළු නිවාස සංඛ්‍යාව 24,476ක් හැටියට ගණන් බලලා තිබෙනවා.

ඒ විපතින් ජීවිත විශාල සංඛ්‍යාවක් නැති වුණා. ආපදාවකදී දැනුවත් කිරීමේ ශක්තිමත් යාන්ත්‍රණයක් අපට තිබුණා නම්, ඔවුන් ගලවා ගන්න බැරි වනවාද? ඒක තමයි ප්‍රධාන ප්‍රශ්නය. ස්වාභාවික විපතකදී අපට දේපළ බේරා ගන්න බැරි වෙයි. ඒ බව අපි දන්නවා. නමුත්, නැති වූ එම ජීවිත ගලවා ගන්න අපට තිබුණු වැඩපිළිවෙළ මොකක්ද?

ඇත්තටම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හෝ ආපදා කළමනාකරණ යන්ත්‍රණය හෝ නිසියාකාරව ක්‍රියාත්මක වෙනවාද, ක්‍රියාත්මක වුණාද කියලා සොයන්න වෙන්නේ එතැනදීයි. මොකද, මේ යන්ත්‍රණය තිබෙන්නේ ආපදාවක් වුණාට පසුව පිළියම් යොදන්න නම්, ඒක වෙනම තත්වයක්.

මෙතන තිබෙන ප්‍රධාන ප්‍රශ්නය නම්, ආපදාව සිදු වෙන වෙලාවේදී එම ස්ථාන හඳුනා ගෙන එහි සිටි ජනතාව ඒවායින් ඉවත් කරන්න මොන තරම් දුරට මැදිහත් වුණාද කියන එක. මිලිමීටර් 150ට වැඩි වර්ෂාපතනයක් ඇදහැලෙන කොට, ඒ ඇදහැලෙන වර්ෂාපතනය නිශ්චිත කරගෙන, ඒ ප්‍රදේශ නිශ්චිත කරගෙන එම නාය ගිය ප්‍රදේශවලින් ජනතාව ඉවත් කර ගැනීමට අපට නොහැකිවීම ඇත්තටම රටක් හැටියට කම්පා වෙන්න ඕනෑ කාරණයක් කියලා මම හිතනවා. ඒ වෙනුවෙන් ජාතික ආපදා කළමනාකරණ සේවා මධ්‍යස්ථානයට, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට තිබුණු වැඩපිළිවෙළ මොකක්ද? ඒ වෙනුවෙන් තිබුණ යන්ත්‍රණය මොකක්ද?

> "මේක එක ගඟක විතරක් ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා විශේෂයෙන්ම මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. අනිවාර්යයෙන්ම මෙවැනි ආපදාවක් ඇති වුණාට පස්සේ උත්තර හොයනවාට වඩා දැන්වත් ස්ථිරසාර වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. "

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය තිබෙන්නේ, ආපදා වුණාට පස්සේ බඩු බෙදන්නද, ආපදා වුණාට පස්සේ යමක් පැකට් කරලා, පාර්සල් කරලා මිනිසුන්ට දෙන්නද? එහෙම නැත්නම්, ඊට කලින් ආපදාව පිළිබඳව දැනුවත් කරන්නද? එහි තිබෙන අවදානම පිළිබඳව දැනුවත් කරන්න, ඒවාට අවශ්‍ය සංවේදීතාව ඇති කරවන්න, මිනිසුන්ව ඉවත් කිරීමේ යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන්න, ජීවිත හානි අවම කර ගන්න තිබෙන වැඩපිළිවෙළ මොකක්ද? මෙවැනි ස්වාභාවික විපතක් අපේ රටේ නැවත ඇති නොවෙන තත්වයකට පත් කරන්න ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේත්, එයට අනුබද්ධ ආයතනවලත්, ඒ ආයතනවලට තිබෙන යන්ත්‍රණයේත්, ඒ ආයතනවල සිටින අයගේ, යන්ත්‍ර සූත්‍රවල සහ ඒ තාක්ෂණයේ තිබෙන හැකියාව - capacity එක මොකක්ද? එහෙම නැත්නම්, ස්වාභාවික විපතක් ඇති වෙද්දී එම ජීවිත ආරක්ෂා කරගන්න තිබෙන වැඩපිළිවෙළ මොකක්ද?

අපේ රටේ හම්බන්තොට ඉඳලා පුත්තලම දක්වා තිබෙන ගංගා ප්‍රමාණය ගත්තොත්, මෙවැනි තත්වයක් ඇති වෙද්දී මේ මහා ජල කඳක් මුහුදට බස්සන ගංගා කීයද තිබෙන්නේ? ගංගාවල්, මෝයවල්, ඇළවල් ඔක්කොම ගත්තොත් වැඩිම වුණොත් 15ක් පමණ තිබෙනවා.

එයින් ප්‍රධාන ගංගා තිබෙන්නේ හතයි. මෙන්න මේ ප්‍රධාන ගංගා හත සහ ඇළවල්, ඔයවල් ඔක්කෝම අපි හරියට හඳුනාගෙන, ඒවායේ තිබෙන මෝය කටවලින් ජලය හරියාකාරව බසින්න පුළුවන් විධියට එය සකස් කරන්න යාන්ත්‍රණයක් අපට තිබෙනවාද? හුඟක් වෙලාවට සිදු වන්නේ ගඟ පිටාර ගලලා වතුර බස්ස ගන්න බැරි වුණාම බුල්ඩෝසරයක් ගිහිල්ලා අයින කපන එකයි. මෝය කට කපන්න පටන් ගන්නේම ගඟ පිටාර ගලලා නගරය සමතලා කරලා, ජීවිත හානි කරලා යන කොට. එතැනින් බස්සන්න තිබෙන ජල ධාරිතාව හඳුනාගෙනද බැකෝ එකේ ඩ්‍රයිවර්ට කියන්නේ, "මෙතැනින් කපාපං" කියලා. වෙවැනි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න මහා වියදමක් යනවාද? ගංගා කීයද අපට තිබෙන්නේ? මේක හඳුනා ගෙන, ඒ ප්‍රමාණයට ගැළපෙන වැඩපිළිවෙළක් හදන්න බැරිද?

මේක එක ගඟක විතරක් ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා විශේෂයෙන්ම මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. අනිවාර්යයෙන්ම මෙවැනි ආපදාවක් ඇති වුණාට පස්සේ උත්තර හොයනවාට වඩා දැන්වත් ස්ථිරසාර වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. විශේෂයෙන් මෙවැනි ගංවතුර තත්වයකදී අපේ රටේ ප්‍රධාන ගංගා හතක විතර මෝය කටවල්වලින් මුහුදට ජලය බස්සන්න තිබෙන වැඩපිළිවෙල සාර්ථක වුණා නම් අද මේ ගංවතුරින් වෙන්න තිබුණු හානියෙන් විශාල පංගුවක් අවම කර ගන්න තිබුණා.

## කවුළුව හැර තබමි

# විනාශකර මරා දැමිය නොහැකි වූ මිනිසා...



'1971 නැගිටීමෙන් පසුව ජීවිතාන්තය දක්වා සිරගත කරන ලද විජේවීර සහෝදරයා 1977 නොවැම්බර් 02 දා නිදහස් කිරීමට පාලකයින්ට සිදුවිය. 1987 ඔහුගේ මරණය දක්වා දක්වා ලාංකේය දේශපාලනය හැඩගැස්වීමෙහිලා ඔහුගේ පෞරුෂය හා නායකත්වය බෙහෙවින් උපකාරී විය. විජේවීරගේ කැපවීමත් චතුර කථිකත්වයත් ඊට බලපා තිබිණි.' අපරාධ යුක්ති කොමිෂන් සභාවේ සාමාජිකව සිටි විනිශ්චයකාරවරුන්ට පවා පසුකාලීනව මෙසේ විජේවීර සහෝදරයා හඳුන්වා දීමට සිදුවීම තුළින් සතුරා අපේක්ෂා කළ ලෙසින් ඔහු 'මරා දැමීමට' නොහැකි වූ බව පැහැදිලිය.

පුද්ගලයා යනු එක් අතකින් පවත්නා සමාජයේම සංකීර්ණතාවයන්ගේ ප්‍රකාශනයකි. සමහරු සරල ජීවන රටාවකට හිමිකම් පා ස්වභාවිකව මියයති. ඔවුන්ගේ සමාජ කවය ඉතා පටුය. එනිසාම ඔවුන් තේරුම් ගැනීමට ඉතා පහසුය. නමුත් සමාජ භාවිතයේ කවය ඉතා විශාල වූ පුද්ගලයෙකු පිළිබඳව විග්‍රහ කිරීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවේ.

විජේවීර සහෝදරයා ගැන උඩින් පල්ලෙන් අතගා කතාකළ අය බොහෝය; අදටද කතා කරති. ඔහු තරම් කතාබහට ලක්වූ සහ හතුරාගේ කෝපයට පාත්‍ර වූ දේශපාලන නායකයෙකු ලංකාවේ නොමැත. එහෙත් ඒ කිසිවෙකුත් ඔහුව ඉක්ම නොගියා පමණක් නොව ඔහු අසලටවත් ළඟාවීමට සමත් නොවූවෝය.

සමාජයක් මිනිසාගේ යහපත පිණිස මුළුමනින්ම වෙනස් කිරීම වැනි අති දුෂ්කර කටයුත්තකට අතගැසීමට හැක්කේ අතිමානුෂීය නොසැලෙන පුද්ගලයෙකුට පමණි. ඔහු හිස නැමුවේ යුක්තියට, සත්‍යයට, සමාජ සාධාරණත්වයට හා විප්ලවයට පමණි. ඔහු තමාට එල්ලවූ අවලාද හා අපවාද මකුළු දැල් සේ පිසදා හැරියේය. අවශ්‍ය දෙයට පමණක් පිළිතුරු දුන්නේය. ඔහු උත්තර සෙව්වේ සතුරාගේ අවලාදවලට නොව සමාජ අසාධාරණයටය. ඔහුගේ ඉදිරි දැක්ම කොතරම් නිවැරදිද යන්න සනාථ කිරීමට මීට වසර 45කට පෙර පරිසර විනාශය නිසා රටට සිදුවිය හැකි විනාශය පිළිබඳ විද්‍යාත්මක විග්‍රහයම ප්‍රමාණවත්ය. 1943 ජූලි 14 මාතර කෝට්ටේගොඩදී උපත ලත් විජේවීර සහෝදරයා, සතුරා විසින් 1989 නොවැම්බර් 13වැනි දින කෘෘර ලෙස මරා දැමුවද ඔහුගේ නාමය මකා දැමීමට අදටද ඔවුන් අසමත්ය. ඔහුගේ නාමය ලංකේය දුක්විඳින ජනතාවගේ හදවත්හි සදාකල්ම දිදුලනු ඇත.

# මිනිස්කම බැබල වූ රතු තරුව

පසුගියදා මහ වැසි වැස ගංවතුර ගලා කඳු නාය ගොස් මිනිස් ජීවිත සහ දේපළ විනාශ වී ගියේය. ඊට පෙර ද කුණු කඳු කඩා වැටී මිනිස්සු මිය ගියෝය. මීට පෙරද මෙවන් විපත් අත්විඳීමට සිදුවිය. මේ විනාශයන් සහ විපත් මේ රටේ පාර්ශව දෙකකට නම් රජ මඟුල් සේය. එක පාර්ශවයක් රටේ මජර දේශපාලන දේශපාලකයන්ය. අනෙක සමහර මාධ්‍යයයි. මිනිසෙකුගේ විපත පවා ඔවුන්ට සැපතකි. ලකුණු දමාගැනීමට කදිම අවස්ථාවකි, ලාභ ගරා ගැනීමට නියම මොහොතකි. පසුගියදා ඇති වූ ස්වභාවික ව්‍යවසනයේදී රටේ ජනයාට එය හොඳින්ම එය දැක ගැනීමට හැකිවිය. එහෙත් යථා තත්වය දුටුවේ කීයෙන් කී දෙනෙකුදැයි අපි නොදනිමු. මේ නරුම ධනවාදය මේ හැම විපතකින්ම හොඳ වෙළඳපොළක් නිර්මාණය කර ගනියි. ඒ ප්‍රාග්ධන හිමියන්ට හා දේශපාළුවන්ටය. ඔවුන් සිදුවූ මේ විපතේදී මිනිසුන්ගේ උදව්වට ආවේ අවංකවමදැයි ප්‍රශ්නයක් මතුවෙයි.

මේ සියලු මජර භාවිතයන් මැද මේ විපතේදී ඇත්ත මානුෂීය මෙහෙයුමකට උර දුන් මිනිස්සු කණ්ඩායමක්ද සිටියහ. ඔවුන් කිසිවකු පය නොගැසූ අවදානම් තැන්වලට ගොස් විපතට පත් ජනයාට පිහිට වූහ. ඔවුන් ඒ වෙනුවෙන් 'ලකුණු' නොපැතුවෝය. සාඩින් ටින් එකකදී බැරල් එකක කීර්ති-ප්‍රශංසා අපේක්ෂා නොකළෝය. ඒ සඳහා හොඳම සාක්ෂියක්ද ඇත. එනම් තම පවුලේ සාමාජිකයින් 10 දෙනකු මිය ගොස් සිටියෙදීම එක සහෝදරයකු මෙම සහන සේවා කටයුතුවලට අන් අය සේම මැදිහත් වීමය. විපතට පත් සියලු ජනයා තම සහෝදරයන් සේ සලකා ජ.වි.පෙ. රතු තරුව සහන සේවා බලකාය කළ අවංක මෙහෙයුමට එයම හොඳම සාක්ෂියකි. ඔවුන්ගේ අනුන්ගේ ආධාර තමන්ගේ මෙන් නොබෙදූහ. ඔවුන්ගේ මානුෂීය භාවිතය නිසාම සමහර දේශපාළුවන්ට බොරුවට හෝ වතුරට බැස මිනිසුන් කරේ තියාගෙන යාමට සිදුවිය. ඇත්ත මිනිස් දේශපාලනය සහ ව්‍යාජ රංගනීය දේශපාලනය වෙන් කොට හඳුනා ගැනීමට මෙම ව්‍යසනය වුවද ප්‍රමාණවත්ය.




# සමහරක් කියන කථා



1977 න් පසු ලාංකේය සමාජ සැකැස්මේ යම් ව්‍යුහාත්මක විපර්යාසයක් ඇතිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ උඩු ව්‍යුහයේ සංචලනය සඳහා අවකාශ පුළුල් විය. තව විධියකට කියනව නම් ඕනෑම පාදඩයෙකුට යමක් කමක් හොයාගත් පසු (ඕනෑම මාර්ගයකින්) සමාජ ධූරාවලියේ ඉහළට යාම සඳහා වූ අභිලාශයන් සහිත අයට ඒ සඳහා වූ මාවත් බහුල වීමයි. කුමාරි ජයවර්ධනගේ භාෂාවෙන් කියනවනම් 'නිකමුන්ට සමහරුන්' බවට පත්වීම සඳහා අවකාශ පුළුල් වීමයි. දේශපාලනය, කලාව, ජනමාධ්‍ය, අධ්‍යාපනය, ක්‍රීඩාව වැනි ප්‍රමුඛ මිනිස් ක්‍රියාකාරී ක්ෂේත්‍රයක් තුළම පසුගිය දශක කිහිපය තුළ සිදු වී ඇති මූලික විපරීතයන් හඳුනා ගැනීම සඳහා මෙම 'නිකමුන් සමහරුන්' බවට පත්වීමේ ක්‍රියාවලිය ව්‍යාප්ත වීම තේරුම් ගැනීම ඉතා වැදගත්ය.

රේස්කරුවන්, මත්ද්‍රව්‍ය ජාවාරමුන්, පාතාලයින්, රට කරවන දේශපාලනයේ ඉහළ තනතුරුවලට පත්වන්නේත් බලය හොබවන්නේත් මෙම මෙම විපරීතයේ ප්‍රතිඵලයක් ලෙසය. පසුගියදා සෞඛ්‍ය ඇමති රාජිත කීවේ රටක් වේගයෙන් සංවර්ධනය වන විට ඩෙංගු රෝගය ව්‍යාප්තියද වැඩිවන බවය. ක්‍රීඩා ඇමති දයාසිරි කීවේ, අධ්‍යාපනය සහ මහා මාර්ග එකම ඇමතියෙකුට දීම ගැලපෙන බවයි. මන්ද ළමයි පාසැල්වලට සහ විශ්වවිද්‍යාලවලට යන්නේ මහා මාර්ග දිගේ ගොස් නිසා බවයි. විදේශ ඇමතිට ලොතරැයි මණ්ඩලය පැවරීම ගැනද කීවේ එවැනි අදහසකි. මෙය සැහැල්ලුවෙන් ගත යුතු කරුණක් නොවේ. ඉන් ගම්‍ය වන්නේ, මේ රටේ ධනපති දේශපාලකයින් මේ රටේ පුරවැසියන් කොතරම් හැල්ලුවට, බාල්දුවට පත්කර තිබෙනවාද යන්නය. අපට ප්‍රශ්නය වන්නේ, තමන් ඡන්දය දී පත්කළේ මෙවැනි මුග්ධයින් රැලක් නොවේදැයි යන ප්‍රශ්නය පුරවැසියන්ගේ මනස තුළ මතු නොවීම ගැනය.

නිමල් සිරිපාල ඇමතිවරයා වරෙක කියා තිබුණේ, තමන් බලයට ආවේ අත ලෙවකෑමට නොවේයැයි කියාය. ධනපති දේශපාළුවන් මෙතෙක් කල් කළේ ලෙව කෑමටවත් දෙයක් රටේ ජනයාට ඉතුරු නොකිරීමය. මුළු රටම තම බූදලයක් සේ සලකා බුදින මෙම දේශපාලන අම්බරුවෝ එසේ කරන ගමන් මේ ජනතාවටද කෝචොක් දමති. මොවුන් මෙතරම් හෙළිදරව් වී සිටියෙදීත් ජනතාව තව කෙතෙක් දුරට නිහඬව සිටිනු ඇත්ද?

## දැන් උදාවී තිබෙන්නේ...

03 පිටුවෙන්

පාලකයන්ටත් නැගිට්ටවන්න බැරිවුණා. දැනටත් මුදල් අමාත්‍යාංශය කියන්නේ, ලංකාවේ දුප්පත්ම දිස්ත්‍රික්කය මොනරාගල කියලා. අවුරුදු 200 පිරෙන මොහොතේ වත්මන් පාලකයන් විසින් අපේ රට ආපසු සුද්දන්ට පාවාදෙන්න හදනවා.

අක්කර 62,500ක් දෙන්නේ සිංගප්පූරුවේ ගැසල් වෙන්චර්ස් කොම්පැනියටයි. සිංගප්පූරු බිමෙන් 60%ක් මේ දෙන්නේ. ගැසල් වෙන්චර්ස් කොම්පැනියට මේ දෙන්න යන්නේ ඔවුන්ගේ රටෙන් භාගයකට වැඩි බිමක්. ඒ ප්‍රශ්නය තියෙනවා. වසර 200ක් පිරෙන මොහොතේ අපේ රටේ වත්මන් පාලකයෝ ඒ අධිරාජ්‍යවාදීන්ට සාරවත් වටිනා ඉඩම් අක්කර 62,500ක් දීලා 1815 මාර්තු 02දා කරපු පවාදීම හා සමාන පාවාදීමක් කරන්න යනවා. අපි අවුරුදු 200ක් ගිහින් ඔළුව උස්සන්න පටන්ගත්තා විතරයි. ආයෙත් ඔළුවට ගහනවා. අපේ වටිනා සාරවත් ඉඩම් මේ උක්වගාවට දෙන්න යන්නේ. අපි මේ බිම් අඟලක්වත් බහුජාතික සමාගම්වලට දෙන්න කැමැති නැහැ. මොකද ඔය අධිරාජ්‍යවාදීන්ට එරෙහිව කරපු සටනේදී ඒ මිනිසුන්ගේ ලේ මේ බිමේ හැළුණා. ඒ බිමේ තමයි සරුසාර ගහකොළ, වනාන්තර තියෙන්නේ. ජල උල්පත් තියෙන්නේ. ඒව නැවතත් සුද්දන්ට දෙන්න නැවත කිසිසේත් අප සූදානම් නැහැ.

සමාගම් ඇවිත් මේ මහා වනාන්තර ගිලගන්න හදනවිට අපි හැදුවා දැවැන්ත ජනතා සංවිධානයක්. අම්පාර, බදුල්ල, මොනරාගල දිස්ත්‍රික් තුන එකතුකරලා. ඒ කියන්නේ ඌව වෙල්ලස්ස, බින්තැන්න, බදුල්ල කියන පළාත්. ඌව වෙල්ලස්ස ජන අයිතීන් සුරැකීමේ පෙරමුණ කියලා. පූජ්‍ය පක්ෂය රටේ උගතුන් බුද්ධිමතුන් ගොවි ජනතාව පෙරටු කරගත් දැවැන්ත ජනතා පෙරමුණක් අපි මේ වෙනකොට ගොඩනගා තිබෙනවා. ඌව වෙල්ලස්සේ යම් යම් උපක්‍රමික ලක්ෂණත් අපි අපේ සටනට ඇතුළත් කරගත්තා. ඊට එරෙහි සටන මහා ජන අරගලයක් බවට පත්කර මේ කොල්ලය අනිවාර්යෙන්ම පරද්දනවා.

***නියමුවා:- මධ්‍ය කඳුකරය තුළ පාරිසරික විනාශකාරී සලකුණු දැනටත් සටහන් කර ඇති උමා ඔය සංවර්ධන ව්‍යාපාරය ඉදිරියේදී විශාලතම පාරිසරික ව්‍යසනයක් හා මානව ඛේදවාචකයක් ඇති කරවීමේ බලවත් අනතුරක් තිබෙනවා. මේ තත්වයට එරෙහි ජන අරගලය ගැන කීවොත්.***

***සමන්ත විද්‍යාරත්න සහෝදරයා:-*** මම අද මාධ්‍යයට සාකච්ඡා කරන මොහොත වෙනවිට මධ්‍ය කඳුකරයේ නැගෙනහිර බෑවුම නුවරඑළියේ සිට මහියංගනය සහ වැල්ලවාය දක්වා වූ බෑවුම ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, වැලිමඩ, හාලිඇල, බණ්ඩාරවෙල, ඇල්ල, වැල්ලවාය කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මේ වනවිට නිවාස පුපුරා ගිය ප්‍රමාණය 7037යි. ඒ අතර පන්සල්, පල්ලි, පාසල්, ව්‍යාපාරික ස්ථාන තියෙනවා. මේ ප්‍රදේශයේ සිඳීගිය ළිං, දිය කඳුරු, ඔයවල්, පොකුණු, කුඩා වැව් ප්‍රමාණය 3112යි. අපි කියන මේ වෙච්ච විනාශය පොඩියි. වෙන්න තියෙන විනාශය වැඩියි.

දැන් මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුමේ ඒකාබද්ධතාවය බිඳදාලා ඉවරයි. විශාල පිපුරුම් ඇතිවෙලා තියෙන්නේ. ඒ පිපුරුම් නිසා තමයි උඩ නිවාස පුපුරන්නේ. ඒ පිපුරුම් එන්නේ අඩි 1000ක් පමණ යට ඉඳලා. මේ පොළව කැබලිවෙලා. මේ අතරෙ 2014 මීරියබැද්ද නාය ගියාට පස්සේ අපි විද්‍යාත්මක පරීක්ෂණයක් තියන්න කිව්වාට පස්සෙ ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මේ සම්බන්ධයෙන් පර්යේෂණයක් කර රජයට වාර්තාවක් දී තිබෙනවා. බදුල්ල දිස්ත්‍රිකයේ සමස්ත භූමි ප්‍රමාණය 66.9%ක් නායයෑමේ අවදානමක තිබෙන්නේ. නායයාම් අවදානමෙන් තියෙන භූමියක මෙවැනි මහා පරිමාණ ව්‍යාපෘතියක් කිරීමෙන් ඒ නාය යාම දෙගුණවෙනවා. ඉදිරියේදී මහ වැසි සමග හෝ පුංචි හෝ භූමිකම්පාවක සිදුවිය හැකි අනතුරේ දිග පළල අපට කියන්න බැහැ.

දැන් වෙනකොට මේ උමගේ කාන්දුව තප්පර එකට ලීටර් 2562ක්. උමගේ දිය කාන්දුව පරීක්ෂා කරන්න කොළඹින් ආපු නිලධාරීන් ඇතුලට ගියේ බෝට්ටුවකින්. මෙච්චර දවසක් උමග ඇතුලට ගියේ කෝච්චියෙන්. විදින මැෂින් එකේ ගල් කුඩු කැබැලි ප්‍රවාහනය කළේ කොච්චියෙන්. දැන් කෝච්චියට යන්න බැරි තත්වයකට උමග ඇතුලේ වතුර එනවා. උමගෙ ඇතුලෙ බෝට්ටු ධාවනය පටන් ගත්තා. මධ්‍යම කඳුකරයේ මතුපිට කබොල්ල සෑහෙන්න විනාශකරල තියෙන්නේ. පරිසරය විනාශවෙලා. හැබැයි මතුපිට කබොල්ල විනාශ වුණාට භූ අභ්‍යන්තරය විනාශ කරලා තිබුණේ නැහැ. මධ්‍යම කඳුකරයේ භූ අභ්‍යන්තරය තමා දැන් මේ විනාශ වෙන්නේ. හදවතේ අභ්‍යන්තර රුධිර නාලවල ලේ වහනය පිටට සිදුවුණොත් මරණය ඒකාන්තයි කියල කියන්නේ. අභ්‍යන්තරයේ තිබෙන වටිනා ජලය තප්පරයට ලීටර් 2562ක් යනවිට ගණන් හදලා බලන්න, දවසකට කොපමණ වතුර ප්‍රමාණයක් කාන්දුවෙනවද කියා. කෝටි දෙකට දවසකට අවශ්‍ය ජලයට වඩා වැඩි ප්‍රමාණයක් මෙතනින් පිටවී යනවා. මේක බරපතළ ව්‍යවසනයක්. මේවායේ අනාගත ප්‍රතිවිපාකයේ දිග පළල කියන්න අපි සමත් නැහැ. ඒ සඳහා පුළුල් විද්‍යාත්මක පරීක්ෂණයක් කළ යුතුය බව අපි විශ්වාස කරනවා.

මේ සම්බන්ධයෙන් අපි සටන පටන් ගත්තේ අද ඊයේ නොවේ. උමා ඔය ව්‍යාපෘතියට මුල්ගල තිබ්බේ 2007 අප්‍රේල් මාසේ 29වෙනිදා. ඒ කියන්නේ මහින්දගේ පාලන යුගයේ. මේ ව්‍යාපෘතිය බාරව සිටියේ චමල් රාජපක්ෂ ඇමතිවරයා. අපි මේ ව්‍යාපෘතිය ගැන අධ්‍යයනය කරලා මෙය කරන්න එපා කියලා පාර්ලිමේන්තුවේදී හඬනැගුවා. පළාත් සභාවල අපේ මන්ත්‍රීවරු කිව්වා. මාධ්‍යයට කිව්වා. ඒ දේශපාලඥයෝ මෙයට ඇහුම්කන් දුන්නේ නැහැ. ඊට පස්සේ අපි තීන්දුවක් ගත්තා මේ මහා විනාශය වළක්වන්න, විනාශය පූර්වයෙන් දැකපු කණ්ඩායමක් හැටියට, පාලකයෝ ඇහුම්කන් දෙන්නේ නැති නම් ජනතාවත් සමග එකතුවී මෙය පරද්දන්න ඕන කියලා. අපි ඒ සඳහා හැදුවා උමා ඔය සුරකීමේ ජනතා

15 වැනි පිටුවට

## රට ආපස්සට ගියේ...

13 පිටුවෙන්



2017 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ 34වැනි මානව හිමිකම් සැසිවාරයේදී ඉදිරිපත් කළ යෝජනාවටත් එවැනි දෙයක් බලහත්කාරයෙන් ඇතුළු කරලා තිබෙනවා. ඇයි මේ? අපි රටක් විධියට අපේ රටේ ජනතාවගේ ජාතික සංහිඳියාව ගැන හිතලා, සත්‍ය සෙවීමේ හා සංහිඳියා කොමිසම ස්ථාපිත කළා නම්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඒකාබද්ධ ප්‍රකාශනයට එහෙම දෙයක් ඇතුළු වෙන්නේ නැහැ. ඒක නිසා අපි කළ යුතු වෙන්නේ ඒකයි. ඔවුන් කියන තෙක් ඉන්න එක නොවෙයි කරන්න ඕනෑ. ඔවුන් කියන තෙක් සිටියාම තමයි මේ මැදිහත්වීම සිද්ධ වෙන්නේ. අද සිදුවන සිදුවීම් දිහා බැලුවාම මේ කාරණය ඉතා පැහැදිලිව ඔප්පු වෙනවා.

අපේ රටේ අභ්‍යන්තර ප්‍රශ්නයකට ඇඟිලි ගහන්න මානව හිමිකම් කවුන්සලයට ඉඩ දුන්නු එකයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ ජාත්‍යන්තර විනිසුරුවරුන් ලංකාවට ඇවිල්ලා ලංකාවේ අධිකරණ පද්ධතියට, අධිකරණ ක්‍රියාවලියට හවුල් වෙන්න ඔවුන් එකඟ වුණා කියන්නේ ආඩම්බරයට කාරණාවක් නොවෙයි. ඒ ගැන ලජ්ජා වෙන්න ඕනෑ. හරි විධියට ගත්තොත් ඒක ලජ්ජා වෙන්න ඕනෑ කාරණාවක්. කොහොමද අපි ආඩම්බර වෙන්නේ? අපේ රටේ හරියාකාරව නීතිය ක්‍රියාත්මක කරන්න බැහැ. අධිකරණයේ ස්වාධීනත්වය නැහැ; සියලු ජනතාවට යුක්තිය ඉටු වෙන්නේ නැහැ. ඒ නිසා තමයි ඔවුන්ට මැදිහත් වෙන්න වුණේ කියන එක ලෝකය තුළ මානව හිමිකම් කවුන්සලයේ පිළිගත්තාම ඒක ආඩම්බරකමක් වෙන්නේ කොහොමද? හැම රටක්ම අපට සහය දුන්නා. රුසියාවත් සහය දුන්නා කියන එක ආඩම්බරකමක්ද? මේ, රුසියාව සහය දෙන්නේ මොකටද? ඒ, අපේ රටේ මානව හිමිකම් ආරක්ෂා කිරීම තවම හරියට සිද්ධ වෙලා නැහැ කියන එකටයි. චීනය සහයෝගය දීලා තිබෙන්නේ මොකටද? අපේ රටේ ජාතික සංහිඳියාව ඇති කරන්න තවමත් අපි සමත් වුණේ නැහැ කියන එකටයි. ඒක ආඩම්බරකමක්ද? ඒක ලැජ්ජාවක්. ඒ නිසා මේ අද ඇති වෙලා තිබෙන තත්ත්වය ආඩම්බරයට, උද්දාමයට කාරණාවක් නොවෙයි. මේ යෝජනාව එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ඡන්ද විමසීමකින් තොරව සියලු දෙනාගේ කැමැත්තෙන් සම්මත වුණා කියන්නේ, ඇත්තම ගත්තොත්, ලැජ්ජාවට කාරණාවක්, ඒකෙන් ඔප්පු වෙන්නේ මොකක්ද? මේ රටේ සියලු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න, විශේෂයෙන් මානව හිමිකම් ආරක්ෂා කරන්න රටක් විධියට අපි අසමත් වුණා කියන එකයි. මේ යෝජනාව මගින් අපි ඔප්පු කරලා තිබෙන්නේ ඒකයි.

ඇත්තටම අපි දැන් කළ යුතු වෙන්නේ, මෙවැනි යෝජනා තවත් ඉස්සරහට ගෙන යන්න අනුබල දීම, අනුග්‍රහය දීම නොවෙයි. මේවා එන එක වළක්වා ගන්න එකයි. ඒකට අදාළ ක්‍රියාත්මක වීමක් අවශ්‍යයි. එදා ජිනීවාවල ඉන්න එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත රවිනාත් ආරියසිංහ මහත්මා ඇතුළු ඒ නිලධාරි මණ්ඩලය ලංකාවේ ආණ්ඩුවට වාචිකව කිව්වා, මෙවැනි ඒකාබද්ධ ප්‍රකාශයකට අත්සන් කරන්න එපා කියලා. වාචිකව කියු දේ ඇහුවේ නැති නිසා ඔවුන් ලිඛිතව එව්වා, "මෙවැනි ඒකාබද්ධ යෝජනාවක් ඉදිරිපත් කරන්න එපා, ඒක බරපතළ වරද්දා ගැනීමක්, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අපේ රටේ නීතිය, අපේ රටේ අභ්‍යන්තර කරුණු පිළිබඳව ඔවුන්ට මැදිහත් වෙන්න ඉඩ ප්‍රස්ථාවක් ලබා දීමක් මේකෙන් සිද්ධ වෙන්නේ" කියලා. එහෙම කියද්දී තමයි වර්තමාන ආණ්ඩුව තකහනියේ ගිහිල්ලා මේකට එකඟ වුණේ. ඒ නිසා අවුරුදු ගණනාවකට පස්සේ අපි ආපසු පරණ හිටපු තැන. එක තැන කැරකෙනවා.

මංගල සමරවීර ඇමතිතුමා කිව්වා "අපි අහලා තිබෙනවා, එදා අපේ රට 'සිලෝන්' වශයෙන් තිබුණු ඒ අවධිය ගැන. එදා හොඳ පොලීසියක් තිබුණා. රාජ්‍ය සේවයක් තිබුණා. ඉතා ප්‍රෞඪ රටක් විධියට ලෝකය තුළ අප පිළිගත්තා. කොරියාවටත් වඩා ඉදිරියෙන් හිටියේ. එහෙම රටක් තමයි අද මේ තත්වයට පත් වුණේ" කියලා. ඇයි එහෙම පත් වුණේ? එහෙම පත් වුණේ නොමඟ ගිය දරුවන් නිසා නොවෙයි. නොමඟ ගිය ආණ්ඩු නිසයි. කොරියාවට වඩා උසස් තැනක ලංකාව තියන්න පුළුවන් ඉතිහාසයක් අපට තිබුණා. හොඳ රාජ්‍ය සේවයක්, හොඳ සම්පත් තිබෙන රටක් අපට තිබුණා. එවැනි රටක් දියුණුවේ හිණි පෙත්තට ගෙන යන්න පුළුවන්කම තිබියදී ආපස්සට ගියේ, නොමඟ ගිය ආණ්ඩු නිසයි. එදාත් නොමඟ ගියේ ආණ්ඩුයි. අදත් නොමඟ යන්නේ ආණ්ඩුයි. එහෙම නැතිව මේ රටේ ජනතාව නොවෙයි. ජනතාව හරි මඟ යන්න කැමතියි. හැබැයි, ආණ්ඩු තමයි ජනතාව නොමග යවන්නේ. ඒ නිසා නොමග ගිය දරුවන් විසින් මේ රටේ ඉතිහාසය වෙනස් කරලා නැහැ. මේ රටේ ඉතිහාසය වැරදි පැත්තට ගෙනැල්ලා තිබෙන්නේ නොමඟ ගිය ආණ්ඩු විසිනුයි. ඒවාට වග කියන්න ඕනෑ නොමඟ ගිය ආණ්ඩුයි. අදත් තත්වය එහෙමයි.

## තෙල් ටැංකි විකිණීමේ...

12 පිටුවෙන්



සහිත ස්ථානය ශ්‍රී ලංකාවයි. විශාල නැව් රට ආසන්නයෙන්ම යන ස්ථානය හම්බන්තොටයි.

★ දිනට ලංකාව ඔස්සේ යන නැව්වලින් (400 ක් පමණ) දශම එකකට ඉන්ධන සැපයුවහොත් දිනකට තෙල් නැවක් අවම වශයෙන් අලෙවි කල හැක.

★ චීනයේ ඉදිරි අවු 100ක සැලස්මේ ප්‍රති නැව්ගත කිරීමේ කේන්ද්‍රය ශ්‍රී ලංකාව ලෙස හඳුනාගෙන ඇත. එය හම්බන්තොට මූලික වේ.

★ දිනට ඉදිකිරීමට සියලු සැලසුම් නිමකෙට ඇති තායිලන්තයේ කැණීමට නියමිත ඇල මාර්ගය හරහා පැමිණෙන නැව් කි. මී. 1600 ක් පමණ දුර අඩුකරගෙන කෙලින්ම ශ්‍රී ලංකාවට පැමිණෙනු ඇත. එවිට එම නැව් සඳහා ප්‍රධාන සැපයුම් මධ්‍යස්ථානය හම්බන්තොට වනු ඇත.

★ මෙය චීනයට දුනහොත් අද සිංගප්පූරුව ලබන සියලුම ලාභ හා අවස්ථා ශ්‍රී ලංකාවට අහිමිවනු ඇති අතර, සියලු ලාභයන් චීනයට යනු ඇත.

★ හම්බන්තොට තෙල් පහසුකම් ඉදිකිරීමට ගිය සමස්ත වියදම (ණය) ඉතා කෙටි කාලයකින් පියවිය හැකි නිසා CPCය ණය ගෙවාගෙන යාමේ පදනම මත එය CPC යට පවරන ලෙස ඉල්ලා ඇත. නමුත් එය නොසකලා චීනයට දීමට සැලසුම් කරයි.

★ හම්බන්තොට වරාය චීනයට බදු දුනහොත් අනිවාර්යෙන්ම ත්‍රිකුණාමලය ඉන්දියාවට දිමට සිදුවන්නේ බලතුලනය පවත්වාගෙන යාමටයි. මේ සඳහා එකම විසඳුම මෙම භූමිය කිසිවෙකුටත් නොදී පවත්වාගෙන යාමය.

මෙම අරමුණු ඉටුකල හැකි ක්‍රම සැබැවින්ම ඇතත්, එවා විද්‍යාත්මකව සංඛ්‍යාලේඛන සහිතව ඔප්පුකොට තිබියදීත් දේශපාලන බලලෝභය වෙනුවෙනුත් බංකොලොත් ධනේශ්වර ආර්ථික උපායමාර්ගය හේතුවෙනුත් විකිණීමේ හා පැවරීමේ ක්‍රියාවලිය දිගටම සිදුකරයි. එහෙයින් රටට සහ ජනතාවට ප්‍රතිලාභ ලැබීමටනම් උපායමාර්ගිකව සිදුකළ යුත්තේ, මෙම සම්පත් කෙසේ හෝ ශ්‍රී ලංකාව විසින්ම භාවිත කිරීමේ ක්‍රමවේදයකට මාරුවීමය.

## දැන් උදාවී තිබෙන්නේ...

14 පිටුවෙන්

ව්‍යාපාරය කියල සංවිධානයක්. දේශපාලන ජාතිබේද තිබුණේ නැහැ. උගත් බුද්ධිමත් වෛද්‍යවරු, නීතිඥවරු ගම්වැසියො එකතුකර අපි සංවිධානයක් හැදුවා. එමගින් තීරණය කළා ජනතාව දැනුවත් කර මේ මහා විනාශය නතරකරන්න, මහා ජන පෙරමුණක් හදන්න.

නමුත් රාජපක්ෂ යුගයේ මිනිස්සු බයවුණා අපි සමග එකතු වෙන්න. අපි සමහර ගම්වලට ගියාම ජනතාව අපට කථාකරන්න වත් ඉඩ දුන්නේ නැහැ. අපේ රටේ තියෙනවා ක්‍රමයක්, මිනිසුන්ගේ ඔළුවටම වදිනකන්, බොක්කටම වදිනකන් සමහර ප්‍රශ්න තේරුම් ගන්නේ නැහැ. ඊට පස්සේ අපි කල්පනා කළා පාලකයන්ට කිවුවහම අහන්නේ නැතිනම්, ජනතාවට කිව්වහම ජනතාව තේරුම් ගන්නේත් නැත්නම්, එකතුවෙන්නේත් නැති නම් මේක නීතිය හමුවට ගෙනිහින් පරාජය කළ යුතුය කියලා. අපි සංවිධානය එකතුවෙලා කොළඹ නීතිඥ සමාගමක් හමුවෙලා අපේ පක්ෂයේත් සහයෝගය ඉල්ලාගෙන මේ නඩුව කියන්න සූදානම් වුණා. පිටු හයසීය ගනණක් වෙනකම් නඩුව සූදානම් වුණා. ඒ සඳහා මහාචාර්ය ජිනදාස කටුපොත, සජීව චාමිකර, අතුල ප්‍රියන්ත, තිලක් කාරියවසම් ආදීන් උදව් වුණා. මේ සම්බන්ධයෙන් අපි රු. 60,000ක් යන තෙක් මුදල් බැන්දා. නමුත් ඊළඟ වියදම් අපිට කරගෙන යන්න පුළුවන් කමක් තිබුණේ නැහැ. ලක්ෂ ගණනක මුදලක් අවශ්‍ය බව කීවා. අපි නඩුව කරගෙන යන්න බැරිකමත් සමග අසරණ තත්වයට පත්වුණා.

අපි නැවතත් ජනතාවට කරුණු කියාගෙන යන අතරේ, මේ ගොල්ලන් දිගටම ඉදිකිරීම් කටයුතු කරගෙන ගියා. එවිටයි මහා විනාශයන් වෙන්න පටන් ගත්තේ. 2014 දෙසැම්බර් 26දා මහා දිය කාන්දුවක් මකුල්ඇල්ල ගමට යටින් මතුවෙන්නට ගත්තා. ඒ අනුව ගෙවල් පුපුරණ, ළිං හිදෙන එක ආරම්භ වුණා. ඊට පස්සේ අර සංවිධානය තිබියදී අලුත් සංවිධානයක් හැදුවා. ඒ, 'උමා ඔය බහු විනාශකාරී ව්‍යාපෘතියට එරෙහි ජනතා පෙරමුණ' නමින්. ඒ පෙරමුණ පුළුල් ලෙස, මහා සංඝරත්නයත් පෙරටු කරගෙන මේ විනාශය නතර කරන මෙන් ඉල්ලා මහා උද්ඝෝෂණ, ජනතා රැලි පැවැත්වුවා. ඌවේ මහා සඟ සමුළුවක් තිබ්බා. සංඝ ආඥාවක් නිකුත් කළා. සංඝයා වහන්සේ දාහක් පමණ එකතුවෙලා, මහා නායක හිමි නමක් මුවින් ඒ සංඝ ආඥාව නිකුත් කළා. නමුත් මේ පාලකයෝ එය සැලකුවේත් නැහැ.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති වුණාට පස්සෙ 2015 මාර්තු 20දා ඔහුගෙන් සාකච්ඡාවක් බොහොම අමාරුවෙන් ඉල්ලාගෙන ආචාර්ය, මහාචාර්යවරු, පරිසරවේදීන් ඇතුළුව පූජ්‍ය පක්ෂය සමග බස් පිටින් සෙනග ගියා පරිසර අමාත්‍යාංශයේ සාකච්ඡා කරන්න. ජනාධිපතිතුමා ඇවිත් කිව්වා විනාඩි 05යි දෙන්නේ, එක්කෙනෙක් පමණක් කථා කරන්න. එහෙමයි වර්තමාන පාලකයෝ සැලකුවේ. අපි කෑකෝ ගහලා විනාඩි 15ක් අරගෙන අපේ ප්‍රශ්නෙ කිවුවා. නමුත් එයත් ඒක හරියට තේරුම් ගත්තේ නැහැ. අන්තිමේදී එයා කිව්වා මේ සම්බන්ධයෙන් සොයාබලන්න කැබිනට් අනු කමිටුවක් පත්කරනවා. ඒ කමිටුවෙන් එන තීන්දුව අනුව ක්‍රියාකරනවා කිවුවා. කැබිනට් අනුකමිටුවට රවි කරුණානායක, පාඨලී චම්පික, හරෙන් ප්‍රනාන්දු, නිමල් සිරිපාල, ඩිලාන් පෙරේරා, රංජිත් මද්දුමබණ්ඩාර යන ඇතුලත් වුණා. කැබිනට් අනුකමිටුවට අපි ලිපි යැව්වා. දුරකථන ඇමතුම් දුන්නා. හරේන් ප්‍රනාන්දුට කිවා මේ ප්‍රදේශයට ඇවිත් තීන්දුවක් ගන්න කියලා. ඔය කණ්ඩායම හමුවෙන්න අපේ සංවිධානයට ඉඩක් දෙන්න කියලා. අඩුගානෙ අපිට කරුණු දක්වන්න දුන්නෙත් නැහැ. අපේ භූමියට ඇවිත් බැලුවෙත් නැහැ. පාර්ලිමේන්තු කාමරයකට රැස්වෙලා පැය දෙක තුනක් සාකච්ඡා කරලා ඒකමතිකව තීන්දුකරලා තිබුණා මේ ව්‍යාපෘතිය එසේම කරගෙන යා යුතුයි කියලා.

ඒ අනුව ඒ ව්‍යාපෘතිය මෛත්‍රීපාල සිරිසේනත් එහෙමම කරගෙන යනවා. මහින්දගේ යුගයේ මේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කර තිබුනේ 16%යයි. දැන් 80% ක් දක්වා ඉදිකිරීම් කරලා තියෙනවා. වැඩිපුරම කළේ යහපාලන ආණ්ඩුව. ඒනිසා මහින්දත්, මෛත්‍රීපාල සිරිසේනත්, යහපාලන ආණ්ඩුවත් දෙකම එකතුවෙලා මධ්‍ය කඳුකරේ, 'රටේ හදවත' වැනසුව කියා අපට කියන්න තියෙන්නේ. මේක ජනතාවට විශාල පහරක් වැදිච්ච මොහොතක්. ගෙයක් නැහැ. බොන්න වතුර නැහැ. වඳින්න පූජනීය ස්ථානයක් නැහැ. පාසල පුපුරලා. ව්‍යාපාරික ස්ථාන විනාශවෙලා. කුඩා තේ වතු අඩාලවෙලා. කඳු පුපුරලා. ඒනිසා මිනිස්සු ඉන්නේ කොයිවෙලාවේ කුමක් වේද කියලා බයෙන්. පාලකයන්ට කියලා අඩුම තරමෙ අපට සාකච්ඡාවක් දුන්නේ නැහැ. පසුගිය දිනවල සාකච්ඡාවක් ඉල්ලලා ජනධිපතිට ලියුම් යැව්වා. කිසිම ප්‍රතිචාරයක් නැහැ. මේ පසුගිය 15දාත් ලියුමක් යැවුවා, මේක අවදානම් කලාපයක් කියා නම්කර ඉදිරි කටයුතු කරන්න කියලා. කිසිදු උත්තරයක් නැහැ. ඒ නිසා අපිට මේ බිමේ වැළලෙන්න බැහැ. මේ රට මේ විදියට වැනසෙන්න ඉඩදෙන්න බැහැ. ඒ නිසා අපි තීන්දුවක් ගත්තා ඇහෙන්නේ නැති, පේන්නේ නැති පාලකයන්ට ඇහෙන්න, පෙනෙන්න ජනතා බලයක් ගොඩනැගිය යුතුය කියා. 28දාට බණ්ඩාරවෙල නගරයට දසදහස් ගණනක ජනතාවක් රැස්කරලා අපි ජනතාවත් එක්ක එන්නේ නැගිටින්න බලාගෙන නොවේ. ඉතා පැහැදිලි උත්තරයක් බලාගෙන.



***නියමුවා:- තැන තැන ගොඩනැගෙන පරිසර ගැටලු රාශියකින් ජනතාව පීඩා විඳිමින් සිටිනවා. බොහෝ තැනක ඊට එරෙහිව ජනතා සටන්ද පැන නැගී තිබෙනවා. එහෙත් සැබැවින්ම ඒවාට වෙන් වෙන්ව ජයග්‍රහණ අවශ්‍ය වගේම පරිසර විනාශකාරී සමාජ ආර්ථික දේශපාලන ක්‍රමයට එරෙහි පොදු අරගලයක අවශ්‍යතාව ජ.වි.පෙ. විග්‍රහ කරගන්නෙ කොහොමද?***

***සමන්ත සහෝදරයා:-*** ඔව්, දැන් ගත්තාම රටේම තියෙන්නේ එක ප්‍රශ්නයක් නොවේ. එක කණ්ඩායමක් සටන් කරනවා අපේ වගාවන් විනාශයි. වන්දි දෙන්න කියලා. තව කණ්ඩායමක් සටන් කරනවා, අපිට අලි ගහලා මරනවා අපට අලි වැටක් දෙන්න කියලා. තවත් පැත්තකින් සටන් කරනවා අපේ කිරි ටික විකුණග න්න විදිහක් නැහැ, අපට කිරිවලට හොඳ සහතික මිලක් දෙන්න, කිරි ටික විකුණගන්න විදිහක් හදන්න කියලා. උඩරට එළවළු ගොවියා සටන් කරනවා බීජ මිල වැඩියි. අපේ අස්වැන්න විකුණගන්න ක්‍රමයක් හදන්න කියා. ශිෂ්‍යයෝ සටන් කරනවා අපේ නිදහස් අධ්‍යාපනය වළලනවා. නිදහස් අධ්‍යාපනය සුරකිමු කියා. වෘත්තිකයින් සටන් කරනවා අපේ වෘත්තීන්ට සාධාරණ වැටුපක් නැහැ. අපේ විශ්‍රම වැටුප් නැහැ. ඒනිසා ඒවාට සාධාරණය ඉටුකරන්න කියලා. ව්‍යාපාරිකයෝ පාරට බහිනවා අපට මේ බදු බර උහුලන්න බැහැ. අපිට නිෂ්පාදනය කරන්න බැහැ. ඒ නිසා මේ සඳහා උත්තරයක් දෙන්න කියලා.

මේ රටේ පරිසර සටන්වලට අමතරව විශාල ප්‍රශ්න ටිකක් තියෙනවා. අනික් පැත්තෙන් වකුගඩු ප්‍රශ්නයෙන් ජනයා දහස් ගණනින් මැරෙනවා. එසේම ඩෙංගු උවදුර ඇවිල්ලා. ඒ සම්බන්ධයෙන් විශාල කථා බහක් තියෙනවා. මේ අනුව රටම තියෙන්නේ අවුල් ජාලයක, ප්‍රශ්න ගොන්නකයි. මේ ප්‍රශ්නවලට එක එක ප්‍රශ්නෙට හුදකලා විසඳුම් නැහැ. මේ තියෙන්නේ පාලනයේ තිබුණ දුබලකමේ හා ක්‍රමයේ තියෙන ප්‍රශ්නයි. මේ ක්‍රමයේ තියෙන වැරැද්ද. මේ ක්‍රමය වෙනස් කරන්න පුළුවන් පාලන ක්‍රමයක් අවශ්‍ය යුගයක් තියෙන්නේ. ඒනිසා සියලු සටන් ඒකාබද්ධ විය යුතුයි කියලා අපි කියනවා.

පරිසරවේදීන් කියල නමක් හදාගෙන, පරිසර සංවිධාන කියා බෝඩ් ලෑල්ලක් ගහගෙන අපි මෙච්චර කල් පරිසරය සුරක්ෂිත කරන්න කියා සටන් කළා. ඒකෙ අපි වැරැද්දක් දකින්නේ නැහැ. ඒ හඬ, මතය හොඳයි. නමුත් ආපස්සට හැරිලා බලන්න අපේ සාර්ථකත්වය මොකක්ද කියා. පරිසරය රැකගත්තද? නැහැ. අපි හඬ නගද්දී අපි සංවිධාන තියාගෙන සිටිද්දී අපි බලපෑම් කරද්දී අපි සටන් කළාට වඩා වේගයෙන් පරිසරය විනාශවෙලා තියෙනවා. ඒ නිසා වෙන් වෙන්ව සිටිය යුගය නොවේ. දැන් ඒකාබද්ධ විය යුතු යුගය උදාවෙලා තියෙන්නේ.

අපි ආදරය කරන්නේ පරිසරයට නම් අපිට අවශ්‍යවන්නේ මානවයාගෙ දියුණුව නම් මේ රට සුරක්ෂිත කරන්න ඕන නම් දේශප්‍රෙමය තියෙන්නේ රට දෙකඩකර කෑල්ලක් එක් ජතිකත්වයකට දීම නොවේ. දේශප්‍රේමය තියෙන්න ඕන මධ්‍යම කඳුකරය විනාශවෙන කොට. ඒක දේශයට වෙන විනාශයක් කියල දකින්න ඕනෑ. මහ වනාන්තර මුඩුකරන කොට, විනාශකරන කොට ඒක මේ දේශයට කරන මහා විනාශයක් කියලා දකින්න ඕනෑ. ඒ නිසා සියලු කණ්ඩායම් ප්‍රගතිශීලි මිනිස්සු, සැබෑ දේශප්‍රේමීන්, සැබෑ පරිසරවේදීන්, නිදහස් අධ්‍යාපනයට කැමති මිනිස්සු, රාජ්‍ය සේවය සුරක්ෂිත කරන්න ඕන කියන මිනිස්සු මේ සියලු දෙනා ඒකාබද්ධ විය යුතුයි.

මේ පවතින පාලනය විසින් හදපු මේ ලෙඩ රෝග හමාරකරන්න නම් මේ පවතින ක්‍රමය වෙනස් කළ යුතුයි. අප ඒකාබද්ධ වීමේ දැවැන්ත අවශ්‍යතාවයක් තියෙන මොහොතක් කියලා බුද්ධිමතුන් උගතුන් තේරුම් ගත යුතුව තිබෙනවා. ඒ තේරුම් ගත්ත එකේ තියෙන හොඳම ප්‍රතිඵලය තියෙන්නේ එයින් ක්‍රියාත්මක වීමෙන් පමණයි. සියලු බුද්ධිමතුන් උගතුන් ක්‍රියාත්මක වීමක් රට ඉල්ලා සිටින මොහොතක්. මධ්‍යම කඳුකරය ඇතුළු රටම ඉල්ලන ඒ ඉල්ලීමට කාරුණිකව කන්දෙන්න කියලා අපි කාරුණිකව ඉල්ලනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com





ජාතික ශිෂ්‍ය වීර දිනය සමරා...



මීතොටමුල්ල ජනතාවට සාධාරණය ඉල්ලා...



උමාඔය ව්‍යසනයේ පීඩිතයින් වෙනුවෙන්...



වංචනිකයින්ට, දූෂිතයින්ට දඬුවම් දීමට බලකර...




විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් අමතමින්...



විදුලි සේවක අයිතීන් වෙනුවෙන්...

# ජනතා අයිතීන් රැකිය හැකි ආණ්ඩුවක් ගොඩනැගිය යුතුයි

## ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



මානව සමාජය උපයාගත් අත්දැකීම් අධ්‍යාපනය වන බව ප්‍රකාශ කළ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා අධ්‍යාපනය විකිණීම කළ වැරැද්දක් බවත් එය කොන්දේසි විරහිතව ඉදිරි පරම්පරාවට උරුම කර දිය යුතුව ඇති බවත් එය ජනතාවගේ අයිතියක් බවත් එම අයිතීන් රැකිය හැකි ජනතාවගේ ආණ්ඩුවක් ගොඩනැගිය යුතුව ඇති බවත් අවධාරණය කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව පැවසුවේ, පසුගිය ජූනි 20වැනි දින ජාතික ශිෂ්‍ය වීර දිනය නිමිත්තෙන් සමාජවාදී ශිෂ්‍ය සංගමය විසින් කොළඹ මහජන පුස්තකාලයේදී සංවිධානය කළ සමරු උළෙලේ ප්‍රධාන දේශනය පැවැත්වමිනි.

"අධ්‍යාපන අයිතිය උදුරාගන්න එනවානම් සටනක් තියෙනවා ඒක රකින්න. සයිටම් අරගලය ඒ සටනේ කොටසක්. සියලු බලවේග එකතු කරලා සයිටම් හකුළා ගන්න තුරු දැවැන්ත සටනක් දියත් කළ යුතුයි. ඒ වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ කළ යුතු දේ කරනවා. එය ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් එක්ක සටනක් නිසා ඍජුවම ආණ්ඩුවට එරෙහි සටනක් වෙනවා. ඒ නිසා ශිෂ්‍ය ව්‍යාපාරය ශක්තිමත් කරලා අරගලය මෙහෙයවන්න ඕනෑ. කවුරුත් එකතු වෙලා වැඩ කරන්න ඕනෑ.

ශිෂ්‍ය ව්‍යාපාරය ඉදිරිපිට අභියෝගයක් තිබෙනවා. ඉතිහාසයේ විරුවන් රැක දුන් අධ්‍යාපනයේ අයිතිය ඉදිරි පරම්පරාවට උරුම කර දෙන්න අපිට වගකීමක් තියෙනවා. එතනින් එහාට ගිහින් ධනවාදය පරාජය කරලා සමාජවාදය දිනාගන්න ඕනෑ. අපි කොයිතරම් දේවල් ජයග්‍රහණය කළත් මේ ආණ්ඩු නැවත අපෙන් ඒක උදුර ගන්නවා, ධනවාදයට නිදහස් අධ්‍යාපනය දෙන්න බැරි නිසා. නිදහස් අධ්‍යාපනය රකින්න පුළුවන් ජනතාවගේ ආණ්ඩුවක් ගොඩනගන්න ඕනෑ. ඒ නිසා අප හමුවේ ලොකුම සටන තිබෙන්නේ, ධනවාදය පරාජයට පත්කිරීම සඳහායි." ටිල්වින් සිල්වා සහෝදරයා වැඩිදුරටත් පැවසීය.

# අනාගත ආපදා අනතුරු වැළැක්වීම සඳහා කල්තබා සැලසුම් කළ යුතුයි

## ජ.වි.පෙ. ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා

ගංවතුර හා නායයාමේ ආපදා තත්වය හමුවේ ජනතාව බරපතළ පීඩාවකට මුහුණ දී තිබෙන බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා අනාවැකි කීම මගින් අනතුරු වළක්වා ගැනීමට හා විනාශය අවම කරගැනීමට තිබූ අවස්ථාව ආණ්ඩුවේ සැලසුමක් නොමැතිකම නිසා අහිමි වී ගිය බව පෙන්වා දුන්නේය.

බිමල් සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 04වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජනමාධ්‍ය හමුවකදීය. ඔහු වැඩිදුරටත් මෙසේද පැවසීය.

"මෙම නායයෑම් සහ ගංවතුරට ප්‍රධාන හේතුව මධ්‍යම කඳුකරය විනාශ කිරීමයි. 1815න් පස්සේ මෙම විනාශයන් සිදුවීම ආරම්භ වුණා. ඉන්පසු රටේ පාලකයින් විසින්ද කළේ මෙම කඳුකරය විනාශ කිරීමයි. සමාගම් විසින් තමන්ගේ ලාභ වැඩිකර ගැනීමට පරිසරය විනාශ කළා. ඒ විතරක් නෙවෙයි, ආණ්ඩුව, සමාගම් යන පාරේම ගිහින් ජනතාවත් පරිසර හානියට දායක වුණා. නමුත් ජනතාවගෙන් වන හානියට වඩා ආණ්ඩු මගින් සමාගම්වලින් සිදුවන හානිය වැඩියි. ඒ නිසා තමයි අද ආපදා තත්වයක් ඇතිවෙලා තිබෙන්නේ. ප්‍රධාන ගංගාවලින් වතුර බහින්නේ නැති තත්වයක් ඇතිවෙලා. දෙගොඩතලා යන වතුර බැස යාමට නොහැකිව හිරවෙලා තිබෙන්නේ පාලකයින්ගේ අවිධිමත් සංවර්ධනය නිසයි. ඒ කෙසේ වෙතත් ආපදා වළක්වා ගැනීම සඳහා කළ හැකි කටයුතු ප්‍රමාණයක් රජයකට තිබෙනවා. ඒ සඳහා තමයි ආපදා කළමනාකරණ අමාත්‍යාංශයක් තිබෙන්නේ.

අනාවැකි කීම මගින් අනතුරු වළක්වා ගන්න ජනතාව එම ප්‍රදේශවලින් ඉවත් කරන්න පුළුවන්. දැන් කාලගුණ අනාවැකි කීමත් ශාස්ත්‍ර කාරයින්ගේ මට්ටමට වැටිලා. තාක්‍ෂණය භාවිතා කරලා අනාවැකි පළකරන්න පුළුවන්. නමුත් අපේ රට විසින් මිලදී ගත් ඩොප්ලර් රේඩාර් උපකරණය සම්බන්ධයෙන් වංචාවක් සිදුවෙලා. එම උපකරණය තිබුණා නම් ඒ ඒ ප්‍රදේශවලට ලැබෙන වැසි ප්‍රමාණය පවා නිශ්චිතව කියන්න පුළුවන්කම තිබුණා. නමුත් අපේ රටේ කාලගුණ අනාවැකි කීම බරපතළ දුර්වල මට්ටමක තිබෙන්නේ. මේ වනවිටත් දෙසීයකට වැඩි ප්‍රමාණයක් මිය ගිහින් බිලියන ගණනක දේපොළ විනාශ වී තිබෙනවා. ඒ නිසා අනාවැකි කීමේ දුර්වලතාවය පිළිබඳ ආණ්ඩුව වගකිව යුතුව තිබෙනවා.



හදිසි සහන සේවා තත්වයෙන් ඉදිරියට ගොස් සැලසුම් සහගතව අනාගතයේ ආපදා වැළැක්වීම සඳහා සැලසුම් සකස්කළ යුතුව තිබෙනවා. ඒ වගේම මෙවැනි ආපදා වැළැක්වීම සඳහා ජාතික ආයතනයක් හදලා එයට අවශ්‍ය බලත ලබා දිය යුතුයි. ජපානය, ඇමරිකාව, ඉතාලිය, ඉන්දියාව වැනි රටවල දිගු කාලීන වැඩපිළිවෙළවල් මගින් මෙම ආපදා විනාශයන් අවම කරගෙන තිබෙනවා."

# පරණ කොල්ල කල්ලිය වෙනුවට අලුත් කොල්ල කල්ලියක් රට පාලනය කරනවා

## ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



වත්මන් ආණ්ඩුවට වසර දෙකක් ගතවී ඇති නමුදු ඔවුන් බලයට පත්වීමට පෙර ජනතාවට වුණු පොරොන්දු කිසිවක් ඉටු කිරීමට අසමත් වී ඇති බවට චෝදනා කළ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා වත්මන් ආණ්ඩුවද පරණ ආණ්ඩුව ගිය මඟෙහිම යමින් ඇති බවත් රටේ සම්පත් කොල්ලකමින්ද වංචා දූෂණ මගින් ආර්ථිකය කොල්ලකමින්ද සිටින බවත් පෙන්වා දුන්නේය.


ඔහු මෙසේ පැවසුවේ පසුගිය 20වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. තවදුරටත් අදහස් පළ කළ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද කියා සිටියේය.

"ජනාධිපතිවරයා ලොකු පම්පෝරියක් ගහලා කැබිනට් සංශෝධනයක් කළා. දැන් හැම ඇමතිවරයෙකුටම හම්බ කරගන්න ආයතනයක් දීලා. අමාත්‍යාංශවලට විෂයයන් බෙදා තිබෙන්නේ, කිසිම විද්‍යානුකූල පදනමකටවත් රට හැදීමේ සැලසුමකටවත් නෙවෙයි; ඇමතිවරුන්ට මහජන මුදල් කොල්ලකා ගන්නයි. පහුගිය ආණ්ඩුවේ කොල්ල කල්ලිය වෙනුවට අද තවත් කොල්ල කල්ලියක් රට පාලනය කරනවා. මේ කොල්ල කල්ලියට කොල්ලකන්න මුදල් නැති නිසා අලුත් වැඩකට අත ගහන්න යනවා. මුදල් රාජ්‍ය ඇමති එරාන් කියනවා, අලුත් බදු ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන්න පනතක් ගේනවා කියලා. ඔහු කියන්නේ දැන් තිබෙන බදු ප්‍රතිපත්තිය සංකීර්ණයි කියලා. මෙහෙම කියලා ජනතාවට ගහන බදු අඩු කරන්න නෙවෙයි මේ පනත් ගේන්නේ. තව තවත් ජනතාවට ගහන බදු වැඩි කරන්නයි ආණ්ඩුව උත්සාහ කරන්නේ.

මේ ආණ්ඩුව තුළ වංචාව-දූෂණය ඉහවහා ගිහිල්ලා. මහ බැංකු වංචාවට එරෙහිව ගත්ත පියවර මොකක්ද? මහ බැංකු හොරකම මුලින්ම හෙළි කළේ අපි. ඉන් පස්සේ ඒ පිළිබඳව කෝප් වාර්තාවක් ඉදිරිපත් කළා. කෝප් වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන්නේ නැතිව ජනාධිපති කොමිසමක් දැම්මා. අවුරුදු දෙකක් ගත වෙලත් ගත්ත නීතිමය පියවරක් නැහැ.

මේ වෙනකොට ජාතිවාදයත් නැවත ඉස්මතු වෙමින් තිබෙනවා. යුද්ධය ඉවර කරලා සමගිය හදන්න ඕන වෙලාවක නැවත ජාතිවාදී ගැටුම් හදන්න උත්සාහ කරනවා. වර්තමාන ආණ්ඩුව ජාතිවාදය ඉස්මතු කරන්න ඉඩ දීලා නිහඬව බලාගෙන ඉන්නවා. ඒ නිසා ජාතිවාදී කල්ලිවලට ඉඩ හැදිලා තිබෙනවා. විල්පත්තුවේ කැලෑ කැපීම කරන්නේ ජාතිවාදී පදනමෙන්. එය වැළැක්වීමට මැදිහත් වෙන්නෙත් ජාතිවාදී පදනමෙන්. ආණ්ඩුව ජාතිවාදය ඇතිකිරීමට තිබෙන ඉඩ අහෝසි කළ යුතුව තිබෙනවා.

මේ ආණ්ඩුව කිසිදු ප්‍රශ්නයක් ගැන සංවේදී නැහැ. ආණ්ඩුවට සංවේදී නැතිවීමේ රෝගය වැළඳිලා. ඒ නිසාම මේ ආණ්ඩුවට එරෙහිව දැවැන්ත ජනතා බලයක් ගොඩනැගිය යුතුව තිබෙනවා."




බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.